PRAY PREPARE PREACH

# යෝබ් පොත දේශනා කිරීම

## යෝබ් පොත සඳහා දේශනා සටහන්

...ලොව වටා සිටින
බයිබල් ගුරුවරුන්
උදෙසා ලියා ඇත

# යෝබ් පොත

## දේශනා කිරීම

### යෝබ් පොත සඳහා දේශනා සටහන්

# පටුන

අ. ඉක්මන් උපකාරය: යෝබ් පොතෙන් දේශනාවක් සූදානම් කරන අයුරු . 4

ආ. යෝබ් පොත දේශනා කිරීම භාවිත කළයුතු අන්දම . . . . . . . . . . . 5

ඇ. යෝබ් පොත පිළිබඳව . . . . . . . . . . . . . . . . . . . . . . . . . 7

ඈ. යෝබ් පොත අධ්‍යයනය සහ දේශනා කිරීම . . . . . . . . . . . . . . 9

ඉ. යෝබ් පොතෙන් පාඩම් . . . . . . . . . . . . . . . . . . . . . . . . 46

ඊ. දුක්විඳීමට හේතු . . . . . . . . . . . . . . . . . . . . . . . . . . 47

**Preaching Job**

© Phil Crowter/ The Good Book Company 2010

© 2018 සිංහල පරිවර්තනය කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසිනි
Sinhala Translation © 2018 by Colombo Theological Seminary

සියලු අයිතිවාසිකම් කතුවරයා සතුය. කතුවරයාගේ හෝ ප්‍රකාශකයාගේ අවසරය නොලබා මෙම කෘතියේ කිසිදු කොටසක් කුමන ආකාරයකින් හෝ කුමන ක්‍රමයකින්, ඉලෙක්ට්‍රෝනිකව, යන්ත්‍රිකව, ජායා පිටපත් මගින් සම්ප්‍රේෂණය සහ භාවිතය පිණිස කිසියම් පද්ධතියක සටහන් කිරීම, ගබඩා කිරීම සපුරා තහනම්ය.

ISBN 978-955-3640-04-8

Colombo Theological Seminary, 189, Dutugemunu Street, Kohuwela
Sri Lanka
http://www.cts.lk

# පළමුව මෙය කියවන්න!

මෙම පොත් මාලාවේ (යාච්ඤා කරන්න, සූදානම් කරන්න, දේශනා කරන්න) තවත් පොතක් ඔබ වෙත පිරිනැමීමට හැකිවීම මහත් ප්‍රීතියකි. දෙවියන්වහන්සේගේ වචනය දේශනා කිරීමට මෙය උපකාරීවනු ඇතැයි යන්න අපගේ යාච්ඤාවයි. අපට අවශ්‍ය වන්නේ සෑමතැනකම සිටින සෙනඟ දෙවියන්වහන්සේගේ වචනය පැහැදිලිව අසනු දැකීමය. එවිට සෙනඟ යේසුස්වහන්සේ වෙතට හැරෙනු ඇත. ක්‍රිස්තු භක්තිකයන් වඩාත් යේසුස්වහන්සේ ආකාරයට වර්ධනය වනු ඇත. සියලු ප්‍රශංසාව දෙවියන්වහන්සේට හිමිවනු ඇත.

අපි ඔබට බොහෝ උපකාර ලබා දෙන්නෙමු. එහෙත් ඔබ ද වෙහෙසවී ක්‍රියා කළයුතුය! කරුණාකාර, ඔබ කියවන දෙය හුදෙක් පිටපත් නොකරන්න!

යා.සූ.දේ හි තේරුම යාච්ඤා කරන්න! සූදානම් කරන්න! දේශනා කරන්න! යන්නය. දේශනා කිරීමට පෙර බොහෝ දේ කළ යුතුව ඇත.

**යාච්ඤා කරන්න.** දෙවියන්වහන්සේ නොමැති නම් ලෝකයේ කරන හොඳම දේශනාවෙන් පවා ප්‍රයෝජනයක් නැත. ඔබ දෙවියන්වහන්සේගේ සත්‍යය කථා කරනු පිණිස යාච්ඤා කරන්න. මිනිසුන්ගේ හදවත්වලට දෙවියන්වහන්සේ කථා කරනු පිණිස යාච්ඤා කරන්න. ඔබ සූදානම් වන අතර ඔබ ගැන යාච්ඤා කරන්න. දේව වචනය ඔබට ජීවමාන වීම සඳහා යාච්ඤා කරන්න.

**සූදානම් කරන්න.** බයිබලිය දේශනාවක් සූදානම් කරන්නට ඔබට පැය කිහිපයක් අවශ්‍ය වේ. බයිබල් කොටස තේරුම් ගැනීම පිණිස මහන්සි වී කටයුතු කරන්න. අප ඔබට දී ඇති උපකාර ගැන කල්පනා කරන්න. ඔබගේ අසන්නන්ට උපකාර වනුයේ කුමන කොටස්ද? වඩා හොඳින් ඔබට එය විස්තර කළ හැකිවන්නේ කෙසේද? අප ඔබට ලබාදෙන්නේ වචන කිහිපයක් පමණි. සියලු දෙනාටම තේරුම්ගනු පිණිස ඔබ ඊට වඩා පැවසිය යුතුය.

**දේශනා කරන්න.** දැන් ඔබට දේශනා කළ හැකිය. අප දෙවියන්වහන්සේගේ වචන උගන්වන බව දන්නා විට එය අපට මහත් ප්‍රීතියක් ගෙන එන්නේය. මේවා අපට පැවසීමට අවශ්‍ය දේවල් නොවේ. මේවා දෙවියන්වහන්සේගේ වචනය තුළ ලියන ලද උන්වහන්සේගේ සත්‍යයන්ය. ඒවා උන්වහන්සේගේ කාර්යය ඉටුකරන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇත!

***යෙසායා 55:10-11***

මෙම පොත භාවිත කිරීමට හොඳම මාර්ගය මෙන්න. යෝබ් පොතේ ආරම්භයෙන් පටන්ගෙන එක් එක් කොටස උගන්වන්න.

*පිල් ක්‍රූවුටර්*

*පිල් ක්‍රූවුටර් මේ පොත ලියුවේ ඔහු පිළිකා රෝගයෙන් පීඩා විඳි අන්තිම මාස කිහිපයේය. යෝබ් මෙන් ඔහු දුක්විඳීම ගැන දන්නේය. මෙය ලියා අවසන් කළ විගස ඔහු මරණයට පත්ව යේසුස්වහන්සේ සමග වසන පිණිස ගියේය. මේ දේශනා සමහරක් ඔහු කළ අවසාන දේශනාවන්ය. ඔබට අන්තර්ජාලයට පිවිසීමේ පහසුකම් තිබේ නම් ඔහුගේ දේශනාවන් www.cuckfeildbaptistchurch.co.uk/Pages/Job2.html වෙතින් ලබාගත හැකිය.*

# අ. ඉක්මන් උපකාරය

## *යෝබ් පොතෙන් දේශනයක් සූදානම් කරන අයුරු*

**1. දෙවියන්වහන්සේගේ උපකාරය ලැබීමට යාච්ඤා කරන්න.**

**2. බයිබල් කොටස කිහිප වරක් කියවන්න.**
මෙම කොටස තේරුම්ගැනීමට ඔබට උපකාරවීම සඳහා **පසුබිම** භාවිත කරන්න.
අමාරු බයිබල් පද තේරුම්ගැනීමට ඔබට උපකාරවීම සඳහා **සටහන්** භාවිත කරන්න.

**3. බයිබල් කොටසෙන් දෙවියන්වහන්සේ අපට උගන්වන ප්‍රධාන කරුණ සොයාගැනීමට උත්සාහ කරන්න.**
ඔබගේ උපකාරය සඳහා **ප්‍රධාන කරුණ** උපයෝගී කරගන්න.

**4. ඔබගේ සෙනඟ උදෙසා යාච්ඤා කරන්න. මෙම බයිබල් කොටස ඔවුන්ට කෙසේ උපකාර වන්නේදැයි කල්පනා කරන්න.**
ඔබගේ උපකාරය සඳහා **කිරීමට යමක්** භාවිත කරන්න.

**5. ඔබගේ දේශනාව ඔබගේම භාෂාවෙන් ලියන්න. බයිබලය උගන්වන ප්‍රධාන කාරණයෙන් පටන් ගන්න.**
ඔබගේ උපකාරය සඳහා **දේශනා කිරීම** කොටසෙහි තිබෙන අපගේ සටහන් භාවිත කරන්න.

**6. දැන් ඔබගේ දේශනාවට පටන්ගැන්මක් සහ අවසන් කිරීමක් ලියන්න.**


**7. ඔබ කළ දේ සෝදිසි කරන්න.**

- **ප්‍රධාන කරුණ** පැහැදිලිද?
- **බයිබලය** උගන්වන දෙය ඔබ ඔවුන්ට පෙන්වූයේද?
- තේරුම් ගැනීමට හා මතකයේ රඳවාගැනීමට ඔබගේ සෙනඟට උපකාරවීම සඳහා ඔබ වදන් **රූපයක්** යොදාගන්නේද?
- ඔබ සෙනඟ සමඟ **සම්බන්ධ** වන්නේද?
- කුමක් **වෙනස්වනු** ඇතැයි ඔබ බලාපොරොත්තු වන්නේද?

**8. ඔබගේ වචන තුළින් දෙවියන්වහන්සේ කතා කරන පිණිස යාච්ඤා කරන්න. උන්වහන්සේගේ සත්‍යය විසින් සෙනඟ වෙනස්කරනු ලබන පිණිස යාච්ඤා කරන්න.**

*වැඩිපුර උපකාරය සඳහා ඊළඟ කොටස කියවන්න*

# ආ. යෝබ් පොත දේශනා කිරීම භාවිත කළයුතු අන්දම



**⬇ අධ්‍යයනය: යෝබ් 1:1-5**

**1 යහපත් මිනිසෙක්**

**▣ පසුබිම**
දුක්විඳීම පිළිබඳව අපට ප්‍රශ්න තිබෙනවා වියහැකිය. සාතන්ට ද ඇසීමට ප්‍රශ්නයක් තිබේ. "යෝබ් දෙවියන්වහන්සේට සේවය කරන්නේ ඔහුට දේවල් ලැබෙන නිසා පමණක් ද?" *යෝබ් 1:9-11.*

ආරම්භයේම දෙවියන්වහන්සේ ප්‍රශ්නයට පිළිතුරු දෙන සේක. යෝබ් යහපත් හා ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකු නිසා එය ඔහු ධනවත් කළේය. යෝබ් සැබෑවටම යහපත්ය. ඔහු ඇතුළාන්තයෙන්ම යහපත්ය. *යෝබ් 1:1-5.*

(යෝබ් යහපත් යැයි දෙවියන්වහන්සේ පවසන කල [යෝබ් 1:1, 8] යෝබ් කිසිවිටෙක පව් නොකරන බව උන්වහන්සේ අදහස් නොකරන සේක. දෙවියන්වහන්සේ හඳුනන හා ප්‍රේමකරන හදවතක් යෝබ්ට තිබිණි. යෝබ් ඇතුළාන්තයෙන් යහපත්ය.)

**▣ ප්‍රධාන කරුණ**
දරුණු දේවලින් දුක්විඳින්නට යන යෝබ් හදවතින්ම යහපත්ය.

**☒ කිරීමට යමක්**
සාතන් පවසන දෙය (යෝබ් 1:9-11) යෝබ් සම්බන්ධයෙන් සත්‍ය නොවේ. එහෙත් එය බොහෝ මිනිසුන් සම්බන්ධයෙන් සැබෑය. තමන්ට හොඳ ජීවිතයක් ලැබෙනු ඇතැයි සිතන බැවින් බොහෝ මිනිසුන්ට කිතුනුවන් වීමට අවශ්‍යය. දෙවියන්වහන්සේ තමන්ට ආශිර්වාද කරනු ඇතැයි ඔවුහු විශ්වාස කරති. දෙවියන්වහන්සේ ලබාදෙන හොඳ දේවල් ඔවුන්ට අවශ්‍යය.

මෙය නිවැරදි නොවන බව දැකීමට ඔබගේ අසන්නන්ට උපකාර කරන්න. මේ ලෙස සිතන අය යෝබ් මෙන් නොවෙති. ඔවුහු සැබෑ කිතුනුවෝ නොවෙති.

**▣ සටහන්**
- යෝබ් 1:1. යෝබ් සර්ව සම්පූර්ණ නොවුවද ඔහු "නිදොස්" (මිනිස්සු ඔහු තුළ කිසි වරදක් නොදුටුවෝය) සහ "අවංක" (යහපත්) වූයේය. ඔහු දෙවියන්වහන්සේට භය වූයේය (ප්‍රේම කළේය, නමස්කාර කළේය). ඔහු නපුරෙන් "වැළකී" (දුරුව) සිටියේය.
- යෝබ් 1:2-3. යෝබ් ලෝකයේ එම කොටසේ "ශ්‍රේෂ්ඨ" (ධනවත්) මනුෂ්‍යයා වූයේය. මිනිස්සු ඔහුගේ වත්පොහොසත්කම් දුටු අතර දෙවියන්වහන්සේ ආශිර්වාද කළ බව දැනගත්තෝය. ස්වකීය සෙනඟ දෙවියන්වහන්සේ අනුගමනය කරන කල ඔවුන්ට ආශිර්වාද කරන බවට උන්වහන්සේ පරණ ගිවිසුමේ පොරොන්දු වූසේක (ද්විතීය කථාව 28:1-14). අද යමෙකු ධනවත්ව සිටී නම් ඔවුන්ට දෙවියන්වහන්සේ ආශිර්වාද කර ඇති බවක් ඉන් අදහස් නොවේ. යමෙකු "ඇදහිල්ලෙන් පොහොසත්" වන කල එය දෙවියන්වහන්සේගේ ආශිර්වාදය පෙන්වයි (යාකොබ් 2:5). අප දෙවියන්වහන්සේ හඳුනන විට හා උන්වහන්සේගේ රාජ්‍යයට අයිති වන කල අප "ධනවත්"ය.
- යෝබ් 1:4-5. පාපය ගැන යෝබ් කොතරම් ප්‍රවේසම් ද යන්න මෙයින් පෙන්වයි. තම දරුවන් යම් වරදක් කළේද යන්න ඔහු නොදනී. එහෙත් පාපයට පූජාවක් අවශ්‍ය බව ඔහු දනී. (තම විනෝදවීම්වලදී දරුවන් දෙවියන්වහන්සේ වෙතින් ඉවතට හැරෙනු ඇතැයි යෝබ් බිය වෙයි.)

10

ඔබ දේශනාවක් සූදානම් කරන සෑම අවස්ථාවකම මේ දේ වලින් ආරම්භ කරන්න:

- දෙවියන්වහන්සේගේ උපකාරය ලැබීම සඳහා යාච්ඤා කරන්න.
- බයිබල් කොටස කියවන්න.
- මේ බයිබල් කොටසින් දෙවියන්වහන්සේ අපට උගන්වන ප්‍රධාන කාරණය සොයාගන්නට උත්සාහ කරන්න.

ඊළඟට ඔබට උපකාරවීම සඳහා මේ සටහන් භාවිත කළ හැකිය. එක් එක් දේශනාවට පිටු දෙකක් ඇත. පළමු පිටුව බයිබල් කොටස ගැන සිතන්නට ඔබට උපකාර වනු ඇත. දෙවන පිටුව දේශනාවක් සඳහා මාතෘකා සහ අදහස් ලබාදෙයි.

ඔබ 📖 මේ සංකේතය දුටු විට, බයිබලය පවසන දෙය ඔබ කියවීම අවශ්‍යය.

## අධ්‍යයන පිටුව: බයිබලය තේරුම් ගැනීම

පළමුවන පිටුව බයිබල් කොටස තේරුම් ගැනීමට ඔබට උපකාර කරයි.

### ▣ පසුබිම

අදාළ කොටසට පෙර හා පසුව පැමිණෙන්නේ කුමක්දැයි සිතා බැලීම වැදගත්ය. අප යෝබ් පොතේ සෑම පරිච්ඡේදයක් දෙසම බලන්නේ නැත. එහෙත් සෑම කොටසක්ම පොතට ගැළපෙන්නේ කෙසේදැයි අප අවබෝධ කරගත යුතුය.

මෙය කිරීමට **පසුබිම** ඔබට උපකාර වනු ඇත.

බයිබල් කොටස ඔබ යෝබ් පොතෙහි කියවන ලද අනෙක් කොටස් මෙන් වන්නේ කෙසේදැයි විමසන්න. එය දුක්විඳීම පිළිබඳ අපගේ අවබෝධයට උපකාර වන්නේ කෙසේදැයි බලන්න.

### ▣ ප්‍රධාන අදහස

ඉතාම වැදගත් කාරණය අපි වචන ස්වල්පයකින් සඳහන් කර ඇත්තෙමු. මේ කාරණය ගැන සිතන්න. බයිබල් කොටස උගන්වන්නේ මෙය බව පෙනෙනවාද? ඔබගේ දේශනාව තුළ මේ කරුණ ඉතාම පැහැදිලිව ප්‍රකාශවන බව සහතික කරගන්න.

### ☒ කිරීමට යමක්:

මේ කොටස ඔබ සිතා බැලිය යුතු යම් දෙයක් බයිබල් කොටසින් තෝරා ගනියි. බයිබලය තේරුම් ගැනීමට බොහෝ උත්සාහ කිරීම ඉතාම වැදගත්ය. මේ කොටසේ ඇතුළත් කාරණය ඉගැන්විය හැක්කේ කෙසේදැයි ප්‍රවේසමෙන් සිතන්න.

**◈ සටහන්**

මේ කොටස අසීරු බයිබල් පද ගැන ඔබට පවසයි. ඔබ උගන්වන කල වැරදි නොකිරීමට එය ඔබට උපකාර වනු ඇත.

## දේශනා පිටුව: බයිබලය උගන්වන්න

බයිබල් කොටස ඉගැන්වීමට දෙවන පිටුව ඔබට උපකාර වේ. ඔබ ඔබගේම වැඩ කොටසද කළ යුතුය. මේ පිටුව ඔබට අදහස් ලබාදෙනු ඇත. ඒ අදහස් ඔබ රැගෙන හොඳම පිළිවෙලට යොදාගත යුතුය. අප ඔබට ඇටකටු ලබාදෙන්නෙමු, නමුත් ඔබ එයට මස් පුරවා ගත යුතුය!



### දේශනා කිරීම: යෝබ් 1:1-5

**යහපත් මිනිසෙක්**

යෝබ් 1:1

"ඔබ ලෝකයේ ආලෝකයයැ"යි යේසුස්වහන්සේ ස්වකීය සෙනඟට පවසන සේක. ඔවුහු හිරු මෙන් බැබළෙති (තමන් තුළ ආලෝකය තිබෙන බැවින් සැබෑ කිතුනුවෝ බැබළෙති. මිනිසුන් ඔවුන් වටා නපුරු ලෙස හැසිරෙන කල ඔවුන්ගේ යහපත්කම බැබළෙයි. ඔවුහු තමන් වටා සිටින මිනිසුන් අනුකරණය නොකරති).

ඇතැම් මිනිස්සු තමන් අවට සිටින්නන් අනුකරණය කරති. රැකියාව කරන ස්ථානයේ දී ඔවුන් රැකියා ස්ථානයේ සිටින මිනිසුන් වැනිය. දේවස්ථානයේ දී ඔවුන් දේවස්ථානයේ සිටින මිනිසුන් වැනිය. එහෙත් සැබෑ කිතුනුවෝ මෙවැන්නෝ නොවෙති. ඔවුහු යහපත්කම බබළවන ආලෝකයෝය. ඔවුන් ඇතුළතින් අවංකය. දෙවියන්වහන්සේ යෝබ් සැදුවාක් මෙන් ඔවුන් ද වෙනස් කර යහපත් කර ඇත.

යෝබ් දෙවියන්වහන්සේ හඳුනයි. ඔහු නපුරට ද්වේශ කරයි. ඔහු යහපතට ප්‍රේම කරයි. එය වෙනස් කරන කිසිවක් යෝබ්ට සිදුනොවනු ඇත.

*දෙවියන්වහන්සේ ඔබගේ මුදල්, නිවස, ඔබගේ සුවය, ඔබගේ පවුල ඔබගෙන් ඉවත් කළහොත් කුමක් සිදුවනු ඇතිද? ඔබ යෝබ් මෙන් වන්නේද? තවදුරටත් ඔබ දෙවියන්වහන්සේ විශ්වාස කරන්නේද? යහපතට ප්‍රේමකර නපුරට ද්වේශ කරන්නේද? එසේ නැතිනම් ජීවිතය පහසුවන විට පමණක් දෙවියන්වහන්සේ අනුගමනය කරන්නේද?*

යෝබ් අවංක හා යහපත් බව දෙවියන්වහන්සේ පවසන සේක. එනිසා මේ පොතෙහි කුමක් සිදුවන්නේදැයි අපි දනිමු. යෝබ් යහපත්ව සිටිනු ඇත. දෙවියන්වහන්සේ යෝබ්ගේ ඇදහිල්ල සෝදිසි කළ ද ඔහුගේ ඇදහිල්ල කඩා නොවැටෙනු ඇත.

*අප සැබෑ කිතුනුවන් වන විට දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා, යේසුස්වහන්සේ අප වෙනස් කරන සේක. උන්වහන්සේ අප ඇතුළාන්තයෙන් යහපත් කරන සේක. යේසුස්වහන්සේ අප සැබෑ කිතුනුවන් බවට පත් කළසේක් නම් අප අවසානය දක්වා දෙවියන්වහන්සේ සමග රැඳෙනු ඇත. (අප සැමවිටම යහපත් දේ කරන බව මෙයින් අදහස් නොකරයි!)*

**යහපත්, ධනවත් මිනිසෙක්**

යෝබ් 1:2-3

- ඔබ ධනවත්ව සිටියේ නම් ඔබගේ මුදල්වලින් ඔබ කුමක් කරනු ඇතිද? ඔබ කුමනාකාර ජීවිතයක් ගතකරනු ඇතිද? ඔබට දෙවියන්වහන්සේ අමතක වනු ඇතිද?

යහපත් හා ධනවත් අය ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙකි. දෙවියන්වහන්සේට ප්‍රේමකරන බොහෝ මුදල් තිබෙන අය ඇත්තේ ස්වල්ප දෙනෙකි. යෝබ් ධනවත් වූ සේම දෙවියන්වහන්සේට ප්‍රේමකළ සේක. ඔහුට කොපමණ අයිතිව තිබුණේදැයි බලන්න.

තමන්වහන්සේ යෝබ්ට ආශිර්වාද කර ඇති බව සියලුදෙනාම දැකීම දෙවියන්වහන්සේට අවශ්‍යය. එහෙත් යෝබ්ගේ වස්තුව ඔහු නාස්ති කළේ නැත. ඔහු තවදුරටත් දෙවියන්වහන්සේ විශ්වාස කළේය. යහපතට ප්‍රේම කළේය, නපුරට ද්වේශ කළේය.

යෝබ් යහපත් මිනිසෙක්ව සිටියේය. දෙවියන්වහන්සේ ඔහුට බොහෝ දේ දුන් කල ද යෝබ් යහපත් මනුෂ්‍යයෙක්ව සිටියේය. දෙවියන්වහන්සේ සියල්ල ගන්නා කල ද යෝබ් තවදුරටත් යහපත් මනුෂ්‍යයෙක්ව සිටිනු ඇත. මනුෂ්‍යයෙක් ඇතුළාන්තයෙන් යහපත්ව සිටින කල පිටස්තර දේවල් ඔහු නරක් කරන්නේ නැත.

*දෙවියන්වහන්සේ ඔබ ඇතුළාන්තයෙන් යහපත්ව සැදුසේක්ද? එසේ නැතිනම් ඔබ දේවස්ථානයේ සිටින විට කිතුනුවෙකු වාගේද? ඔබට සැබෑ කිතුනුවකු වීමට අවශ්‍ය නම් ඔබ වෙනස් කළහැකි එකම පුද්ගලයා යේසුස්වහන්සේය. යොහන් 3:3, 16.*

11

1. **ඔබට උපකාර කරන පිණිස අප ලියා ඇති දේ**

- **මාතෘකා දෙකක් හෝ තුනක්**

මේවා ලියා ඇත්තේ **මේ විධියටය**. බයිබලය පැහැදිලිව ඉගැන්වීමට මේ මාතෘකා ඔබට උපකාර වනු ඇත. ඔබගේ සෙනඟට සුදුසු ලෙස ඔබට මාතෘකා වෙනස්කර ගත හැකිය.

- **බයිබලය පවසන දෙය අපි ඔබට පෙන්වමු.** මිනිසුන් බයිබලයට සවන්දීම අපට අවශ්‍යය. බයිබලය පවසන දෙය ගැන ඔවුන්ට නිතර නිතර සිහිපත් කර දෙන්න. ඔවුන්ට බයිබලයක් ඇති නම් ඔබ කථාකරමින් සිටින බයිබල් පදය සොයාගන්නට ඔවුන්ට කියන්න. මේ සංකේතය මෙය කළයුතු වේලාව ඔබට පෙන්වනු ඇත.

- **බයිබලය උගන්වන දෙය අපි විස්තර කරන්නෙමු.** ඔබගේ සෙනඟට තේරුම් යන ආකාරයට බයිබලය විස්තර කරන්නේ කෙසේදැයි ඔබ සිතා බැලිය යුතුය. ඔබ ඔබගේ සෙනඟ හඳුනන්නේය. අප ඔවුන් නොඳනිමු. අපගේ වචනවලට වඩා ඔබගේ වචන සුදුසුය.

- **අපි ඇතැම්විට වදන් රූපයක් භාවිත කරන්නෙමු.** යෝබ් 1:1-5 දක්වා සටහන්වලින් නිදසුනක් මෙන්න.

*"ඔබ ලෝකයේ ආලෝකයයැ"යි යේසුස්වහන්සේ උන්වහන්සේගේ සෙනගට පවසන සේක. ඔවුහු හිරු මෙන් බැබළෙති. තමන් තුළ ආලෝකය තිබෙන බැවින් සැබෑ කිතුනුවෝ බැබළෙති. මිනිසුන් ඔවුන් වටා නපුරු ලෙස හැසිරෙන කල ඔවුන්ගේ යහපත්කම බැබළෙයි. ඔවුහු තමන් වටා සිටින මිනිසුන් අනුකරණය නොකරති.*

වදන් රූපය ඔබේ සෙනඟට එතරම්ම හොඳ නැති වියහැකිය. මිනිසුන්ට තේරුම් ගැනීමට හැකිවන වඩා සුදුසු වදන් රූපයක් සොයාගැනීම බයිබල් ගුරුවරයෙකු කළයුතුය. බයිබලීය සත්‍යයන් ඉගැන්වීම සඳහා ඔබට වදන් රූප බොහෝමයක් සොයාගැනීමට සිදුවනු ඇත. බයිබලය පවසන දෙය වදන් රූපයෙන් ඉගැන්වෙන්නේද යන්න ගැන බොහෝ ප්‍රවේසම් වියයුතුය.

- **බයිබල් ඉගැන්වීම ඔබගේ සෙනඟට සම්බන්ධ කරගන්නා පිළිවෙල අපි ඔබට පෙන්වන්නෙමු.** දේව වචනය අපට කථා කරනවා ඇසීම ඉතා වැදගත්ය. බයිබලීය ඉගැන්වීම් අපව

වෙනස් කරන්නේ කෙසේදැයි අප දැනගත යුතුය.

- **අපි ඔබට අදහසක් හෝ දෙකක් දෙන්නෙමු.** බයිබලය ඔබගේ සෙනඟට සම්බන්ධ කරන විධි තව බොහෝමයක් ගැන ඔබ සිතිය යුතුය. ඔබ ඔබගේ සෙනඟ හඳුනන්නෙහිය. බයිබලය තුළින් ඔවුන්ගේ ජීවිත වෙනස්විය යුතු ආකාරය දන්නේ ඔබය. මෙන්න නිදසුනක්:

> *දෙවියන්වහන්සේ ඔබගේ ඇතුළාන්තය යහපත්ව සෑදුසේක්ද? එසේ නැතිනම් ඔබ දේවස්ථානයේ සිටියදී කිතුනුවකු මෙන් පෙනෙන්නේද? ඔබට සැබෑ කිතුනුවෙකු වීමට අවශ්‍ය නම් ඔබ වෙනස් කළහැකි එකම පුද්ගලයා යේසුස්වහන්සේය.*

**2. ඔබ කළ යුතු වූ අනිකුත් දෙය**:

- **ඔබගේ දේශනාව පටන්ගත යුත්තේ කෙසේදැයි සිතන්න.** අද දවසේ සවන්දීම වැදගත් වන්නේ මන්දැයි ඔබගේ සෙනඟ දැකිය යුතුය. බයිබලය තුළින් ඔබ ඔවුන්ට උගන්වන දෙය ඔවුන්ට පවසන්න. එය ඔවුන්ට වැදගත් වන්නේ මන්දැයි කියන්න.
- **ඔබගේ දේශනාව අවසන් කළ යුත්තේ කෙසේදැයි සිතන්න.** ප්‍රධාන කරුණු ඔවුන්ට සිහිපත් කර දෙන්න. සිතා බලන්නට හෝ කිරීමට ඔවුන්ට යමක් දෙන්න.
- **යාච්ඤා කරන්න!** ඔබ ඔබගේ මිනිසුන්ට දෙවි සමිඳුන්ගේ වචනයෙන් දෙවි සමිඳුන්ගේ සත්‍යය පවසන්නේය. මිනිසුන්ට කථාකිරීමට දෙවියන්වහන්සේ ඔබගේ වචන යොදාගන්නා පිණිස යාච්ඤා කරන්න. දෙවි සමිඳුන්ගේ සත්‍යය මිනිසුන්ගේ ජීවිත වෙනස්කරනු පිණිස යාච්ඤා කරන්න.
- **සැමවිටම ඔබගේම භාෂාව කථාකරන්න.** මිනිසුන් ඉංග්‍රීසියෙන් කථා නොකරයි නම් ඉංග්‍රීසියෙන් **කිසිත්** නොපවසන්න.

# ඇ. යෝබ් පොත පිළිබඳව

යෝබ් පොත දුක්විඳීම පිළිබඳව බැවින් එය කිතුනුවන්ට ඉතා වැදගත්ය. දුක්විඳීම විවිධාකාරවලින් අප සියලුදෙනා වෙත පැමිණෙන හෙයින් මේ පොත අප සියලු දෙනාටමය.

යෝබ් පොත කියවීමට පහසු පොතක් නොවන බැවින් බොහෝ කිතුනුවන් ඒ පොත හොඳින් හඳුනන්නේ නැත. එම පොත ඔබගේ අසන්නන් වෙත ගෙන යාමට *යෝබ් පොත දේශනා කිරීම* ඔබට උපකාර කරනු ඇත. එය දුක්විඳීම පිළිබඳ වැදගත් සත්‍යයන් ඔවුන්ට උගන්වනු ඇත. දුක්විඳීම ඔවුන් කරා පැමිණි කල මෙය ඔවුන්ට උකාරවනු ඇත.

යෝබ් ජීවත් වූයේ කුමන කාලයේද යන්න අප නොදන්නවා වුවද මෙය බයිබලයේ මුල්ම පොතක් බව බොහෝ අය සිතති. යෝබ් පොත බයිබලයේ "ප්‍රඥා" හෝ "කාව්‍යමය" පොත්වලින් එකකි.

පළමු පරිච්ඡේද දෙක හා අවසාන පරිච්ඡේදය යෝබ්ගේ දුක්විඳීමේ කතන්දරය පවසයි. ඉතිරිය කථාබහ කිරීම්ය.

### සාරාංශය

පළමුව, දෙවියන්වහන්සේ තමාගේ වස්තු සම්පත්, දරුවන් සහ නිරෝගී සුවය ඉවත් කරන අතර යෝබ් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරයි. එහෙත් කාලය ගතවෙත්ම යෝබ් තම දුක්විඳීම් සමඟ පොරබදයි. වැරදි කිරීම පිළිබඳව ඔහුගේ මිත්‍රයන් ඔහුට චෝදනා කළ ද මෙය සැබෑවක් නොවන බව යෝබ් දනී. එහෙත් තමා දුක්විඳින්නේ ඇයිදැයි යෝබ් නොදනී. එය සාධාරණ ලෙස යෝබ්ට නොපෙනෙයි. සියල්ලට වඩා නරක වන්නේ දෙවියන්වහන්සේ නිශ්ශබ්දව සිටීමයි. දෙවියන්වහන්සේ යෝබ් සැනසුවේ නැත.

යෝබ් තම දුක්විඳීමේදී බොහෝ සැර දේවල් (සහ වැරදි දේවල්) කීවේය.

ඔහුට වැඩි වශයෙන් අඳුරු බව හා දොම්නස හැඟිණි. දෙවියන්වහන්සේ තමාට එරෙහිව සිටින බවක් ඔහුට හැඟෙයි. එහෙත් ඔහු කිසිවිටෙක (සාතන්ට අවශ්‍යවන ලෙස) දෙවියන්වහන්සේ අත්හරින්නේ නැත. දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසයේ කිරණ ඔහුගේ වේදනාකාරී වචන තුළින් බබළයි.

යෝබ්ගේ මිතුරෝ ඔහුට උපකාර නොකරති. ඔවුන්ගේ දීර්ඝ තර්ක කිරීම් අසාගෙන සිටින්නට අසීරු වුවද ප්‍රධාන කරුණ යෝබ් පව්කර තිබිය හැකි බවය. පසුතැවිලිවී නැවත දෙවියන්වහන්සේ වෙතට හැරෙන්නැයි යෝබ්ගේ මිතුරෝ ඔහුට පවසති. පාපය යෝබ්ගේ ප්‍රශ්නය නොවන බැවින් මෙය උපකාරී නොවෙයි.

අවසානයේ, දෙවියන්වහන්සේ කථා කරන සේක. මෙය යෝබ් යටහත් පහත් කරන අතර තමන්වහන්සේ ඔහුගේ ප්‍රශ්නවලට පිළිතුරු දීම අවශ්‍ය නොවන බව ඔහුට පෙන්වයි. ඒ වෙනුවට ඔහුගේ දෙවියන්-වහන්සේ යහපත් හා සාධාරණ බව ඔහු දැනගනී.

**පාඩම්**

මේ පොතෙන් ඉගෙනගැනීමට පාඩම් බොහෝමයක් තිබේ (පසුපස තිබෙන සාකච්ඡා පිටුව බලන්න - "යෝබ් පොතෙන් පාඩම්" ... පිටුව. දැන් මේ පාඩම් බලාගෙන ඔබ යෝබ් පොත උගන්වන කල මනසේ තබාගන්න).

---

# යෝබ් පොතේ සැකිල්ලක්

**යෝබ් 1-2: දුක්විඳීම ආරම්භ වේ**

යෝබ් පරීක්ෂාවට ලක්කිරීමට දෙවියන්වහන්සේ සාතන්ට ඉඩ දෙනසේක. ප්‍රශ්න ඇතිවන කල යෝබ් දෙවියන්වහන්සේට සාප නොකරයි.

**යෝබ් 3-41: කථාබහ**

1. යෝබ් සහ මිතුරන් තිදෙනා (යෝබ් 3-31)
යෝබ් යම් නරක දෙයක් කර ඇතැයි යෝබ්ගේ මිතුරන් තිදෙනා සිතයි. තමා වැරදි නැති බව යෝබ් පවසයි. තමාගේ දුක්විඳීම සාධාරණ වන්නේ කෙසේදැයි ඔහුට නොතේරෙයි.

2. එලීහු (යෝබ් 32-37)
යෝබ් යම් වරදක් කර ඇතැයි එලීහුද සිතයි. ඔහු යෝබ් දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය වෙත යොමු කරයි.

3. දෙවියන්වහන්සේ (යෝබ් 38-41)
යෝබ් කොපමණ කුඩාදැයි දෙවියන්වහන්සේ ඔහුට පෙන්වන සේක. දෙවියන්වහන්සේ අසාධාරණ විය හැකියැයි යෝබ් කල්පනා කිරීම වැරදිය.

**යෝබ් 42: දුක්විඳීම අවසන්වෙයි**

වඩා වැඩියෙන් දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට යෝබ් ඉගෙන ගත්තේය. ඔහුට පෙර තිබුණාට වඩා දෙවියන්වහන්සේ ඔහුට ආශීර්වාද කරන සේක.

# යෝබ් පොත

## දේශනා කිරීම

### ඈ: යෝබ් පොත අධ්‍යයනය සහ දේශනා කිරීම

# 1 යහපත් මිනිසෙක්

## පසුබිම

දුක්විඳීම පිළිබඳව අපට ප්‍රශ්න තිබෙනවා වියහැකිය. සාතන්ට ද ඇසීමට ප්‍රශ්නයක් තිබේ. “යෝබ් දෙවියන්වහන්සේට සේවය කරන්නේ ඔහුට දේවල් ලැබෙන නිසා පමණක් ද?” *යෝබ් 1:9-11.*

ආරම්භයේම දෙවියන්වහන්සේ ප්‍රශ්නයට පිළිතුරු දෙන සේක. යෝබ් යහපත් හා ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකු නිසා එය ඔහු ධනවත් කළේය. යෝබ් සැබෑවටම යහපත්ය. ඔහු ඇතුළාන්තයෙන්ම යහපත්ය. *යෝබ් 1:1-5.*

(යෝබ් යහපත් යැයි දෙවියන්වහන්සේ පවසන කල [යෝබ් 1:1, 8] යෝබ් කිසිවිටෙක පව් නොකරන බව උන්වහන්සේ අදහස් නොකරන සේක. දෙවියන්වහන්සේ හඳුනන හා ප්‍රේමකරන හදවතක් යෝබ්ට තිබිණි. යෝබ් **ඇතුළාන්තයෙන්** යහපත්ය.)

## ප්‍රධාන කරුණ

දරුණු දේවලින් දුක්විඳින්නට යන යෝබ් හදවතින්ම යහපත්ය.

## කිරීමට යමක්

සාතන් පවසන දෙය (යෝබ් 1:9-11) යෝබ් සම්බන්ධයෙන් සත්‍ය නොවේ. එහෙත් එය බොහෝ මිනිසුන් සම්බන්ධයෙන් සැබෑය. තමන්ට හොඳ ජීවිතයක් ලැබෙනු ඇතැයි සිතන බැවින් බොහෝ මිනිසුන්ට කිතුනුවන් වීමට අවශ්‍යය. දෙවියන්වහන්සේ තමන්ට ආශිර්වාද කරනු ඇතැයි ඔවුහු විශ්වාස කරති. දෙවියන්වහන්සේ ලබාදෙන හොඳ දේවල් ඔවුන්ට අවශ්‍යය.

මෙය නිවැරදි නොවන බව දැකීමට ඔබගේ අසන්නන්ට උපකාර කරන්න. මේ ලෙස සිතන අය යෝබ් මෙන් නොවෙති. ඔවුහු සැබෑ කිතුනුවෝ නොවෙති.

## සටහන්

- **යෝබ් 1:1.** යෝබ් සර්ව සම්පූර්ණ නොවුවද ඔහු “නිදොස්” (මිනිස්සු ඔහු තුළ කිසි වරදක් නොදුටුවෝය) සහ “අවංක” (යහපත්) වූයේය. ඔහු දෙවියන්වහන්සේට භය වූයේය (ප්‍රේම කළේය, නමස්කාර කළේය). ඔහු නපුරෙන් “වැළකී” (දුරුව) සිටියේය.
- **යෝබ් 1:2-3.** යෝබ් ලෝකයේ එම කොටසේ “ශ්‍රේෂ්ඨ” (ධනවත්) මනුෂ්‍යයා වූයේය. මිනිස්සු ඔහුගේ වත්පොහොසත්කම් දුටු අතර දෙවියන්වහන්සේ ආශිර්වාද කළ බව දැනගත්තෝය. ස්වකීය සෙනඟ දෙවියන්වහන්සේ අනුගමනය කරන කල ඔවුන්ට ආශිර්වාද කරන බවට උන්වහන්සේ **පරණ ගිවිසුමේ** පොරොන්දු වූසේක (ද්විතිය කථාව 28:1-14). අද යමෙකු ධනවත්ව සිටී නම් ඔවුන්ට දෙවියන්වහන්සේ ආශිර්වාද කර ඇති බවක් ඉන් අදහස් **නොවේ**. යමෙකු “ඇදහිල්ලෙන් පොහොසත්” වන කල එය දෙවියන්වහන්සේගේ ආශිර්වාදය පෙන්වයි (යාකොබ් 2:5). අප දෙවියන්වහන්සේ හඳුනන විට හා උන්වහන්සේගේ රාජ්‍යයට අයිති වන කල අප “ධනවත්”ය.
- **යෝබ් 1:4-5.** පාපය ගැන යෝබ් කොතරම් ප්‍රවේසම් ද යන්න මෙයින් පෙන්වයි. තම දරුවන් යම් වරදක් කළේද යන්න ඔහු නොදනී. එහෙත් පාපයට පූජාවක් අවශ්‍ය බව ඔහු දනී. (තම විනෝදවීම්වලදී දරුවන් දෙවියන්වහන්සේ වෙතින් ඉවතට හැරෙනු ඇතැයි යෝබ් බිය වෙයි.)

## ➡ දේශනා කිරීම: යෝබ් 1:1-5

### යහපත් මිනිසෙක්

*යෝබ් 1:1*

⊞ "ඔබ ලෝකයේ ආලෝකයයැ"යි යේසුස්වහන්සේ ස්වකීය සෙනඟට පවසන සේක. ඔවුහු හිරු මෙන් බැබළෙති (තමන් තුළ ආලෝකය තිබෙන බැවින් සැබෑ කිතුනුවෝ බැබළෙති. මිනිසුන් ඔවුන් වටා නපුරු ලෙස හැසිරෙන කල ඔවුන්ගේ යහපත්කම බැබළෙයි. ඔවුහු තමන් වටා සිටින මිනිසුන් අනුකරණය නොකරති).

ඇතැම් මිනිස්සු තමන් අවට සිටින්නන් අනුකරණය කරති. රැකියාව කරන ස්ථානයේ දී ඔවුන් රැකියා ස්ථානයේ සිටින මිනිසුන් වැනිය. දේවස්ථානයේ දී ඔවුන් දේවස්ථානයේ සිටින මිනිසුන් වැනිය. එහෙත් සැබෑ කිතුනුවෝ මෙවැන්නෝ නොවෙති. ඔවුහු යහපත්කම බබළවන ආලෝකයෝය. ඔවුන් **ඇතුළතින් අවංකය.** දෙවියන්වහන්සේ යෝබ් සෑදුවාක් මෙන් ඔවුන් ද වෙනස් කර යහපත් කර ඇත.

**යෝබ් දෙවියන්වහන්සේ හඳුනයි. ඔහු නපුරට ද්වේශ කරයි. ඔහු යහපතට ප්‍රේම කරයි. එය වෙනස් කරන කිසිවක් යෝබ්ට සිදුනොවනු ඇත.**

*» දෙවියන්වහන්සේ ඔබගේ මුදල්, නිවස, ඔබගේ සුවය, ඔබගේ පවුල ඔබගෙන් ඉවත් කළහොත් කුමක් සිදුවනු ඇතිද? ඔබ යෝබ් මෙන් වන්නේද? තවදුරටත් ඔබ දෙවියන්වහන්සේ විශ්වාස කරන්නේද? යහපතට ප්‍රේමකර නපුරට ද්වේශ කරන්නේද? එසේ නැතිනම් ජීවිතය පහසුවන විට පමණක් දෙවියන්වහන්සේ අනුගමනය කරන්නේද?*

යෝබ් අවංක හා යහපත් බව දෙවියන්වහන්සේ පවසන සේක. එනිසා මේ පොතෙහි කුමක් සිදුවන්නේදැයි අපි දනිමු. යෝබ් යහපත්ව සිටිනු ඇත. දෙවියන්වහන්සේ යෝබ්ගේ ඇදහිල්ල සෝදිසි කළ ද ඔහුගේ ඇදහිල්ල කඩා නොවැටෙනු ඇත.

*» අප සැබෑ කිතුනුවන් වන විට දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා, යේසුස්වහන්සේ අප වෙනස් කරන සේක. උන්වහන්සේ අප ඇතුළාන්තයෙන් යහපත් කරන සේක. යේසුස්වහන්සේ අප සැබෑ කිතුනුවන් බවට පත් කළසේක් නම් අප අවසානය දක්වා දෙවියන්වහන්සේ සමඟ රැඳෙනු ඇත. (අප* ***සැමවිටම*** *යහපත් දේ කරන බව මෙයින් අදහස් නොකරයි!)*

### යහපත්, ධනවත් මිනිසෙක්

*යෝබ් 1:2-3*

- ඔබ ධනවත්ව සිටියේ නම් ඔබගේ මුදල්වලින් ඔබ කුමක් කරනු ඇතිද? ඔබ කුමනාකාර ජීවිතයක් ගතකරනු ඇතිද? ඔබට දෙවියන්වහන්සේ අමතක වනු ඇතිද?

යහපත් හා ධනවත් අය ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙකි. දෙවියන්වහන්සේට ප්‍රේමකරන බොහෝ මුදල් තිබෙන අය ඇත්තේ ස්වල්ප දෙනෙකි. යෝබ් ධනවත් වූ **සේම** දෙවියන්වහන්සේට ප්‍රේමකළ සේක. ඔහුට කොපමණ අයිතිව තිබුණේදැයි බලන්න.

තමන්වහන්සේ යෝබ්ට ආශිර්වාද කර ඇති බව සියලුදෙනාම දැකීම දෙවියන්වහන්සේට අවශ්‍යය. එහෙත් යෝබ්ගේ වස්තුව ඔහු නාස්ති කළේ නැත. ඔහු තවදුරටත් දෙවියන්වහන්සේ විශ්වාස කළේය. යහපතට ප්‍රේම කළේය, නපුරට ද්වේශ කළේය.

යෝබ් යහපත් මිනිසෙක්ව සිටියේය. දෙවියන්වහන්සේ ඔහුට බොහෝ දේ දුන් කල ද යෝබ් යහපත් මනුෂ්‍යයෙක්ව සිටියේය. දෙවියන්වහන්සේ සියල්ල ගන්නා කල ද යෝබ් තවදුරටත් යහපත් මනුෂ්‍යයෙක්ව සිටිනු ඇත. මනුෂ්‍යයෙකු ඇතුළාන්තයෙන් යහපත්ව සිටින කල පිටස්තර දේවල් ඔහු නරක් කරන්නේ නැත.

*» දෙවියන්වහන්සේ ඔබ ඇතුළාන්තයෙන් යහපත්ව සෑදුසේක්ද? එසේ නැතිනම් ඔබ දේවස්ථානයේ සිටින විට කිතුනුවෙකු වාගේද? ඔබට* ***සැබෑ*** *කිතුනුවකු වීමට අවශ්‍ය නම් ඔබ වෙනස් කළහැකි එකම පුද්ගලයා යේසුස්වහන්සේය.* ***යොහන් 3:3, 16.***

# 2 දෙවියන්වහන්සේ සහ සාතන්

## පසුබිම

යෝබ් අවංක මනුෂ්‍යයෙකු බව දෙවියන්වහන්සේ අපට පැවසූසේක (යෝබ් 1:1). එසේම යෝබ් අවංක මනුෂ්‍යයෙකු බව දෙවියන්වහන්සේ සාතන්ට ද පවසන සේක (යෝබ් 1:8). දෙවියන්වහන්සේගේ සැලසුම වන්නේ සාතන් යෝබ්ට පහර එල්ලකිරීමයි. අවංක මනුෂ්‍යයෙකු දුක්විඳින්නේ කෙසේද යන්න සාතන්ට සහ අපට පෙන්වීමට දෙවියන්වහන්සේට අවශ්‍යය. ***යෝබ් 1:1-12***

## ප්‍රධාන කරුණ

දෙවියන්වහන්සේ සාතන් පාලනය කරමින් සිටින සේක. අපට සිදුවන සියල්ලේ පාලනය දෙවියන්වහන්සේ අතැතිව සිටින සේක.

## කිරීමට යමක්

යහපත් දේවල් දෙවියන්වහන්සේ වෙතින් පැමිණෙන අතර අයහපත් දේ සාතන් වෙතින් පැමිණෙන බව සමහර කිතුනුවෝ සිතති. එසේ සිතීමේ ඇති වරද කිමෙක්ද?

**දෙවියන්වහන්සේ** යෝබ් වෙත කරදර ගෙනාසේක (යෝබ් 2:10, 42:11). ඔබට යම් අයහපත් දෙයක් සිදුවන කල දෙවියන්වහන්සේ ඊට ඉඩහළ බව විශ්වාස කිරීම **අසීරුය.** එහෙත් උන්වහන්සේ එසේ කර ඇත. දෙවියන්වහන්සේ පාලනය අතැතිව සිටින බව දැකීමට ඔබ විසින් ඔබගේ අසන්නන්ට උපකාර කරනු ලැබිය හැකිවන්නේ කෙසේද?

අපගේ සියලු කරදරවලදී දෙවියන්වහන්සේ අප පසුපස සිටින බව අප දන්නා කල මහත් සැනසීම තිබේ. අප සිටින්නේ යක්ෂයාගේ ද්වේශ කරන අත්වල නොව, දෙවියන්වහන්සේගේ ප්‍රේමණීය දෑත්වලය.

වැදගත් සත්‍යයන් දෙකක් අල්ලාගෙන සිටීමට ඔබගේ අසන්නන් ධෛර්යවත් කරන්න: දෙවියන්වහන්සේට සියලු බලය ඇති **අතර** දෙවියන්වහන්සේ ප්‍රේමණීය වන සේක (ගීතා. 62:11-12).

## සටහන්

- **යෝබ්** 1:6-7. සාතන් දේවදූතයන් සමඟ මෙහි පැමිණියේ ඇයිදැයි අපි නොදනිමු. දෙවියන්වහන්සේ සාතන් ස්වර්ගයෙන් වීසිකර දැමුවද ඔහුට මෙහි සිටීමට දෙවියන්වහන්සේ ඉඩහරින සේක. දෙවියන්වහන්සේගේ යහපත් පරමාර්ථ වෙනුවෙන් සාතන්ගේ නපුර භාවිත කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍යය.
- **යෝබ්** 1:8. **දෙවියන්වහන්සේ** සාතන්ට යෝබ් ගෙනහැර දක්වන සේක. සාතන් යෝබ්ට කරදර පැමිණවීමට **දෙවියන්වහන්සේ** සැලසුම් කරන සේක.
- **යෝබ්** 1:9-11. සාතන් **දෙවියන්වහන්සේට** මෙන්ම යෝබ්ට විරුද්ධව කථා කරයි. "ඔබවහන්සේ යෝබ්ට යහපත් දේවල් දෙනසේක. ඔබ සියලු විපත්තිවලින් යෝබ් ආරක්ෂා කරන සේක (ඔහු වටා වැටක් දමන සේක). ඔබවහන්සේ ඔහු ඔබගේ පැත්තේ තබාගන්නේ එසේය. එනිසා යෝබ් ඔබවහන්සේට ඇත්තටම සේවය කරයි."
- **යෝබ්** 1:12. සාතන්ට කළ හැකිදේ සහ ඔහුට කළ නොහැකි දේ දෙවියන්වහන්සේ ඔහුට පවසන සේක. දෙවියන්වහන්සේ සාතන් කෙරෙහි පාලනය අතැතිව සිටින සේක.

# ➡ දේශනා කිරීම: යෝබ් 1:6 - 12

## සාතන්

### සාතන් නපුරු දේවදූතයෙකු පමණී

*යෝබ් 1:6*

සාතන් දෙවියන්වහන්සේ නොවේ. සාතන්ට අවශ්‍ය දේ කිරීමට සාතන්ට නොහැකිය. දෙවියන්වහන්සේ ඔහුට ඉඩ දෙනතුරු යෝබ්ට අතතැබීමට ඔහුට නොහැකිය.

⊞ එක් ලොකු අයෙකු හා කුඩා අයෙකු ලෙසින් වන පිරිමි ළමුන් දෙදෙනෙකු ගැන සිතන්න. ලොකු පිරිමි ළමයා කුඩා පිරිමි ළමයාට ද්වේශ කරන අතර හිංසා කිරීමට ප්‍රිය කරයි. ගුරුවරයා එහි සිටී. එනිසා ලොකු පිරිමි ළමයාට අනෙකා ස්පර්ශ කිරීමට නොහැකිය. ලොකු පිරිමි ළමයා සාතන් පිළිබඳ පින්තූරයකි. සාතන් දෙවියන්වහන්සේගේ දරුවන්ට වඩා ශක්තිමත්ව සිටින අතර ඔවුන්ට හිංසා කිරීමට ඔහුට අවශ්‍යය. එහෙත් දෙවියන්වහන්සේ අවසර දෙනතෙක් ඔහුට අප ස්පර්ශ කළ නොහැකිය. *යෝබ් 1:2*

> *සාතන්ට අවශ්‍ය දේ කිරීමට ඔහුට නොහැකි නිසා දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා. සාතන් නපුර භාරව නැත්තේය. ඔහුට කළහැකි වන්නේ දෙවියන්වහන්සේ ඔහුට ඉඩහරින දේ පමණී. දෙවියන්වහන්සේගේ සෙනගට නරක දේවල් සිදුවන කල අපගේ කරුණාවන්ත **දෙවියන්වහන්සේ** පාලනය අතැතිව සිටින සේක. දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා.*

### සාතන් නපුර සොයයි

*යෝබ් 1:9-11*

සාතන්ට කිරීමට අවශ්‍ය කුමක්දැයි ඔබ දකින්නේද? දෙවියන්වහන්සේ සමඟ වන යෝබ්ගේ මිත්‍රත්වය විනාශකර දැමීම ඔහුට අවශ්‍යය. දෙවියන්වහන්සේගෙන් යෝබ්ට යහපත් දේවල් ලැබෙන නිසා පමණක් ඔහු දෙවියන්වහන්සේට සේවය කරන බව පවසයි. මෙය බොරුවකි.

> *මෙවැනි සැකයන් අපගේ මනසට දැමීමට සාතන් ප්‍රිය කරයි. යක්ෂයා වංචාකාරයෙකු හා අපට හිංසා කිරීමට කැමති කෙනෙකු බව සිහි තබාගන්න. **යාකොබ් 4:7.***

### දෙවියන්වහන්සේ

*යෝබ් 1:6-12*

**දෙවියන්වහන්සේ** සාතන්ගෙන් ප්‍රශ්න අසන්නේ කෙසේදැයි බලන්න. යෝබ් ගැන සිතන්නට **දෙවියන්වහන්සේ** සාතන්ට සලස්වන සේක. යෝබ්ට හිංසා කිරීමට සාතන්ට හැකි බව **දෙවියන්වහන්සේ** පවසන සේක. දෙවියන්වහන්සේ සියල්ලේ පාලනය අතැතිව සිටින සේක.

යෝබ් 2න් පසු අප සාතන් ගැන කියවන්නේ නැත. යෝබ් පොත තුළ සාතන් ඉතා වැදගත් නැත. අප දුක්විඳින කල කල්පනා කළ යුතු වැදගත්ම තැනැත්තා දෙවියන්වහන්සේය. **අප සාතන්ට දොස් තබන්නේ නැත. අපි දෙවියන්වහන්සේ විශ්වාස කරමු.**

තමා විඳින සියල්ල පසුපස දෙවියන්-වහන්සේ සිටින බව යෝබ් දනී. දෙවියන්-වහන්සේ තමා මරා දැමුවද දෙවියන්-වහන්සේ කෙරෙහි විශ්වාස කරන බව යෝබ් පසුව පවසයි (යෝබ් 13:15).

අපට දරුණු දේවල් කිරීමට දෙවියන්-වහන්සේ ඉඩහරින බව විශ්වාස කිරීම අසීරුය. ***යෝබ් 1:12.*** අසීරු දේවල් සිදුවන විට අපට හැඟෙන්නේ කෙසේදැයි කථා කරන්න. කිරීමට යමක් බලන්න.

> *යෝබ් 1:9-11හි තිබෙන සාතන්ගේ වචන ඔබ සම්බන්ධයෙන් සත්‍ය වියහැකිය. ඔබ දෙවියන්-වහන්සේ විශ්වාස කරන්නේ උන්වහන්සේ ඔබට යහපත් දේවල් දෙනවිට පමණක්ද?*
>
> *එසේ නැතිනම් ඔබ වෙනුවෙන් කුරුසිය මත මරණයට පත්වන්නට ස්වකීය පුත්‍රයාණන් දුන් නිසා උන්වහන්සේ ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නේද? යේසුස්වහන්සේ මරණයට පත්වූ නිසා කුමක් සිදුවුවත් උන්වහන්සේ විශ්වාස කරන්නේද? **රෝම 5:8.***

## ⬇ අධ්‍යයනය: යෝබ් 1:13-22

# 3 දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා?

### ▣ පසුබිම

ඉක්මනින් භයානක දේවල් යෝබ්ට සිදුවනු ඇති බව අපි දනිමු. යෝබ් පරීක්ෂා කිරීමට දෙවියන්වහන්සේ **සාතන්ට** ඉඩ දුන් බව අපි දනිමු. කරදර පැමිණිවිට යෝබ් දෙවියන්වහන්සේට සාපකිරීම සාතන්ට අවශ්‍යය. **දෙවියන්වහන්සේට** යෝබ් ගැන, ඔහු සැබෑ ඇදහිලිවන්තයකු බවට, සැබෑවටම අවංක මිනිසෙකු බවට නිසැක බව අපි දනිමු. 📖 ***යෝබ් 1:1-12***

මේ පිළිබඳව යෝබ් කිසිවක් නොදන්නා බව සිහිතබාගන්න. යෝබ්ගේ ඇදහිල්ල කෙතරම් ගැඹුරු ද යන්න මෙහිදී අපි ඉගෙන ගනිමු. 📖 ***යෝබ් 1:13-22***

### ⊡ ප්‍රධාන කරුණ

ඇදහිලිවන්තයකු හට කුමක් සිදුවුවද දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමට හා විශ්වාස කිරීමට හැකියාව දෙයි.

### ☆ කිරීමට යමක්

1. යෝබ් අපට අනර්ඝ ආදර්ශයකි. එහෙත් කරදරවලදී ඔහු කළාක් මෙන් අප සැමවිටම දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්නේ නැත. අසාර්ථකවූ ඇදහිලිවතුන් සනසන්නට සිහි තබාගන්න. ඇතැම්විට සමහර අය තමන්ගේ වේදනාවේදී දෙවියන්වහන්සේට විරුද්ධව කටයුතු කර ඇත. දෙවියන්වහන්සේගෙන් සමාව ඉල්ලා සිටීමටත් නැවත උන්වහන්සේට ප්‍රශංසා කිරීමට ඉගෙනගැනීමටත් ඔවුන්ට උපකාර කරන්න.

2. කරදර පැමිණීමට පෙර දෙවියන්-වහන්සේගේ මාර්ග ඉගෙනගැනීම හොඳය. උන්වහන්සේ යහපත්ය, ප්‍රේමණී-යය, ප්‍රඥාවන්තය, එසේම පාලනය අතැතිව සිටින සේක. අප මෙය දැන සිටින කල කරදර පැමිණෙන විට උන්වහන්සේට ප්‍රශංසා කිරීමට පහසුය (දානියෙල් 2:20-21, 4:34-35).

### ✹ සටහන්

- **යෝබ් 1:14-19.** යෝබ්ගේ පවුලට භයානක දේවල් සතරක් සිදුවිය. එයින් දෙකක් මනුෂ්‍ය කණ්ඩායම්වල පහරදීම්ය ("ෂෙබායිම්වරුන්" සහ "කල්දිවරුන්"). අනෙක් දෙක වන්නේ අකුණු සහිත කුණාටුවක් සහ සුළඟය. සතරම දෙවියන්වහන්සේගේ එකඟත්-වය සහිතව සාතන් වෙතින් පැමිණි බව අපි දනිමු. දෙවියන්වහන්සේ පාලනය අතැතිව සිටින බැවින් මෙය දෙවියන්-වහන්සේ කළ බව යෝබ් දැකීම නිවැරදිය (යෝබ් 1:21).

- **යෝබ් 1:20.** තම වේදනාව සහ අහිමිවීම පෙන්වීමට යෝබ් තමාගේ ඇඳුම් ඉරාගෙන හිස මුඩු කර-ගත්තේය. යෝබ්ගේ හදවත වේදනා-වෙන් පිරී තිබුණ ද **තවමත් දෙවියන්-වහන්සේට ප්‍රශංසා කිරීමට ඔහුට ඕනෑය.** අපට දෙවියන්වහන්සේ ඉදිරියේ අවංක වියහැකි අතර අපට හැඟෙන දේ (දුක, වේදනාව, කෝපය) උන්වහන්සේට පැවසිය හැකිය. අපට ඇතුළාන්තයෙන් හැඟෙන්නේ නැතිනම් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන බවක් සිනාවක් සමගින් කිසිවිටෙක **මවා** නොපෙන්විය යුතුය.

- **යෝබ් 1:22.** යෝබ් 1:11 බලන්න. **සාතන් අසාර්ථක විය.**

# ➡ දේශනා කිරීම: පිලිප්පි 1:13-22

## අප දෙවියන්වහන්සේ ගැන සිතන අයුරු

*යෝබ් 1:20*

*[කතන්දරය පවසන්න. මිනිසුන් සතර දෙනෙකු යෝබ්ට නරක ආරංචි ගෙන ඒමට දුව යාම රඟ දක්වන්න.]* මේවායින් එකක් ඔබට සිදුවූයේ නම් කෙසේ හැඟෙන්නේ දැයි කල්පනා කරන්න.

**සියල්ල වරදින විට ඇත්තටම ඔබ දෙවියන්වහන්සේ ගැන සිතන්නේ කෙසේ-දැයි සොයාගන්න.**

මෙය සිදුවීමට පෙර යෝබ් ගැන සිතන්න. ඔහු සතුටින් සිටියේය. ඔහු ධනවත්ව සිටියේය. ඔහු දෙවියන්වහන්සේට ප්‍රේම කළේය. පසුව විනාඩි කිහිපයකින් ඔහුට සියල්ල නැතිවී ගියේය. ඔහුගේ දරුවන් දසදෙනාම ඔහුට අහිමි වෙයි. යෝබ් දෙවියන්වහන්සේ ගැන සිතන්නේ කෙසේ-දැයි අපට මෙහි දැකිය හැකිය.

- **යෝබ් තම වේදනාව පෙන්වයි.** ඔහු දෙවියන්වහන්සේ ඉදිරියේ අවංක වෙයි. තමා හොඳින් සිටින බවක් මවා පෙන්වන්නේ නැත. ඔහු හොඳින් නැත. ඔහු ඇතුළතින් කෑලිවලට කැඩී ඇත.
- **යෝබ් නමස්කාර කරයි.** යෝබ්ට බොහෝසේ වේදනාව තිබේ. ඔහුට ප්‍රශ්න බොහෝමයක් තිබේ. සියල්ලට වඩා වැදගත් යමක් පළමුව පැමිණේ. ඔහු දෙවියන්වහන්සේට ප්‍රශංසා කරයි.

*කරදර පැමිණෙන කල ඔබ දෙවියන්-වහන්සේ **වෙතට** හැරෙන්නේද? එසේ නැතිනම් ඔබ දෙවියන්වහන්සේ **වෙතින්** ඉවතට හැරෙන්-නේද? දෙවියන්වහන්සේ ගැන ඔබ කුමක් සිතන්නේදැයි එය පෙන්වයි. තවදුරටත් **දෙවියන්වහන්සේ ප්‍රශංසාව ලැබීමට සුදුසු බව** දන්නා නිසා යෝබ් දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමට හැරුණේය. දෙවියන්වහන්සේ කුමක් කළ ද උන්වහන්සේ **යහපත්ය**, උන්වහන්සේ ප්‍රේමයය. ඔබ එය විශ්වාස කරන්නේද?*

## දෙවියන්වහන්සේගේ දීමනාවන් ගැන අප සිතන අයුරු

*යෝබ් 1:21*

**දෙවියන්වහන්සේ ස්වකීය දීමනාවන් ඉවත් කරගන්නා කල ඔබ ඒවා ගැන සිතන්නේ කෙසේදැයි සොයාගන්න.**

සාතන් ඉතා වැරදිව සිටියේය (යෝබ් 1:9-11). යෝබ් **දෙවියන්වහන්සේගේ දීමනා-**වලට ඇලුම්ව සිටියේයැයි සාතන් සිතුවේය. එහෙත් යෝබ් දෙවියන්වහන්සේට ඇලුම්ව සිටියේය. ***යෝබ් 1:21.***

- ඔබට තිබෙන සියල්ල ගැන කල්පනා කරන්න. "එය මගේ"යි අපි කියමු. එහෙත් එය සැබෑවටම ද?
- අප සතු දේවලට අපට කුමන අයිතියක් තිබේද? ඒවා අපට දුන්නේ කවුද?

*දෙවියන්වහන්සේ ඔබගේ නිරෝගී සුවය, අස්වැන්න හෝ ඔබගේ පියා ඔබගෙන් ඉවත් කරන සේක් නම් ඔබ යෝබ් මෙන් දෙවියන්-වහන්සේට ප්‍රශංසා කරන්නේද? තවදුරටත් ඔබ වෙනුවෙන් දෙවියන්වහන්සේ සිටින සේක. ඔබ උන්වහන්සේට ප්‍රේම කරන්නේද?*

*දෙවියන්වහන්සේ කුඩා දේවල් ඉවත් කරනවිට පවා දොස් කීමට හෝ කෝපවීමට පහසුය. එසේ නැතිනම් ඇතැම්විට ඔබේ දේවල් ගැන ඔබ කනස්සලු වනු ඇත. බෙදාහදා ගැනීමට හෝ දීමට අසීරු බවක් ඔබට දැනෙන්නේද? එසේ ඔබ දෙවියන්වහන්සේගේ **දීමනාවන්** කෙරෙහි පමණට වඩා ඇලුම්ව සිටින්නේද?*

*දෙවියන්වහන්සේ කිසි දිනෙක ඉවත් නොකරන දීමනාවක් තිබේ. එය ඔබ සතු කරගත හැකි සියල්ලට වඩා වටිනාකමින් යුතුය. ඔබට යේසුස්වහන්සේගේ මෙම දීමනාව නොමැතිනම් දැන්ම එය උන්වහන්සේගෙන් ඉල්ලාසිටින්න.* ***මතෙව් 6:19-21***

## අධ්‍යයනය: යෝබ් 2:1-10

# 4 දෙවියන්වහන්සේට අයිතිය ඇත

### පසුබිම
භයානක අහිමිවීම යෝබ්ගේ ඇදහිල්ල කොතරම් සැබෑද යන්න පෙන්වයි (යෝබ් 1:20-22):

- ඔහු තමාගේ වේදනාවේදී දෙවියන්වහන්සේට ප්‍රශංසා කරයි.
- දෙවියන්වහන්සේ ස්වකීය දීමනාවන් අහක් කරන කල ද ඔහු දෙවියන්වහන්සේට ප්‍රේමකරයි.

එහෙත් සාතන් පහසුවෙන් අත්හරින්නේ නැත. යෝබ් දෙවියන්වහන්සේ වෙතින් ඉවතට හැරවීම ඔහුට තවමත් අවශ්‍යය. යෝබ් දෙවියන්වහන්සේට සේවය කරන්නේ දෙවියන්වහන්සේ ඔහුට දෙන සියල්ල නිසා බව පෙන්වීමට ඔහුට අවශ්‍යය. *යෝබ් 2:1-10*

### ප්‍රධාන කරුණ
අප සම්බන්ධයෙන් ඕනෑම දෙයක් කිරීමට දෙවියන්වහන්සේට අයිතිය ඇත (ඇතැම්විට කිතුනුවෝ මෙය දෙවියන්වහන්සේගේ "පරමාධිපත්‍යය" ලෙස හඳුන්වති. උන්වහන්සේ අප කෙරෙහි [පරමාධිපත්‍ය] දෙවියන්වහන්සේ වන සේක).

### කිරීමට යමක්
කරදර පැමිණෙන කල මේ සත්‍යය පිළිගැනීම අසීරුය. එය කෙතරම් අසීරු විය හැකි ද යන්න ඔබ අවබෝධ කරගන්නා බව පෙන්වන්න. කාරුණික ආකාරයකින් කථා කරන්න. ඔබගේ ඇතැම් අසන්නන් කොපමණ දුක්විඳ ඇතිදැයි සිහිකරන්න.

අද යෝබ් මෙන් කරදර බාරගත් මිනිසුන් පිළිබඳ කතන්දර පවසන්න. මෙය ඔබගේ අසන්නන්ට ධෛර්යය සහ ශක්තිය ගෙනදෙනු ඇත. මේ අසීරු සත්‍යය යහපත් සත්‍යය බව අප පෙන්වනු ඇත. අපට දෙවියන්වහන්සේ තදින් අල්ලාගෙන සිටීමට එය උපකාර වේ.

### සටහන්
- **යෝබ් 2:3.** යෝබ්ට සිදුවූ දෙයෙහි වගකීම දෙවියන්වහන්සේ ගන්නා සේක ("නුඹ ඔහුට විරුද්ධව මා පෙළඹෙව්වේය"). යෝබ්ට පහරදීමට තමාට ඉඩහරින මෙන් සාතන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලාසිටියේය. බැහැයි කියන්නට දෙවියන්වහන්සේට හැකිව තිබිණි. එහෙත් දෙවියන්වහන්සේ කැමැත්ත දුන්සේක.
- **යෝබ් 2:4-5.** (යෝබ් 1:12 බලන්න.) "මේ කරදරය ගියේ සම තුළට පමණි. ඇත්තටම අපි යෝබ්ට තවම හිංසා කළේ නැත. යෝබ් තමාටම හිංසා පමුණුවා ගැනීමට සැලැස්වීම මාහට ඉඩදෙන්න. එවිට ඔහු ඔබට සාප කරනවා ඇත"යි සාතන් පවසයි.
- **යෝබ් 2:9.** විශ්වාසවන්තව සිටීම නතර නොකරන බව යෝබ්ගේ භාර්යාව දකින්නීය. යෝබ් දෙවියන්වහන්සේට සාප කළහොත් ඔහු විශ්වාස කරන සියල්ලට එරෙහිව යන්නේය. මේ දරුණු වේදනාවට වඩා එය හොඳ යැයි යෝබ්ගේ භාර්යාව සිතන්නීය. එහෙත් එය වැරදි වන බව යෝබ් මෙන් ඇය ද දන්නීය.

## අල්ලාගෙන සිටින්න

***යෝබ් 2:9***

[සාතන්ට කළ හැකි දේ පිළිබඳව දෙවියන්වහන්සේ සීමාවන් දමන්නේ කෙසේදැයි ඔබට යළිත් පෙන්විය හැකිය (යෝබ් 2:1-6). දෙවියන්වහන්සේ පාලනය අතැතිව සිටින සේක. සාතන්ට යෝබ්ගේ ජීවිතය ගැනීමට නොහැකිය.]

දැනටමත් යෝබ්ට කොපමණ කරදර තිබුණේදැයි කල්පනා කරන්න. ඔහුට ඔහුගේ දරුවන් සහ ඔහුගේ වස්තුව අහිමිවී ඇත. එසේම **දෙවියන්වහන්සේ** ඔහුට මෙය කළ බව ඔහු දනී. ඔහුගේ වේදනාව ඉතා අධිකය.

ඉන්පසු දෙවියන්වහන්සේ ඔහුට වඩාත් වේදනාව දෙනසේක! ඔහුගේ මුළු ශරීරය වණවෙයි. මෙය කෙතරම් වේදනාකාරී වූයේදැයි සිතන්න (යෝබ් 2:7-8). මෙය සාතන්ගේ අදහසක් වූ බව අපි දනිමු. යෝබ් මෙය නොදන්නවා වුවද දෙවියන්වහන්සේ සැමවිටම පාලනය අතැතිව සිටින බව ඔහු දනී.

යෝබ් කුමක් කරනු ඇතිද? ***යෝබ් 2:9***

යෝබ් තදින් දෙවියන්වහන්සේ අල්ලාගෙන සිටී. දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම නතර කරන්නට ඔහුගේ භාර්යාවට අවශ්‍යය. ඇය දෙවියන්වහන්සේ සමඟ කෝපව සිටින්නීය. යෝබ් දෙවියන්වහන්සේ සමඟ තම සබඳතාව නතර කිරීම ඇයට අවශ්‍යය. යෝබ්ට මේ සියල්ල කළේ දෙවියන්වහන්සේ නම් දෙවියන්වහන්සේට සාප කරන්න. එහෙත් යෝබ් මේ සත්‍යය දන්නා නිසා ඔහු තදින් දෙවියන්වහන්සේ අල්ලාගෙන සිටී. **අපට ඕනෑම දෙයක් කිරීමට දෙවියන්වහන්සේට අයිතිය ඇත.**

යෝබ් වසර ගණනාවක් මෙය විශ්වාස කළේය. දැන් දරුණු වේදනාවේදී ඔහු තවදුරටත් විශ්වාස කරයි. ඔහු දෙවියන්වහන්සේ අත්නොහරිනු ඇත.

*යෝබ්ගේ භාර්යාව මෙන් කල්පනා කිරීම පහසුය. "දෙවියන්වහන්සේ **මෙය** කරන සේක් නම් උන්වහන්සේ යහපත් වියහැකි වන්නේ කෙසේද?"යි අපි කල්පනා කරමු. "මේ සියල්ල සිදුවන්නට දෙවියන්වහන්සේ ඉඩහරින සේක් නම් දෙවියන්වහන්සේගෙන් ඈත්ව යාම යහපත් වනු ඇතැ"යි අපි සිතමු. **එහෙත් මෙය වැරදිය.** එය ඉතා භයානක ද වෙයි.*

*යෝබ් නිවැරදිය. ඔබට තේරුම්ගැනීමට නොහැකි විට දෙවියන්වහන්සේ තදින් අල්ලාගෙන සිටින්න. බයිබලය පවසන දෙය විශ්වාස කරන්න. අපට ඕනෑ දෙයක් කිරීමට දෙවියන්වහන්සේට අයිතිය ඇත. එසේම උන්වහන්සේ සැමවිටම යහපත්ය.*

## කරදර බාරගන්න

***යෝබ් 2:10***

යෝබ් විශ්වාස කරන්නේ කුමක්ද?

- අප කරදර බාරගත යුත්තේ අප ඊට **සුදුසු වන විට** පමණක්ද?
- අප බාරගත යුත්තේ කරදර **සාමාන්‍ය** ප්‍රමාණයක් ද?
- **ඇයිදැයි** අපට **දැකිය නොහැකි විට** ද අප **ඕනෑම** වේලාවක, **ඕනෑම** කරදරයක් බාරගත යුතුද?

ඔබ විශ්වාස කරන්නේ කුමක්ද?

යෝබ්ට මෙය අපහසු නොවිණි. අපි එය පසුව බලමු. එහෙත් මේ කරදරය දෙවියන්වහන්සේගෙන් වන **තෑග්ගක්** බව ඔහු දනී. යෝබ්ට එය තේරුම් නොගිය ද ඔහුගේ යහපත් දෙවියන්වහන්සේගෙන් වන තෑග්ග ඔහු **බාරගනී**.

*ඇයිදැයි දෙවියන්වහන්සේ නොපවසන කල ඔබ උන්වහන්සේ විශ්වාස කරන්නේද? දෙවියන්වහන්සේ දෙවියන්වහන්සේ නිසා අපට **ඕනෑම** කරදරයක් දීමට උන්වහන්සේට අයිතිය තිබේ. ඔබ උන්වහන්සේ විශ්වාස කරන්නේද?*

*දෙවියන්වහන්සේ දුක්විඳින පිණිස ස්වකීය පුත්‍රයාණන් දුන් බව සිහිතබාගන්න. යේසුස්වහන්සේ ස්වකීය සෙනඟ දරුණුම කරදරයෙන් - නිරයෙන් **ගළවාගන්නට** දුක්වින්ද සේක.*

## ⬇ අධ්‍යයනය: යෝබ් 2:11-3:26

# 5 ඔහුගේ වේදනාවට සංවේදී වන්න!

### ▣ පසුබිම
අපි යෝබ් පොතෙහි දීර්ඝ කොටසක් ආරම්භ කරන්නෙමු. බොහෝ පරිච්ඡේද-වල යෝබ් සහ ඔහුගේ මිතුරෝ යෝබ්ගේ දුක්විඳීම පිළිබඳව තර්ක කරති. අවසානයේදී යෝබ්ට සිදුවන්නේ කුමක්දැයි දැනගැනීමට අප අවසාන පරිච්ඡේදයට පැමිණෙන තෙක් බලා සිටිය යුතුය.

යෝබ් පව් කරන්නට සැලැස්වීමෙන් සාතන් අසාර්ථක වෙයි. යෝබ් දෙවියන්වහන්සේට එරෙහිවීම ප්‍රතික්ෂේප කළේය. ඒ වෙනුවට ඔහු දෙවියන්වහන්සේට ප්‍රශංසා කළේය (යෝබ් 1:20-22, 2:10).

යෝබ්ගේ වේදනාව කෙතරම් ගැඹුරු ද යන්න අපි මෙහිදී දකිමු. යෝබ් තවමත් දෙවියන්වහන්සේ තදින් අල්ලාගෙන සිටිය ද ඔහුගේ තිත්ත වේදනාව ඔහුගේ වචනවලින් පෙන්වයි. 📖 ***යෝබ් 2:11-3:26***

### ⊙ ප්‍රධාන කරුණ
යෝබ්ගේ වේදනාවට සංවේදී වන්න.

(අද මහත් කරදරවලින් දුක්විඳින අය තේරුම්ගැනීමට මෙය උපකාර වේ. යෝබ්ට මෙන් අපට හැඟෙන විට එය අපට උපකාර වෙයි.)

### ☆ කිරීමට යමක්
යෝබ් පවසන දෙයෙහි වරද දැකීම පහසුය. ඇත්තටම අප උපන් දවසට සාප නොකළ යුතුය. ඇත්තටම අප මරණයට පත්වුවා නම් හොඳ යැයි ප්‍රාර්ථනා නොකළ යුතුය. එහෙත් ප්‍රධාන කරුණ මගහැර නොගන්න. **තම වේදනාව පෙන්වීමට යෝබ්ට අවශ්‍යය.** අප ඔහුගේ **හැඟීම්වලට** සවන්දීමට අවශ්‍යය. ජීවිතය අපට වේදනා ගෙනදෙන කල අපගේ දුක්විඳීම තේරුම් ගන්නට අපට මිනිසුන් අවශ්‍යවේ. සාමාන්‍යයෙන් නිවැරදි කිරීමට කෙනෙකු අපට අවශ්‍ය නොවේ.

තම වේදනාව තුළ සිටින මිනිසුන් ගැන සංවේදී වන්නට ඔබගේ අසන්නන්ට ඔබගේ දේශනාවේදී උපකාර කරන්න.

### ❋ සටහන්
- **යෝබ්** 2:11-13. යෝබ්ට උපකාර කිරීමට ඔහුගේ මිතුරන් තිදෙනාට සැබෑවටම අවශ්‍යය. ඔවුහු ඔහු සමඟ හඬති. ඔවුහු නිශ්ශබ්දව සතියක් ඔහු සමඟ හිඳගෙන සිටිති.
- **යෝබ්** 3:1-10. යෝබ් තමා උපන් දවසට සාප කරයි. ඒ දවස කිසිදිනෙක උදා නොවේවායි ඔහු ප්‍රාර්ථනා කරයි. ඒ දවස දින දර්ශනයෙන් ඉවත් කිරීම ඔහුට අවශ්‍යය.
- **යෝබ්** 3:11-19. "මා උපතේදී මැරුණා නම්, මට මේ සියලු වේදනාවන් නොතිබෙනු ඇත. මා සමාදානයේ සැතපෙනු ඇත"යි යෝබ් පවසයි. ජීවිතය එතරම් දරුණු බැවින් යෝබ්ට මරණය සුන්දර දෙයක් ලෙස පෙනෙයි (යෝබ් 3:17 යෝබ් නිවැරදි නැත, මරණය යනු විනිශ්චය බව ඔහුට අමතක වෙයි).
- **යෝබ්** 3:20-26. යෝබ් මරණය ප්‍රිය කරයි. ඔහු මරණයට පත්වීමට මහත්සේ සතුටු වෙයි. දෙවියන්-වහන්සේ ඔහු පණපිටින් තබන්නේ ඇයි? බේරීයාමට මගක් නැත (යෝබ් 3:23). දෙවියන්වහන්සේ ඔහුට වේදනාව සහ කඳුළු දෙන සේක (යෝබ් 3:24). විවේකයක් නැත.

# ➡ දේශනා කිරීම: යෝබ් 2:11-3:26

## ඔහුගේ නිහඬ වේදනාට සංවේදී වන්න

*යෝබ් 2:11-13*

**යෝබ් නිශ්ශබ්දය.** ඔහුට සිදුවූ සියල්ල ගැන කල්පනා කරන්න. යෝබ් තිගැස්මෙන් හා සන්ත්‍රාසයෙන් පිරී සිටියි. ඔහුට කළ හැක්කේ වේදනාවෙන් හිඳගෙන සිටීමය.

**ඔහුගේ මිත්‍රයන් නිශ්ශබ්දය.** ඔවුහු ඔහු සමඟ සතියක් පුරා හිඳගෙන සිටිති. ඔවුන් සැබෑවටම සැලකිල්ල දක්වන බව එයින් පෙන්වයි. ඔවුන් කථා කිරීමට උත්සාහ නොකරන අතර ඔවුහු ඔහුගේ වේදනාව හා කඳුළ සමව බෙදාගනිති.

*ඇතැම්විට සියලු මිනිසුන්ට අවශ්‍ය වන්නේ එයයි. යමෙක් ඔවුන් සමග සිටීමට කාලය ගැනීමයි. ඔවුන් සමග හැඬීමට, තුරුළු කරගැනීමට යමෙකු. දෙවියන්වහන්සේගේ ප්‍රේමය පෙන්වීමට හොඳම ක්‍රමය එය වියහැකිය.*

## ඔහුගේ ප්‍රකාශිත වේදනාවට සංවේදී වන්න

මිනිසුන් නොසඟවා කථාකරන විට දුෂ්කර වියහැකිය. ඔවුන්ගේ වේදනා සියල්ල පිටතට වැගිරෙයි. නිවැරදි නොවන බව අප දන්නා දේවල් ඔවුන් පැවසිය හැකිය. ඇතැම්විට ඔවුන් දෙවියන්වහන්සේ කෙරෙහි වාග් ප්‍රහර එල්ල කරනු ඇත. අප ඔවුන් නිවැරදි කිරීම නොව **ඔවුන්ගේ වේදනාවට සංවේදී වියයුතුය.**

### ඔහුගේ අඳුරට සංවේදී වන්න

*යෝබ් 3:3-5*

⊞ හදිසියේම ආලෝකය නැතිව යන කල සියල්ල අඳුරුය. සියල්ල තවදුරටත් එහි තිබුණ ද ඔබට කිසිවක් දැකගත නොහැකිය. යෝබ්ට එසේය. සියල්ල අඳුරුය. සැනසීමක් නැත, සතුටක් නැත, බලාපොරොත්තුවක් නැත. ඇත්තේ වේදනාව පමණී. දෙවියන්වහන්සේ තවමත් වැඩවසන බව ඔහු දන්නේ වුවද, ඔහුට හැකිවන්නේ අඳුරට සංවේදී වීමට පමණී.

යෝබ්ට තවමත් දෙවියන්වහන්සේ කෙරෙහි තම ඇදහිල්ල තිබේ. ඔහු තම උපන් දිනයට සාප කළ ද කිසිදිනෙක දෙවියන්වහන්සේට සාප නොකරනු ඇත. ඒ දවස නොපැමිණියා නම්. ඔහු නූපන්නා නම්! තමාට එය කොතරම් දරුණු දැයි අපට හැඟීම යෝබ්ට අවශ්‍යය.

*යෝබ්ට මෙන් ඔබට අඳුර හැගේ නම් යේසුස්වහන්සේ සිහිපත් කරන්න. දෙවියන්වහන්සේ විසින් අත්හරිනු ලැබූ අවස්ථාවේ උන්වහන්සේ පැය තුනක් කුරුසිය මත දුක්වින්ද සේක. උන්වහන්සේට නිරයේ අඳුර දැණිණි. ඔබ යේසුස්වහන්සේ හඳුනන්නේද? ඔබ වෙනුවට උන්වහන්සේ නිරයේ අඳුර දරාගත් නිසා උන්වහන්සේට ප්‍රශංසා කරන්න.*

### ඔහු මරණයට ආසා වන්නේ කෙසේදැයි සංවේදී වන්න

*යෝබ් 3:20-24, 26*

යෝබ්ට ඇතුළාන්තයෙන් අඳුර හැඟුණ ද සූර්යයා ඔහු මත බබළයි (යෝබ් 3:20). දෙවියන්වහන්සේ ඔහුට මරණයට පත්වීමට ඉඩනොදෙන්නේ ඇයි? තමා මරණයට පත් නොවන පිණිස තමා වටා දෙවියන්වහන්සේ වැටක් දමා ඇති බවක් යෝබ්ට හැඟෙයි. දෙවියන්වහන්සේ ඔහුට වේදනාව සහ කඳුළ දෙන සේක. උන්වහන්සේ යෝබ්ට විවේකය නොදෙන සේක.

මේ අන්ධකාරය කෙළෙස හැඟෙන්නේදැයි අප අවබෝධ කරගැනීම දෙවියන්වහන්සේට අවශ්‍යය. එය බයිබලයේ මෙතැන තිබෙන්නේ එනිසාය. යෝබ්ගේ වේදනාවෙන් යම් ප්‍රමාණයක් අප අවබෝධ කරගැනීම දෙවියන්වහන්සේට අවශ්‍යය.

*ඔබට කෙදිනක හෝ යෝබ්ට මෙන් හැඟුණහොත් ඔබ බලාපොරොත්තුව අත්හැරීම අවශ්‍ය නොවේ. යෝබ් මෙම අඳුරු කාලය තුළින් පැමිණියේය. පැවසීමට තරම් හොඳ දේවල් නොවුවද ඒවා කීමට දෙවියන්වහන්සේ යෝබ්ට මෙන් ඔබට ඉඩහරින සේක. තමාට කුමක් හැඟුණ ද යෝබ් තදින් දෙවියන්වහන්සේ අල්ලාගෙන සිටින බව සිහිතබාගන්න. එසේ ඔබ ද අල්ලාගෙන සිටින්න.*

# 6 උපකාර නොකළ යුතු ආකාරය!

## පසුබිම
යෝබ් 4-5හි එලීපස් කථා කරයි. ඉන්පසු යෝබ් පිළිතුරු දෙයි (යෝබ් 6-7). ඉන්පසු බිල්දද් කථා කරයි, පසුව යෝබ් නැවතත් (යෝබ් 8-10). යෝබ්ගේ තුන්වන මිත්‍රයා ශෝපර් කථා කරන අතර යෝබ් පිළිතුරු දෙයි (යෝබ් 11-14). ඉන්පසු එලීපස් නැවත උත්සාහ කරන අතර රටාව නැවත නැවත යෝබ් 31 පරිච්ඡේදය දක්වා සිදුවෙයි.

එලීපස්, බිල්දද් හා ශෝපර් එකම දේ පවසති. යෝබ් ඉතා නරක දෙයක් කර ඇත. ඔහු මෙතරම් දුක්විඳින්නේ එනිසාය. ඔවුන් සියලුදෙනා උත්සාහ කරන්නේ ඔහු දෙවියන්වහන්සේගෙන් සමාව ඉල්ලා-සිටීමට සැලැස්වීම හා නැවත දෙවියන්-වහන්සේ වෙතට ගෙන ඒමටය. එහෙත් ඔවුන් වැරදි බව අපි දකිමු. යෝබ් නරක නොව යහපත් බව යෝබ් 1-2 පාඨකයන්ට පවසයි. 📖 ***යෝබ් 4-5.***

## ප්‍රධාන කරුණ
කරදරයක වැටී සිටින කෙනෙකුට ඔබ කථා කරන කල පළමුව ඇහුම්කන් දෙන්න. වැරදි බව බයිබලය පෙන්වන ඔබගේම අදහස් නොදෙන්න.

## කිරීමට යමක්
මේ මිතුරන් තිදෙනා යෝබ් පොතෙහි බොහෝ සත්‍යයන් පවසති. ඔවුහු දෙවියන්-වහන්සේ ගැන හා යෝබ් ගැන බොහෝ දේ දනිති (📖යෝබ් 42:7 බලන්න). ඇතැම්-විට ඔවුන් සත්‍ය දේ පැවසුව ද ඒවා යෝබ්ට අදාළ වන්නේ නැත (නිදසුන: 📖 යෝබ් 5:17-18 බලන්න).

එබැවින් අප ප්‍රවේසම් විය යුතුය. **සම්පූර්ණ** යෝබ් පොත දෙවියන්-වහන්සේගේ වචනයය. එහෙත් **ඒ තුළ** මිනිසුන් පවසන බොහෝ දේ වැරදිය. එය හොඳින් තේරුම්ගැනීමට අප විශාල කොටසක් කියවිය යුතුය.

## සටහන්
එලීපස් යෝබ්ට පවසන ප්‍රධාන දේවල් වන්නේ:

- **යෝබ් 4:1-6.** ඔබ අනෙක් මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ වෙතට යොමු කළේය. එහෙත් දැන් මා ඔබ නිවැරදි කළ යුතුය.
- **යෝබ් 4:7-11.** මිනිසුන් විසින් වපුරන ලද කරදර ඔවුන්ම නෙළාගන්නවා මම දුටුවෙමි.
- **යෝබ් 4:12-21.** දෙවියන්වහන්සේ මෙය මට පෙන්වූ සේක: **දෙවියන්-වහන්සේ ඉදිරියේ කිසිවෙකු පවිත්‍ර නැත.**
- **යෝබ් 5:1-7.** අඥානයන් හොඳින් සිටිනවාත් පසුව ඔවුන් මහත් කරදර ඇතිව සිටිනවාත් මම දුටුවෙමි. කරදර පැමිණෙන්නේ වෙන කොතැනින්වත් නොවේ, අප කෙරෙන්මය.
- **යෝබ් 5:8-16.** මාගේ අවවාදය මෙයයි. ඔබගේ ප්‍රශ්න සමඟ අපගේ මහෝත්තම දෙවියන්වහන්සේ වෙතට යන්න.
- **යෝබ් 5:17-27.** ඔබ නිවැරදි කිරීමට දෙවියන්වහන්සේට ඉඩ දී උන්වහන්සේගේ කාරුණික ආශීර්වා-දය නැවත භුක්තිවිඳින්න.

# දේශනා කිරීම: යෝබ් 4-5

## උපකාර නොකළ යුතු ආකාරය

යෝබ්ට උපකාර කිරීමට යෝබ්ගේ මිතුරන්ට සැබවින්ම අවශ්‍ය වුවද **ඔවුන්** සිතන දේ හා **ඔවුන්ට** කීමට ඇති දේ උඩඟුය. පසුව යෝබ්ට කෙසේ හැඟෙනු ඇතිදැයි සිතන්න. එලිපස්ට නොතේරෙන නිසා ඔහුගේ වචන යෝබ්ට වේදනා ගෙන දුන්නේය. හොඳ මිතුරකු වීමට ඔබට අවශ්‍ය නම් එලිපස්ගේ වැරදිවලින් ඉගෙනගන්න.

### 1. ඔබ ඇහුම්කන් දීමට පෙර පිළිතුරු නොදෙන්න.

*යෝබ් 4:2*

යෝබ් පැවසූ සියල්ල වන්නේ “එය බොහෝසේ වේදනා ගෙනදෙන නිසා මට මැරෙන්නට අවශ්‍යය.” සමහරවිට සැබෑ ප්‍රශ්නය කුමක්ද යන්න **යෝබ්** තවමත් තේරුම්ගෙන නැත. යමෙකුගේ අවවාදයට සවන්දීමට ඔහු සූදානම් නැත. තමා සිතන ප්‍රශ්නය කුමක් ද යන්න ඇසීමටත් පිළිතුරු දීමටත් එලිපස්ට ඉතා පහසුය. **එහෙත් සවන්දී නොමැති නිසා ඔහු අඩක් වැරදිය.**

> *සවන්දෙන්න, සවන්දෙන්න, සවන්දෙන්න. ඔබගේ මිත්‍රයාට උපකාර විය හැකි දේ පිළිබඳව යාච්ඤා කරන්න.*

### 2. කාරුණික වන්න

*යෝබ් 4:1-6*

යෝබ් විශාල වේදනාවක සිටියි. එලිපස් මෙය පැවසීමට කාරුණික නැත: “අතීතයේ ඔබ බොහෝ හොඳ අවවාද **දී** ඇත. අවවාද **ලබාගැනීම** පහසු නැත. එහෙමද!”

> *කාරුණික වන්න. ඔවුන්ට සිදුවී ඇති දෙයට ඔවුන් සුදුසු වුවත් කාරුණික වන්න.*

### 3. යටහත් පහත් වන්න

*යෝබ් 5:8*

එය ඉතා පහසු යැයි එලිපස් සිතයි! ඔබ කළ යුත්තේ නැවත දෙවියන්වහන්සේ වෙතට යාමයි. එලිපස් යෝබ්ට ගෞරව කළ යුතුය. මේ සියලු දේවල් **තමාට** සිදුවුවහොත් **තමාට** කෙසේ හැඟෙනු ඇතිදැයි එලිපස් තමාගෙන්ම විමසිය යුතුය!

> *යටහත් පහත් වන්න. පැවසීමට නිවැරදි බයිබල් ඡේදයක් ඔබට තිබුණ ද ප්‍රවේසම් වන්න. එය පහසු හා පැහැදිලි ලෙස ඔබට පෙනිය හැකිය. එහෙත් වේදනාවෙන් සිටින පුද්ගලයා ඔබ නොවේ.*

### 4. එය වරදවා නොගන්න!

*යෝබ් 4:7-8*

එලිපස් කාරුණික හා යටහත් පහත් වුවද **ඔහුට දෙවියන්වහන්සේ ගැන වැරදි අවබෝධයක් තිබෙන බැවින්** ඔහු තවදුරටත් අවවාද නොදිය යුතුය!

- යෝබ් 4:8 නිවැරදිද? යෝබ් 4:7 නිවැරදිද?

එලිපස් **අර්ධ වශයෙන්** නිවැරදිය. දෙවියන්වහන්සේ සාධාරණය. අප නපුර කළහොත් අපි **මේ ජීවිතයේදීම** එය ගෙවන්නෙමු. එසේම යෝබ් 4:7හි ඔහු වැරදිය. බොහෝ නිදොස් මිනිස්සු භයංකර දේවල් විඳිති.

එලිපස් දෙවියන්වහන්සේ පිළිබඳව වැරදි බැවින් ඔහු යෝබ් සම්බන්ධයෙන් වැරදිය. යෝබ්ගේ කරදරවලට හේතුව යෝබ් දෙවියන්වහන්සේට එරෙහිව යාම යැයි එලිපස් සිතයි. ඔහු වැරදිය.

> *අවවාද දීමට පෙර ඔබ හොඳින් බයිබලය අවබෝධ කරගන්න බවට නිසැකවන්න. සවන්දෙන්න, කාරුණික වන්න, යාච්ඤා කරන්න - එසේම උපකාර කරන මෙන් වෙනත් කෙනෙකුගෙන් ඉල්ලාසිටින්න.*

# 7 ඔබ මට පහර දෙන්නේ ඇයි?

### පසුබිම

යෝබ් තම මිතුරු එලිපස් මගින් වේදනාවට සහ භීතියට පත්ව ඇත. නපුරු දෙයක් කර තිබිය හැකි යැයි එලිපස් වරදවා සිතයි. යෝබ්ගේ කරදරවලට වෙන හේතුවක් දැකීමට එලිපස්ට නොහැකිය.

තමාට මහත් වේදනාවක් තිබුණු අතර දැන් ඔහුගේ මිතුරන් ඔහුට එරෙහිවී ඇත. **දෙවියන්වහන්සේ** ඔහුට එරෙහි වූයේ ඇයි? ***යෝබ් 6-7*** (සටහන් උපකාරවනු ඇත.)

### ප්‍රධාන කරුණ

දෙවියන්වහන්සේ හා ඔහුගේ මිතුරන් තමාට එරෙහිවී ඇතිබව යෝබ්ට **හැඟෙයි**. එහෙත් සහතිකවම දෙවියන්වහන්සේ යෝබ්ට එරෙහි **නැත**.

### කිරීමට යමක්

කිතුනුවන්ගෙන් බොහෝදෙනෙක් යෝබ් මෙන් එම වරදම කරති. දෙවියන්වහන්සේ අපට ප්‍රේම කරනවාට වඩා අපට එරෙහි බව අපට **හැඟේ**. තමන්වහන්සේ යෝබ්ට එතරම් කරදර දුන්නේ **ඇයිදැයි** දෙවියන්වහන්සේ කිසිදිනෙක ඔහුට පැවසුවේ නැත. මක්නිසාදයත් යෝබ් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම උන්වහන්සේට අවශ්‍ය නිසාය. අප ද උන්වහන්සේ කෙරෙහි **විශ්වාස කිරීම** දෙවියන්වහන්සේට අවශ්‍යය. අපට නොතේරෙන කල හා අපට උන්වහන්සේට සංවේදී වීමට නොහැකි අවස්ථාවල උන්වහන්සේ තදින් අල්ලාගෙන සිටීම උන්වහන්සේට අවශ්‍යය. මෙය දෙවියන්වහන්සේ කෙරෙහි අපගේ ඇදහිල්ල ශක්තිමත් කිරීමකි. යෝබ් මෙලෙස තදින් දෙවියන්වහන්සේ අල්ලාගත්තේය. දෙවියන්වහන්සේගේ ප්‍රේමය සිහිකරමින් උන්වහන්සේ තදින් අල්ලාගෙන සිටීමට ඔබගේ අසන්නන් හොඳින් ධෛර්යවත් කළ හැකි වන්නේ කෙසේද?

මේ ලෝකයේ අපට කරදර තිබෙන **බවට** යේසුස්වහන්සේ පොරොන්දු වන බව ද සිහි තබාගන්න. මේ කරදරවල වැදගත් බොහෝ හේතු බයිබලය අපට පැහැදිලි කරදෙයි. මේ හේතූන් අප සිහි කළ යුතුය (නිදසුන් යාකොබ් 1:2-4, 2 කොරින්ති 1:3-4, හෙබ්‍රෙව් 12:7-11).

### සටහන්

- **යෝබ් 6:2-7.** "නිසැකවම මට පැමිණිලි කිරීමට ඔබට (මිතුරන්ට) ඉඩ දිය හැකිය."
- **යෝබ් 6:8-13.** "දෙවියන්වහන්ස, කරුණාකර මාගේ ජීවිතය අවසන් කළ මැනව."
- **යෝබ් 6:14-23.** "ඔබ (මිතුරන්) මා බොහෝසේ අධෛර්ය කළේය."
- **යෝබ් 6:24-30.** "මිත්‍රවරුනි, කරුණාකර මා සමඟ අවංක වන්න. මා කළ වරද කුමක්දැයි පැහැදිලිව මට පවසන්න."
- **යෝබ් 7:1-11.** "දෙවියන්වහන්ස, මට අනුකම්පා කරන්න (මා ගැන කනගාටු වන්න)."
- **යෝබ් 7:12-21.** "දෙවියන්වහන්ස, ඔබ මා තනි නොකරන්නේ ඇයි?"

# ➡ දේශනා කිරීම: යෝබ් 6-7

## මිත්‍රවරුනි, මට පහර ගසන්නේ ඇයි? *යෝබ් 6:14*

*හිතෝපදේශ 17:17.* යෝබ් නිවැරදිය. අප වැරදි දේ පවසන කල ද මිතුරන් **සැමවිටම** මිතුරන් විය යුතුය. මිතුරන් අපට පහරදීම නොව පැමිණ උපකාර කිරීම කළ යුතුය.

එලිපස් බොහෝසේ යෝබ් අධෛර්යට පත්කරයි. තම මිතුරන් සැනසීම ගෙනෙනු ඇතැයි යෝබ් බලාපොරොත්තු වුවද ඒ වෙනුවට ඔවුහු ඔහුට බොහෝ වේදනාව ගෙනදෙති. එය ඔබට බොහෝසේ ජලය අවශ්‍ය විටෙක කාන්තාරයක ගමන් කරන්නාක් වැනිය. අවසානයේදී ඔබ දිය කඩිත්තක් වෙත පැමිණෙයි. එහෙත් ඔබ එහි ළඟා වූ කල දිය කඩිත්ත වියළී තිබේ. එය මහත් අධෛර්ය දනවයි (යෝබ් 6:15-21).

*කරදර තුළ සිටින අයට ඔබ සැබෑ මිතුරෙකු වන ලෙස යාච්ඤා කරන්න. එය පහසු නොවේ.*

- ***දෙවියන්වහන්සේගෙන් ප්‍රේමය** අයදින්න. එවිට ඔබ කරුණාවන්ත වනු ඇත. ඔබ ඔබගේ මිතුරන් අධෛර්යට පත් නොකරනු ඇත. ඔවුන්ගේ වේදනාව තුළ දී ප්‍රේමය ඔවුන්ට උපකාර වනු ඇත.*

## දෙවියන්වහන්ස, මට පහර ගසන්නේ ඇයි? *යෝබ් 6:4*

දෙවියන්වහන්සේ තමාට එරෙහිව සිටින සේකැයි යෝබ්ට හැඟෙයි. එය දෙවියන්වහන්සේ කෝපයේ ඊතල ඔහු වෙතට විදින්නා සේය. ඒවායේ විස සිරුර පුරා පැතිර යයි. තමාගේ කලණ මිතුරා තමාට එරෙහි වුයේ ඇයිදැයි ඔහුට තේරුම්ගත නොහැකිය. යෝබ් නිවැරදිද?

සියලුම කරදරවල “ඊතල” පසුපස දෙවියන්වහන්සේ සිටින **බව** අපි දනිමු. එහෙත් දෙවියන්වහන්සේ යෝබ් සමඟ කෝපයෙන් **නොසිටින බව** ද අපි දනිමු! **යෝබ් දෙවියන්වහන්සේගේ ඊතල වරදවා තේරුම් ගනියි.**

*මෙය අපට ඉතා වැදගත්ය. අපට නරක දේවල් සිදුවන්නේ ඇයිදැයි බොහෝවිට අපි නොදනිමු. **එහෙත් දෙවියන්වහන්සේ අපට විරුද්ධ බව ඒවායින් අදහස් නොවේ.** දෙවියන්වහන්සේ අපගෙන් බොහෝ ඈත සිටින බව අපට හැඟුණ ද කරදරවලදී ස්වකීය **සෙනඟ සමඟ** විසීමට දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක. උන්වහන්සේගේ සෙනඟ සඳහා වන පොරොන්දු තදින් අල්ලාගන්න. **යෙසායා 43:1-2***

දෙවියන්වහන්සේ තමාට එරෙහි බව යෝබ් වැරදි ලෙස සිතුව ද ඔහු දෙවියන්වහන්සේට එරෙහි වන්නේ නැත. ඔහු තමාගේ වේදනාවේදී දෙවියන්වහන්සේ වෙතට යයි.

- තමා දෙවියන්වහන්සේට එරෙහිව නොයන පිණිස තම ජීවිතය අවසන් කරන්නැයි යෝබ් දෙවියන්වහන්සේගෙන් ඉල්ලාසිටියි. ***යෝබ් 6:8-10.***
- තමාට කෙතරම් භයංකර ලෙස දැනෙන්නේදැයි යෝබ් දෙවියන්වහන්සේට පවසයි. ඔහුට වේදනාවෙන් නිදහසක් නැත. ***යෝබ් 7:4-5.***
- තමාට තනිව සිටින්නට ඉඩ හරින්නැයි යෝබ් දෙවියන්වහන්සේගෙන් ඉල්ලාසිටියි. “දෙවියන්වහන්සේ මෙතරම් මා දෙස බලාසිටින්නේ ඇයි? මේ සියලු අවධානයන් උන්වහන්සේ මට දෙන්නේ ඇයි?” ***යෝබ් 7:17-20.***

*දෙවියන්වහන්සේ යෝබ් තනිකර දමා නොයන්නට හොඳ හේතුවක් තිබේ. එය දෙවියන්වහන්සේගේ සෙනඟ සියල්ලන්ටම එක හා සමානය. උන්වහන්සේ එතරම් අපට ප්‍රේම කරන සේක. උන්වහන්සේ අපගේ සියලු “කරදර” යහපතට සැලසුම් කරන සේක. එසේම අපගේ වේදනාව තුළින් උන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමට හා උන්වහන්සේට ස්තුති කිරීමට අප පැමිණෙන තෙක් උන්වහන්සේ අප දෙස බලාසිටින සේක. **යෙරෙමියා 29:11.***

## අධ්‍යයනය: යෝබ් 9:14-35

# 8 මා වෙනුවෙන් කථා කිරීමට යමෙක්!

### පසුබිම

යෝබ් 8හි බිල්දාද් යෝබ්ට පිළිතුරු දුන්න ද එලිපස් මෙන් ඔහු එම වැරදිම කරයි. යෝබ් යහපත් දේ කළේ නම් ඔහු දෙවියන්වහන්සේගේ ආශීර්වාදය අත්දකිනු ඇතැයි ඔහු පවසයි. එහෙත් යෝබ් යහපත් දේ කළ අතර මේ සියලු කරදර පැමිණියේය.

තමාට කිසිවෙකු සවන් නොදෙනු ඇතැයි යෝබ්ට හැඟෙයි. දෙවියන්වහන්සේ සැමවිටම නිවැරදි බව ඔහු දන්නේ වුවද දෙවියන්වහන්සේ ඈත සිටින බවක් පෙනෙයි. තමා වෙනුවෙන් දෙවියන්වහන්සේට කථා කිරීමට කෙනෙකු ඔහුට ඕනෑය.

*යෝබ් 9*

### ප්‍රධාන කරුණ

දෙවියන්වහන්සේ තමාට පමණට වඩා ශ්‍රේෂ්ඨ බව යෝබ්ට හැඟෙයි. තමා වෙනුවෙන් දෙවියන්වහන්සේට කථා කිරීමට කෙනෙකු ඔහුට ඕනෑය.

### කිරීමට යමක්

යෝබ් මහත් වේදනාවක සිටින බව සිහිකරන්න. ඔහු පවසන දෙය මිශ්‍ර වුවකි. ඔහු පවසන සමහර දේ නිවැරදිය. සමහර ඒවා නිවැරදි නොවේ. අප ප්‍රශ්න තුළ සිටින කල බොහෝවිට අප ද එසේය.

අප කියවන අතර සැලකිල්ලට ගත යුතු බව මෙයින් අදහස් කෙරේ. යෝබ් වැරදි වුවද යෝබ්ගේ වැරදිවලින් අපට ඉගෙනගත හැකිය.

### සටහන්

- **යෝබ් 9:14-20.** තමා “නිදොස්” බව යෝබ්ට හැඟෙයි. එහෙත් දෙවියන්වහන්සේ අති ශ්‍රේෂ්ඨ බැවින් යෝබ්ට උන්වහන්සේ සමඟ තර්ක කළ නොහැකිය. යෝබ්ට හැකිවන්නේ තමාට අනුකම්පාව (කරුණාව) දක්වන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටීම පමණී. දෙවියන්වහන්සේ තමාට සවන්දෙනු ඇතැයි යෝබ් විශ්වාස නොකරයි. දෙවියන්වහන්සේ යළිත් තමාට පහරදෙනු ඇතැයි ඔහු කල්පනා කරයි (යෝබ් 14:17-18). දෙවියන්වහන්සේ යෝබ්ට වඩා ශක්තිමත්ය.
- **යෝබ් 9:30-31.** වරදකාරීත්වයේ සියලු කැලැල් සේදී යන පිණිස ජලස්නානයක් ගැන යෝබ් කල්පනා කරයි. එහෙත් ඔහු ශුද්ධ දෙවි කෙනෙකු ඉදිරියේ වරදකාරයෙකු වනු ඇත. ඔහු ජරා වලකින් පිටතට පැමිණි කෙනෙකු මෙන් අපිරිසිදුව සිටිනු ඇත.
- **යෝබ් 9:32-35.** දෙවියන්වහන්සේ මනුෂ්‍යයකු නොවන බැවින් යෝබ්ට උන්වහන්සේ සමඟ උසාවියේදී තර්ක කළ නොහැකිය. දෙවියන්වහන්සේ සහ ඔහු අතරට යමෙකු පැමිණීම ඔහුට අවශ්‍යය (“බේරුම්කාරයකු”). දෙවියන්වහන්සේට කථා කිරීමට, දෙවියන්වහන්සේගේ කෝපය ඉවත් කිරීමට ඔහුට කෙනෙකු අවශ්‍යය.

# දේශනා කිරීම: යෝබ් 9:14-35

## දෙවියන්වහන්සේ යෝබ්ට අති ශ්‍රේෂ්ඨය

*යෝබ් 9:14-20*

ඔබ ඔබගේ රටේ නායකයාට පැමිණිලි කළහොත් ඔබට එය කෙසේ හැඟෙනු ඇතිද? ඔබට දැක්වීමට ඉතා වැදගත් කරුණු තිබුණ ද ඔහුට මහත් බලයක් තිබේ. ඔහු කිසිදිනෙක සවන්නොදෙනු ඇතැයි හැඟෙනු ඇත. යෝබ්ට එලෙස හැඟේ.

**දෙවියන්වහන්සේ අති ශ්‍රේෂ්ඨය.** ***යෝබ් 9:4-10.*** දෙවියන්වහන්සේ අති ශ්‍රේෂ්ඨ නිසා යෝබ් උන්වහන්සේට ප්‍රශංසා කරයි. දෙවියන්වහන්සේ ඉතා ශක්තිමත් ලෙස යෝබ්ට හැඟුණ ද තවදුරටත් යෝබ් තම ශ්‍රේෂ්ඨ දෙවියන්වහන්සේට ප්‍රශංසා කරයි.

**දෙවියන්වහන්සේ අතිශුද්ධය.** ***යෝබ් 9:20, 30-31.*** මෙවැනි කරදර විඳීමට වැරදි දෙයක් නොකළ බව යෝබ් දනී. එහෙත් තමා දෙවියන්වහන්සේ ඉදිරියේ පව්කරුවෙකු බව යෝබ් ද දනී. ඔහු මුඛය විවෘත කළ සැණින් පාපය පිටතට පැමිණෙයි.

මෙතෙක් දුරට යෝබ් නිවැරදිය. එහෙත් ඔහු විශාල වරදක් කරයි. දෙවියන්වහන්සේ තමාට එරෙහි බව ඔහු තවමත් සිතයි. දෙවියන්වහන්සේ විශාල නිසා තමාට සවන්නොදෙනු ඇතැයි ඔහු සිතයි. දෙවියන්වහන්සේ සාධාරණ නොවනු ඇතැයි ඔහු සිතයි (මෙය වැරදිය). ***යෝබ් 9:14-18***

*අප දෙවියන්වහන්සේ විශ්වාස කළහොත් උන්වහන්සේ කිසිදිනෙක "පමණට **වඩා ලොකු**" නොවනු ඇත. උන්වහන්සේගේ බලය අපට එරෙහිව නොව අප උදෙසාය. එසේම අප වැරදි කිසිවක් නොකළ විට අප වැරදිකරුවන් ලෙස හැඟීම දෙවියන්වහන්සේ කැමති නොවන සේක. දෙවියන්වහන්සේ සැමවිටම ධර්මිෂ්ඨ, සාධාරණ, යුක්ති සහගත හා කරුණාවන්ත වන සේක. යෝබ්ට දෙවියන්වහන්සේ ගැන භයක් හැඟුණ ද අප දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන කල උන්වහන්සේ තුළ අප **සුරක්ෂිතය**.*

## මා වෙනුවෙන් කථාකිරීමට කෙනෙක්!

*යෝබ් 9:32-35*

තමා උසාවියක සිටින සෙයක් යෝබ්ට හැඟෙයි. ඔහු කිසි වරදක් නොකළ ද "වරදකාරයා" යැයි විනිශ්චයකරුවා පවසයි. දෙවියන්වහන්සේට විරුද්ධව තමාට තර්ක කළ නොහැකි යැයි ඔහුට හැඟෙයි. ඔහු වෙනුවෙන් කථාකිරීමට වෙනත් කෙනෙකු ඔහුට ඕනෑවෙයි. තමාට කරුණාවන්තව් තමාට සවන්දෙන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලාසිටීමට ඔහුට කෙනෙකු ඕනෑය.

නැවතත්, **දෙවියන්වහන්සේ සම්බන්ධයෙන් යෝබ් වැරදිය.** ඇතැම්විට අපි ඒ වරදම කරමු. දෙවියන්වහන්සේ ප්‍රේමයය. යෝබ්ට දෙවියන්වහන්සේට කථාකළ **හැකි** අතර සවන්දීමට දෙවියන්වහන්සේ සතුටුය. දෙවියන්වහන්සේ කරුණාවන්ත කිරීමට යෝබ්ට වෙන කෙනෙකු අවශ්‍ය නොවේ. දෙවියන්වහන්සේ වෙන කෙනෙකුට වැඩියෙන් සවන් නොදෙන සේක.

දෙවියන්වහන්සේ ගැන වැරදි ලෙස යෝබ්ට හැඟුණ ද අප **යේසුස්වහන්සේ වෙතට යොමුකරන** ඔහුගේ වචන සත්‍යය කථා කරයි. අපි අපගේ විනිශ්චයකරුවාණන් වන දෙවියන්වහන්සේ ඉදිරියේ වරදකරුවෝ වෙමු. එබැවින් අප සහ දෙවියන්වහන්සේ අතරට පැමිණීමට යමෙකු අවශ්‍යවේ. අපට කමාවන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලාසිටීමට අපට යේසුස්වහන්සේ අවශ්‍යය. අප වෙනුවෙන් අපගේ වරදකාරීත්වය ගැනීමට ඊටත් වඩා යේසුස්වහන්සේ අපට අවශ්‍යය. උන්වහන්සේ කුරුසිය මත මරණයට පත්වූයේ එනිසාය. ***1 යොහන් 2:1-2***

*අප යේසුස්වහන්සේ විශ්වාස කළහොත් උන්වහන්සේ අප වෙනුවෙන් කථා කරන බැවින් දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා. අප පව් කළ ද "භය නොවන්න, මම ඔබගේ වරද ඉවත් කළෙමි. ඔබට දෙවියන්වහන්සේ සමඟ සමාදානය තිබේ" යැයි යේසුස්වහන්සේ පවසන සේක.*

*ඔබට දෙවියන්වහන්සේගේ ප්‍රේමය **නොදැනෙන** විට මෙය සිහිකරන්න. යේසුස්වහන්සේ ඔබ වෙනුවෙන් කථා කරන අතර පියාණන්වහන්සේ ඔබ කෙරෙහි සිනාසෙන බව සිහිකරන්න.*

# 9 අඳුරු බලාපොරොත්තුව

## පසුබිම

යෝබ්ගේ මිතුරන් සමඟ තර්ක කිරීම් දිගටම සිදුවෙයි. යෝබ් කථා කරන කල වේදනාව සහ මරණය ගැන ඔහු බොහෝසේ පවසයි. දෙවියන්වහන්සේ මේ සියලු කරදර දුන්නේ ඇයිදැයි ඔහුට තේරුම්ගත නොහැකිය. ඇතුළාන්තයේ ඉතා අඳුරු බවක් ඔහුට හැඟෙයි.

එහෙත් ඇතැම්විට ක්ෂණික ආලෝක ධාරාවක් තිබේ. තමාට කුඩා බලාපොරොත්තුවක් දෙන යමක් පිළිබඳව යෝබ් කල්පනා කරයි. ඉන්පසු අඳුර යළිත් පැමිණෙයි. ඔහුට නැවත දුක්බර බව හැඟෙයි.

*යෝබ් 13:15* හා *16:19* හි යෝබ්ගේ බලාපොරොත්තුව බලන්න ("උන්වහන්සේ මා මරා දැමුවත් මම උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.") යෝබ්ට තවමත් අඳුර හැඟෙන බව දැකීමට මෙම පදවලට පෙර හා පසු පද කියවන්න.

## ප්‍රධාන කරුණ

අඳුරුතම අවස්ථාවල වුවද දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල අනාගතය සඳහා බලාපොරොත්තු ගෙනෙයි.

## කිරීමට යමක්

මේ පණිවිඩය **ඉතා කුඩා බලාපොරොත්තුවක්** ඇති යෝබ් වැනි දෙවියන්වහන්සේගේ සෙනඟට උපකාර වනු ඇත. යෝබ් තමාගේ වේදනාවෙන් පිටතට පැමිණියා සේ දේශනා නොකරන්න. යෝබ්ට මෙහිදී පැහැදිලි ඇදහිල්ලක් නැත. ඔහු බලාපොරොත්තු සුන්ව සහ බලාපොරොත්තු රහිතව සිටියි. එහෙත් ඔහු කෙසේ හෝ දෙවියන්වහන්සේ අල්ලාගෙන සිටී. ඔහුට බලාපොරොත්තුවේ ආලෝක ධාරාවක් ලබාදෙන්නේ මෙයයි. අවසානයේදී දෙවියන්වහන්සේ තමාට උපකාර කරනු ඇතැයි ඔහු විශ්වාස කළ යුතුය.

දෙවියන්වහන්සේ යෙරුසලම විනිශ්චය කරන කල යෝබ්ට මෙන් යෙරෙමියාට හැඟෙයි. ***විලාප ගී 3:13-33***

## සටහන්

- **යෝබ් 13:15.** "උන්වහන්සේ මා මරා දැමුවත් මම උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්නෙමි." තමා නිදොස් බව කථාකොට කීමට යෝබ්ට ඕනෑය (යෝබ් 14:13). දෙවියන්වහන්සේ මරණයෙන් ඔහු විනිශ්චය කළද යෝබ් තම විශ්වාසය දෙවියන්වහන්සේ මත තබනු ඇත.
- **යෝබ් 16:19.** දෙවියන්වහන්සේ තමාට විරුද්ධ යැයි යෝබ්ට තවමත් හැඟෙයි (යෝබ් 16:14). දෙවියන්වහන්සේ **පොළොවේදී** ඔහුට සවන්නොදෙනු ඇත. එහෙත් මතු දිනෙක දෙවියන්වහන්සේ යෝබ් වෙනුවෙන් **ස්වර්ගයේදී** ඉදිරිපත් වනු ඇත. යෝබ් වෙනුවෙන් කථා කිරීමට දෙවියන්වහන්සේ ඔහුගේ "මැදිහත්කරුවා" හෝ "සාක්ෂිකරුවා" වනු ඇත. අවසාන දේවල් සාධාරණ වනු ඇත (නැවතත් යෝබ් තමා දන්නවාට වඩා සත්‍යය කථා කරයි. [යෝබ් 9:33හි මෙන්] **යේසුස්වහන්සේ** ස්වර්ගයේදී ස්වකීය සෙනඟ වෙනුවෙන් කථා කරන තැනන්වහන්සේ වූ සේක).

# ➡ දේශනා කිරීම: යෝබ් 13, 16

## බලාපොරොත්තුව, කුමක් සිදුවුවත්

*යෝබ් 13:15*

⊞ ඔබ වනාන්තරයක අතරමං වූයේ යැයි සිතන්න. පසුව ඔබ යමෙකු දකින අතර ඔහු ඔබේ පැරණි සතුරෙකු වෙයි. ඔහු ඔබට ගල්වලින් ගැසුවද ඔබ ඔහු පසුපස යයි. වනාන්තරයෙන් එළියට යාමට ඇති එකම මාර්ගය එයයි.

යෝබ්ට සිදුව ඇත්තේ එවැන්නකි. ඔහුට උපකාර කිරීමට දෙවියන්වහන්සේ හැර වෙන කෙනෙකු නැත. දෙවියන්වහන්සේ තමාට එරෙහි යැයි යෝබ් (වැරදි ලෙස) සිතුව ද දෙවියන්වහන්සේ තවමත් ඔහුගේ එකම බලාපොරොත්තුවයි. යෝබ් කථා කරයි. තමා නිදොස් යැයි පැවසිය යුතු බව ඔහුට හැඟෙයි. එසේම තමාට සවන්දෙන පිණිස ඔහු දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරයි. දෙවියන්වහන්සේ තමාට සාධාරණ යැයි යෝබ්ට නොහැඟෙයි. දෙවියන්වහන්සේ තමාට පහර දෙන බවක් ඔහුට හැඟෙයි. එහෙත් යෝබ්ගේ එකම බලාපොරොත්තුව වන්නේ සාධාරණය ඉටුවීමට දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම පමණි. අවසානයේදී තමා ලජ්ජාවට පත්නොවන පිණිස යෝබ් දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරයි.

» *කුමක් සිදුවුවත් ඔබගේ බලාපොරොත්තුව දෙවියන්වහන්සේ කෙරෙහි තබන්න. ඉතා භයානක දේවල් සිදුවුවත් දෙවියන්වහන්සේව තදින් අල්ලාගන්න. දෙවියන්වහන්සේ ඔබට විරුද්ධ යැයි හැඟුණ ද ඔබට උපකාර ලබන පිණිස දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්න. දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟ කෙරෙන් තමන්වහන්සේගේ ප්‍රේමය කිසි කලෙක ඉවත් නොකරන සේක. ඔබ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන කල උන්වහන්සේ ඔබ පහත **නොහෙළනු** ඇත. ඔබගේ හැඟීම් විශ්වාස නොකරන්න. දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ පොරොන්දු කෙරෙහි විශ්වාස කරන්න.*

## ස්වර්ගයෙහි බලාපොරොත්තුව

*යෝබ් 16:19*

යෝබ්ට කෙතරම් අඳුරු හා දුක්බර බවක් හැඟෙන්නේදැයි කල්පනා කරන්න. දෙවියන්වහන්සේගේ ප්‍රේමය දැකීමට ඔහුට අහිමිවී ඇත. *යෝබ් 16:9-14*

- දැන් යෝබ් දෙවියන්වහන්සේ ගැන සිතන්නේ කුමක්ද?

යෝබ් කොපමණ වැරදිදැයි අපට දැකිය හැකිය. ඇදහිලිවන්තයකු මෙවැනි දේ පවසන්නේ නම් අපට කලබල බවක් හැඟිය හැකිය. එහෙත් ඇතැම්විට දෙවියන්වහන්සේගේ සෙනඟට මෙසේ අඳුරු හා දොම්නස් සහිත බවක් හැඟෙනු ඇත. ඇතැම්විට මිනිසුන් රෝගාතුර වන බැවින් ඔවුන්ට දැකිය හැකි වන්නේ නරක දේවල් පමණි.

එහෙත් යෝබ්ගේ වේදනාවේදී ආලෝක ධාරාවක් පැමිණෙයි. යෝබ් දෙවියන්වහන්සේ ගැන කල්පනා කරන අතර අවසානයේදී දෙවියන්වහන්සේ සාධාරණ විය යුතු බව ඔහු දනී. දෙවියන්වහන්සේ **දැන්** ඔහුට සවන්නොදෙනු ඇතැයි හැඟෙන්නා සේය. එබැවින් තමා මරණයට පත්වූ පසු දෙවියන්වහන්සේ හමුවන කල උන්වහන්සේ තමාට සවන්දෙනු ඇතැයි යෝබ් සිතයි. යෝබ් ස්වර්ගයේ උසාවියක් ගැන කල්පනා කරයි. උසාවියේදී යෝබ් වෙනුවෙන් කථා කරන කෙනෙක් සිටී. එසේම ඒ තැනැත්තා දෙවියන්වහන්සේය. යෝබ් නිවැරදිය. **යේසුස්වහන්සේ** ස්වකීය සෙනඟ උදෙසා කථා කරන සේක.

» ***දැන්** බොහෝ දේ අසාධාරණය. එහෙත් යම් දිනෙක සියල්ල සාධාරණ වනු ඇත. එසේම අප දෙවියන්වහන්සේ හඳුනන්නේ නම් අප වෙනුවෙන් ස්වර්ගයේ යමෙකු කථා කරනු ඇත. "ඔවුන්ගේ පව් වෙනුවෙන් මම මරණයට පත්වුණෙමි. ඔවුන්ට දෙවියන්වහන්සේ සමග සමාදානය තිබේ" යැයි **යේසුස්වහන්සේ** පවසනු ඇත. **දැන්** සියල්ල නිවැරදි වනු ඇතැයි දෙවියන්වහන්සේ පොරොන්දු නොවන සේක. එහෙත් ස්වර්ගයේදී යේසුස්වහන්සේ තමන්වහන්සේ ප්‍රේමකරන සෙනඟ වෙනුවෙන් කථා කරනු ඇත. උන්වහන්සේ සියල්ල නිවැරදි කරනු ඇත.*

# 10 මාගේ මිදුම්කරුවාණෝ!

### පසුබිම
යෝබ්ගේ "අඳුරු බලාපොරොත්තුව" පිළිබඳව මෙය තවත් නිදසුනකි. සියලුදෙනා ඔහුට විරුද්ධය. මහත් බලාපොරොත්තු රහිත හා අඳුරු බවක් ඔහුට හැඟෙයි. ඉන්පසු සිය අන්ධකාරයේදී යෝබ්ට බලාපොරොත්තුවේ ආලෝකයක් තිබේ. මෙය ඔහු සම්පූර්ණ බලාපොරොත්තු රහිත භාවයෙන් ගලවා ගනී. එහෙත් ඔහුගේ දුක්ඛිත හැඟීම් ඉක්මනින් නැවත පැමිණේ. ආලෝක ධාරාවට පසුව අඳුර පැමිණෙයි. *යෝබ් 19:20-27*

### ප්‍රධාන කරුණ
යෝබ් තම මිදුම්කරුවාණන්, දෙවියන්වහන්සේ තුළ බලාපොරොත්තු තබයි. මරණයෙන් පසු යෝබ් දෙවියන්වහන්සේ දකිනු ඇත.

### කිරීමට යමක්
මේ කොටස සම්බන්ධයෙන් ප්‍රවේසම් වන්න. එයින් සමහරක් හෙබ්‍රෙව් භාෂාවෙන් පරිවර්තනය කිරීම අසීරුය. පරණ ගිවිසුම තුළ ද මිනිස්සු තමන්ට තේරෙනවාට වඩා යමක් පවසති. යෝබ් යේසුස්වහන්සේ වෙතට හා උත්ථානය වෙත යොමුකරන්නේ කෙසේදැයි **දැන් අපට** දැකිම පහසුය. යෝබ් මේ දේවල් කෙතරම් පැහැදිලිව දුටුවේදැයි අපි නොදනිමු. අප දන්නේ:

- තමා ගළවන ලෙස යෝබ් තම මිදුම්කරුවාණන් වන දෙවියන්වහන්සේ තුළ බලාපොරොත්තු තබයි.
- මරණයෙන් පසු තමා දෙවියන්වහන්සේ දකින බව යෝබ් දනී.

### සටහන්
- **යෝබ් 19:23-24.** යෝබ්ගේ මිතුරන් අසාධාරණය. යෝබ් පව් කළ බව ඔවුහු පවසති. ඔවුන් යෝබ් විශ්වාස නොකරනු ඇත. එනිසා තමාගේ වචන ලියා තැබීම යෝබ්ට අවශ්‍යය. කිසිවෙකුට මකා දැමිය නොහැකිවන පිණිස ඒවා පර්වතයක කොටා තැබීම ඔහුට අවශ්‍යය. මේ, මිනිසුන් සත්‍යය දැනගන්න පිණිසය. තමා නිදොස් බව සෙනඟ දැනගැනීම යෝබ්ට ඕනෑය (යෝබ්ට අවශ්‍ය දෙය දෙවියන්වහන්සේ ඔහුට දුන්සේක. ඔහුගේ වචන බයිබලයේ ඇත).
- **යෝබ් 19:25.** "මාගේ මිදුම්කරුවාණෝ ජීවත්වන බව මම දනිමි." "මිදුම්කරුවා" යනු සෙනඟ නිදහස් කරන පිණිස මිලයක් ගෙවන තැනැත්තාය. තමා "මුදාගැනීමට" යෝබ් දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු තබයි. ස්වර්ගයේදී දෙවියන්වහන්සේ ඔහු වෙනුවෙන් කථා කරනු ඇත. දෙවියන්වහන්සේ යෝබ්ගේ කරදර අවසන් කරනු ඇත.
- **යෝබ් 19:26-27.** තමා මරණයට පත්වූ පසු දෙවියන්වහන්සේ දැකීමට යෝබ් බලාපොරොත්තු වෙයි. මරණයෙන් පසු සැබෑ ශරීරයක් සහ සැබෑ ඇස් ඇති සැබෑ මනුෂ්‍යයෙකු වීමට යෝබ් බලාපොරොත්තු වෙයි. (යෝබ් මළවුන් කෙරෙන් නැගිටින බව අපි දනිමු. ස්වර්ගය සඳහා සුදානම් වූ පරිපූර්ණ ශරීරයක් ඔහුට ලැබෙනු ඇත.)

# ➡ දේශනා කිරීම: යෝබ් 19:23-27

## මාගේ මිදුම්කරුවාණෝ!

*යෝබ් 19:25*

**1. බලාපොරොත්තුව පැමිණෙන්නේ අපගේ දෙවියන්වහන්සේ කවුදැයි අප කල්පනා කරන විටය.**

යෝබ් **තම කරදර** දෙස බලනවිට ඔහුට බලාපොරොත්තුවක් නැත. යෝබ්ගේ **මිතුරන්** ඔහුට කිසි බලාපොරොත්තුවක් දෙන්නේ නැත. එහෙත් **දෙවියන්වහන්සේ කවුදැයි** යෝබ් කල්පනා කරන කල ඔහුට බලාපොරොත්තුවක් තිබේ. දෙවියන්වහන්සේ වෙනස් නොවන සේක. දෙවියන්වහන්සේ සාධාරණ හා ප්‍රේමණීය වන අතර උපකාරය ලැබීම සඳහා කරන අපගේ මොරගැසීම්වලට පිළිතුරු දෙනසේක. දෙවියන්වහන්සේගේ ප්‍රේමය හා සැලකිල්ල දැන් යෝබ්ට නො**හැඟුණ** ද උපකාර ලැබීම සඳහා ඔහු තවදුරටත් "මාගේ මිඳුම්කරුවාණෝ" කෙරෙහි විශ්වාස කරයි. අවසානයේ දී දෙවියන්වහන්සේ තමා මුදාගනු (බේරාගනු) **ඇතැයි** ඔහුට නිසැකය.

*» අඳුරු හා බලාපොරොත්තු රහිත භාවයක් හැඟෙන විට **ඔබගේ දෙවියන්වහන්සේ කවුදැයි සිහිකරන්න**. උන්වහන්සේගේ ප්‍රේමය සදාකාලයටම පවතී (යෙරෙමියා 31:3). තමන්වහන්සේගේ සෙනග තමන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන කල දෙවියන්වහන්සේ ඔවුන්ට උපකාර කරනු **ඇත**. දෙවියන්වහන්සේ ගැළවුම්කාර දෙවියන්වහන්සේ බැවින් උන්වහන්සේ ගැළවිය යුතුමය. ඔබ මරණයට පත්වන විට වුවද ඔබගේ මිදුම්කාර දෙවියන්වහන්සේ ජීවත්වන බැවින් ඔබ උන්වහන්සේ තුළ සුරක්ෂිතය.*

**2. අපගේ යේසුස්වහන්සේ කවුදැයි ඔබ සිහිකරන කල බලාපොරොත්තුව පැමිණේ.**

යෝබ්ගේ වචන අප ගැළවුම්කාර **යේසුස්වහන්සේ** වෙතට යොමුකරයි. යෝබ් මෙය නොදැකිනවා වුවද අපට අපගේ මිදුම්කරුවාණන් කුරුසිය මත දැකිය හැකිය. උන්වහන්සේ ස්වකීය සෙනඟ වෙනුවෙන් මරණයට පත්වූ නිසා උන්වහන්සේ ඔවුන්ට කෙතරම් ප්‍රේම කරන සේක්දැයි අපට දැකගත හැකිය.

*» ඔබ ගළවාගැනීමට යේසුස්වහන්සේ මරණයට පත්වූසේක් නම් දැන් උන්වහන්සේ ඔබ අතහැර දමනු ඇතිද? එය විය නොහැකිය. ඔබට අඳුරු බවක් හැඟුණ ද ඔබ දෙස නොබලන්න. යේසුස්වහන්සේ දෙස බලන්න. ඔබගේ මිදුම්කරුවාණන් කෙරෙහි බලාපොරොත්තු වන්න. උන්වහන්සේ ඔබ වෙනුවෙන් ස්වර්ගයේ ජීවත්වන සේක (හෙබ්‍රෙව් 7:25).*

## මරණයෙන් පසු මාගේ ජීවිතය

*යෝබ් 19:26-27*

යෝබ්ගේ මිදුම්කරුවාණන් ජීවත්වන්නේ නම් යෝබ් ද ජීවත්විය යුතුය. තමා ඉක්මනින් මරණයට පත්වනු ඇතැයි යෝබ් සිතුව ද මරණය අවසානය නොවේ. දෙවියන්වහන්සේ ඔහුගේ මිදුම්කරුවාණන් නම් සදාකාලයටම තමන්වහන්සේ වෙතින් වෙන්වීමට දෙවියන්වහන්සේ යෝබ්ට ඉඩනොදෙනු ඇත. එබැවින් තම මරණයෙන් **පසු** තමා ජීවත්වන බව යෝබ්ට නිසැකය. ඔහු දැන් මහත් කරදරයක සිටිය ද, මතු දිනෙක දෙවියන්වහන්සේ දකිනු ඇත. එය කෙතරම් අගනා සිතුවිල්ලක් ද!

යෝබ් දුරක සිට දුටුවේ කුමක්දැයි අලුත් ගිවිසුම පැහැදිලිව අපට පවසයි. මිදුම්කරුවාණන් වන යේසුස්වහන්සේ යළි වඩිනු ඇත. දෙවියන්වහන්සේ සියලුදෙනා මළවුන් කෙරෙන් නැගිටුවනු ඇත. යේසුස්වහන්සේ ඇදහිලිවතුන් තමන්වහන්සේ සමඟ ගෙනයනවා ඇත. යේසුස්වහන්සේ සිටින අයුරින්ම ඔවුන් උන්වහන්සේ දකිනවා ඇත. ඔවුන් උන්වහන්සේ වාගේ වෙනවා ඇත. සදාකාලයටම දෙවියන්වහන්සේ භුක්තිවිඳින පිණිස ඔවුන් අලුත් ශරීර ලබනවා ඇත. *1 යොහන් 3:2*

*» ඔබගේ මිදුම්කරුවාණන් ලෙස ඔබ යේසුස්වහන්සේ නොහඳුනන්නේ නම් ඔබට බලාපොරොත්තුවක් නැත. ඔබ දැන් කරදර තුළ සිටිය ද වඩාත් භයානක කරදර පැමිණෙන්නට තිබේ. දැන්ම යේසුස්වහන්සේ වෙතට යන්න.*

*ඔබගේ මිදුම්කරුවාණන් ලෙස ඔබ යේසුස්වහන්සේ හඳුනන්නේ නම් ඔබට මහත් බලාපොරොත්තුවක් තිබේ. දැන් ඔබගේ විශාල කරදර සැබවින්ම කුඩා දෙයකි. ඉක්මනින්ම යේසුස්වහන්සේ ඔබ උදෙසා පැමිණෙනවා ඇත. ඔබගේ සියලු වේදනාවන් අවසන් වනු ඇත. අත්නොහරින්න. ඔබගේ පුනර්ජීවනය කෙරෙහි බලාපොරොත්තු තබාගන්න. **1 තෙසලෝනික 4:16-18***

## අධ්‍යයනය: යෝබ් 23:1-12

# 11 දෙවියන්වහන්සේට හොඳ හේතුන් තිබේ!

**පසුබිම**

යෝබ්ගේ මිතුරන් සමහර විශාල පාප පිළිබඳව අඛණ්ඩව යෝබ්ට චෝදනා කරයි. නැවත දෙවියන්වහන්සේ වෙතට හැරෙන්නැයි ඔවුහු ඔහුට පවසති. එවිට දෙවියන්වහන්සේ යෝබ්ට ආශිර්වාද කරනු ඇතැයි ඔවුහු කියති. ***යෝබ් 22:21-26***

ඔහු පව් නොකළ කල්හි දෙවියන්වහන්සේ ඔහු අත්හළ බවක් පෙනෙයි. යෝබ් දෙවියන්වහන්සේට මොරගැසුව ද දෙවියන්-වහන්සේ පිළිතුරු නොදෙන සේක. යෝබ්ගේ ලොකුම වේදනාව ඔහුට දෙවියන්වහන්සේ සොයාගත නොහැකි වීමයි. **යෝබ් 23:1-12.**

යෝබ් සිය වේදනාවේදී එයට දෙවියන්-වහන්සේට හේතුවක් තිබෙන බව ඔහු දනී. ***යෝබ් 23:10.***

**ප්‍රධාන කරුණ**

දෙවියන්වහන්සේ ඇත සිටින බව හැඟුණ ද උන්වහන්සේ විශ්වාස කරන්න. අපගේ දුක්විඳීම්වලට උන්වහන්සේට හොඳ හේතු තිබේ.

**කිරීමට යමක්**

බොහෝවිට කිතුනුවෝ තම දුක්විඳීම්වලදී **වැරදි** කරති. ඔවුන් යාච්ඤා කිරීම නතර කරනු ඇත. ඔවුන් දෙවියන්වහන්සේ වෙතින් ඉවතට හැරෙනවා ඇත. ඔවුහු බලාපොරොත්තු රහිත තත්වයට පත්වන අතර සියදිවි හානිකර ගැනීමට ද උත්සාහ කරති. ඔවුන් බොහෝසේ මත්පැන් පානය කරනු ඇත. දෙවියන්වහන්සේ පිළිතුරු නොදෙන විට **නිවැරදි දේ** කිරීමට යෝබ් අපට උපකාර කරයි. යෝබ්ගෙන් ඉගෙනගැනීමට ඔබගේ අසන්නන්ට උපකාර කරන්න. දරුණු කරදරයකදී වුවද ඔහු කිසිවිටෙක අත්නොහැරියේය. ඒ වෙනුවට තම වේදනාවට දෙවියන්වහන්සේට හේතු තිබෙන බව ඔහු විශ්වාස කළේය. එයින් යහපත් දේවල් පැමිණෙනු ඇත.

**සටහන්**

- **යෝබ් 23:4-7.** දෙවියන්වහන්සේ සොයාගැනීමට යෝබ්ට අවශ්‍ය ඇයිද යන්නට මෙය එක් හේතුවක් පෙන්වයි. මේ දුක්විඳීමට තමා සුදුසු නැතැයි යෝබ් දෙවියන්වහන්සේට පවසනු ඇත. දෙවියන්වහන්සේ තමාට සවන්-දෙනු ඇතැයි යෝබ් කලින් සිතුවේ නැත (යෝබ් 9:14-20). දෙවියන්-වහන්සේ තමාට සාධාරණ වනු ඇතැයි දැන් ඔහු සිතයි.
- **යෝබ් 23:10.** "උන්වහන්සේ මා පරීක්ෂා කළ කල්හි මම රන් මෙන් නික්ම එන්නෙමි." (මෙය නිවැරදි පරිවර්තනයයි) යහපත් හේතුන් සඳහා රත්‍රන් ගින්දර මැදින් යන බව යෝබ් සිහිකරයි. අතීතයේ සිය කරදර දෙස බලා ඒ කෙරෙන් යහපත් දේ පැමිණෙනු ඇතැයි යෝබ් දකියි.
- **යෝබ් 23:11-12.** යෝබ්ට තම ජීවිතය ගැන කිව හැකිය. මෙය සැබෑ බව දෙවියන්වහන්සේ දකිනු ඇතැයි ඔහුට හැඟෙයි. ඔහු නිදොස් බව දෙවියන්-වහන්සේ දකිනු ඇත (මේ නපුරු දේවල් ලැබීමට ඔහු සුදුසු නොවේ).

# ➡ දේශනා කිරීම: යෝබ් 23:1-12

## දෙවියන්වහන්සේ කොහිද?

*යෝබ් 23:3*

කරදර පැමිණෙන කල සමහර මිනිස්සු දෙවියන්වහන්සේ වෙතින් ඉවතට හැරෙති. ඔවුහු දෙවියන්වහන්සේ නැතිව ජීවිතය ජයගැනීමට උත්සාහ කරති. යෝබ් එසේ නොවේ. තමාට **දෙවියන්වහන්සේ සිටිය යුතුම බව** ඔහු දනී. දෙවියන්වහන්සේ නැතිව යෝබ්ට ජීවත්විය නොහැකිය.

එහෙත් යෝබ්ට දෙවියන්වහන්සේ සොයා-ගත නොහැකිය. ඔහු දෙවියන්වහන්සේට මොරගැසුවද දෙවියන්වහන්සේ නිශ්ශබ්දය.

⊞ යමක් නැතිවූ විට ඔබ එය සැමතැනම සොයන්නේය. ඔබ එය සොයාගන්නා තුරු වෙන කිසිවක් කරන්නේ නැත. යෝබ් ඒ වාගේය. ***යෝබ් 23:8-9.*** (අවසානයේදී දෙවියන්වහන්සේ යෝබ් වෙත පැමිණෙන සේක. යෝබ් 38:1)

*ඔබ යෝබ් වාගේද? දෙවියන්වහන්සේ නැතිව ඔබට ජීවත් විය නොහැකිය. අත්නොහරින්න. උන්වහන්සේ හමුවන තුරු සොයන්න. යේසුස්-වහන්සේ පොරොන්දු වූ දේ සිහිකරන්න.* ***මතෙව් 7:7-8.***

## දෙවියන්වහන්සේට හොඳ හේතු තිබේ

*යෝබ් 23:10*

- ඔබට දෙවියන්වහන්සේ සොයාගත නොහැකි විට **උන්වහන්සේට ඔබ නැතිවී නැති බව** සිහිකරන්න.
- ඔබට කිසිවක් නොතේරෙන විට **දෙවියන්වහන්සේ සියල්ල දන්නා බව** සිහිකරන්න.

නරක දේවල් අපට සිදුවන්නේ **ඇයිදැයි** අප නොදකින විට අසීරු විය හැකිය. එය අප තුළ හැඟීමක් ඇතිකරන්නේ නැත. දෙවියන්වහන්සේ දන්නා සේක් නම් අප දැනගැනීම **අවශ්‍ය වන්නේ නැත**. අපගේ කරදරවලට දෙවියන්වහන්සේට හොඳ හේතුවක් තිබේ. අප කළ යුත්තේ අපගේ අත දෙවියන්වහන්සේගේ අත මත තැබීමය. උන්වහන්සේ අප අන්ධකාරය තුළින් ගෙන යනවා ඇත.

මේ නිශ්චිත දෙය දෙවියන්වහන්සේ කළේ ඇයිදැයි අප නොදන්නවා වුවද කරදරවලට **හොඳ හේතු කිහිපයක්** දෙවියන්වහන්සේ **අපට පවසන සේක**. අප යෝබ් මෙන් වී දෙවියන්වහන්සේගේ හේතු සිහිකළ යුතුය. ***යෝබ් 23:10.*** (සටහන්-වල තිබෙන පරිවර්තනය බලන්න)

- **දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ "රත්‍රන්"** (උන්වහන්සේගේ අනර්ඝ සෙනඟ) **සැබෑ බව පෙන්වීමට පරීක්ෂා කරන සේක.** ඇතැම් මිනිස්සු කරදර පැමිණෙන තෙක් කිතුනුවන් මෙන් පෙනී සිටිති. එහෙත් යෝබ් එසේ නොවන බව අපි දනිමු. ඔහු සැබෑ රත්‍රන් වූයේය. ගින්නට නියම රත්‍රන් වෙනස් කළ නොහැකිය. එසේම කරදරවලට සැබෑ කිතුනුවන්ට රිදවිය නොහැකිය. **එය ඔවුන් නියම සහ සැබෑ අය බව පමණක් ඔප්පුකරයි.** ***1 පේත්‍රුස් 1:6-7.***
- **දෙවියන්වහන්සේ තමන්වහන්සෙගේ "රත්‍රන්" පිරිසිදු කරන පිණිස පරීක්ෂා කරන සේක.** ගින්න රත්‍රන් වඩාත් හොඳ කරයි. දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟ පිරිසිදු කරන පිණිස කරදර භාවිත කරන සේක. ***රෝම 5:3-4.***

*දෙවියන්වහන්සේ බොහෝ ඈත සිටින බවක් හැඟුණ ද ඔබගේ කරදරවලට **උන්වහන්සේට හොඳ හේතු තිබෙන බව** සිහි තබාගන්න. **ඔබගේ ඇදහිල්ල කොපමණ සැබෑ ද** යන්න මිනිසුන් දැකීම උන්වහන්සේට අවශ්‍යය. එසේම **ඔබ පවිත්‍ර කරන්නට** උන්වහන්සේට ඕනෑය. ඔබට මේ දේවල් අවශ්‍යද?*

*උන්වහන්සේගේ මේ ප්‍රේමයේ දීමනාව වන වේදනාව පිළිගැනීමට දෙවියන්වහන්සේගේ උපකාරය ඉල්ලා යාච්ඤා කරන්න. එයට එරෙහිව සටන් නොකර ඒ තුළින් ගෙනයන පිණිස දෙවියන්වහන්සේ විශ්වාස කරන්න.* ***යාකොබ් 1:12***

# 12 ප්‍රඥාව කොහිද?

**පසුබිම**

යෝබ් සහ ඔහුගේ මිතුරෝ තිදෙනා දිගු කාලයක් තර්ක කළෝය. අන්තිමේදී මිතුරෝ තිදෙනා අවසන් කළෝය. එහෙත් ඔවුන් යෝබ්ට උදව් කළේ නැත. එහි බොහෝ වචන තිබුණ ද ප්‍රඥාව තිබුණේ සුළු වශයෙනි.

යෝබ් 28 වෙනස්ය. එය අසීරු තර්කයක් නොවේ. යෝබ් තමාගේ වේදනාව ගැන කථා නොකරයි. ඒ වෙනුවට ප්‍රඥාව ගැන බුද්ධිමත් වචන කිහිපයක් යෝබ් අපට දෙයි.

*යෝබ් 28*

**ප්‍රධාන කරුණ**

ඔබ ස්වාමින්වහන්සේට භය වන (ගෞරව කරන) කල ඔබට ප්‍රඥාව ලැබේ.

**කිරීමට යමක්**

ප්‍රඥාව **අප දන්නා දේ** පිළිබඳව නොවේ. එය **අප හඳුනන්නේ කවුද** සහ **අප ජීවත් වන්නේ කෙසේද** යන්න පිළිබඳවය. යෝබ් 28 විශේෂයෙන් කරදර සහිත කාලවලදී වැදගත්ය. අපගේ සියලු ප්‍රශ්නවලට අප පිළිතුරු දිය යුතු නැත. දෙවියන්වහන්සේ දුෂ්කර කාලයන් අප වෙත ගෙන ආවේ **ඇයිදැයි** අප දැනගැනීම අවශ්‍ය නොවේ. අප අඛණ්ඩව දෙවියන්වහන්සේට ගෞරව **කරමින්** උන්වහන්සේ උදෙසා ජීවත්විය යුතුය. යෝබ් 28:28 ඉගෙනගැනීමට හා මතක තබාගැනීමට උත්සාහ කරන්න.

පව්කරුවන් උදෙසාවූ යේසුස්වහන්සේගේ මරණය තුළ අපි දෙවියන්වහන්සේගේ ප්‍රඥාව හොඳින් දකිමු. මෙය බොහෝ මිනිසුන්ට මෝඩකමක්ව පෙණුණ ද කුරුසිය අපට දෙවියන්වහන්සේ හඳුනාගත හැකි ස්ථානයයි. කුරුසිය අප බුද්ධිමත් ජීවිතයක් ආරම්භ කරන ස්ථානයයි. *1 කොරින්ති 1:22-24, කොලොස්සි 2:3.*

**සටහන්**

- **යෝබ් 28:1-11.** රිදී, රත්‍රන් සහ අනර්ඝ ගල් මිනිසාට සොයාගත හැකිය. වටිනා වස්තු සොයාගැනීමට මිනිසා පොළොවේ ගැඹුරු කොටස් සෝදිසි කරයි.
- **යෝබ් 28:12-19.** එහෙත් මිනිසාට ප්‍රඥාව සොයාගත නොහැකිය. ඔහුට ප්‍රඥාව රත්‍රන්වලින් මිල දී ගත නොහැකිය. ප්‍රඥාව සියල්ලට වඩා වටින්නේය.
- **යෝබ් 28:20-28.** ප්‍රඥාව පැමිණෙන්නේ කොතැන්හි සිට ද? දෙවියන්වහන්සේ හැර කිසිවෙකු දන්නේ නැත (යෝබ් 28:23). එසේම ප්‍රඥාව සොයාගත යුත්තේ කොතැනින්දැයි දෙවියන්වහන්සේ මිනිසාට වදාළ සේක (යෝබ් 28:28). ඔබ දෙවියන්වහන්සේට භය වන (ගෞරවය, විශාල ගරු බුහුමන්, නමස්කාරය දක්වන) කල ඔබ ප්‍රඥාව සොයා ගනී. වැරදි දේවලින් හැරෙන කල ඔබ ප්‍රඥාව සොයා ගනී.

# දේශනා කිරීම: යෝබ් 28

## මිනිසාට ප්‍රඥාව සොයාගත නොහැකිය

දේවල් සොයාගැනීමේ දී මිනිසා ඉතා හොඳය. වසර දහස් ගණනකට පෙර යෝබ් ජීවත්ව සිටි කාලයේ ගැඹුරු පතල්වලින් රත්‍රන් හා අනර්ඝ ගල් සොයාගැනීමට මිනිසාට හැකි විය. ***යෝබ් 28:10-11*** *[සැඟවී තිබෙන වස්තූන් සොයා ගැනීමට අන්වීක්ෂය වැනි විද්‍යුත්මක උපකරණ අද අපට උපකාර වන්නේ කෙසේදැයි නිදසුන් දෙන්න].*

එහෙත් මිනිසාට ප්‍රඥාව සොයාගත නොහැකිය. ***යෝබ් 28:12-15.***

- ප්‍රඥාව රත්‍රන්වලට වඩා වටින්නේ ඇයි?
- ප්‍රඥාව සොයාගැනීමට මිනිසාට අසීරු ඇයි?

සියලු අසීරු ප්‍රශ්නවලට පිළිතුරු සොයාගැනීමට මිනිසාට අවශ්‍ය වුවද දෙවියන්වහන්සේ පිළිතුරු සඟවන සේක. අපගේ සියලු දෙයම දැනගැනීමට දෙවියන්වහන්සේට අවශ්‍ය නොවේ. බොහෝ දේ දෙවියන්වහන්සේගේ දැනගැනීම සඳහා පමණී. ***ද්විතීය කථාව 29:29.***

යෝබ් සහ ඔහුගේ මිතුරෝ දිගු කලක් තර්ක කරති. එහෙත් යෝබ් තවමත් දුක්විඳින්නේ ඇයිදැයි ඔවුන්ට නොතේරේ. ඔවුහු පිළිතුරු සොයති. එහෙත් ඔවුන්ට ප්‍රඥාව හමුවී නැත. ප්‍රඥාව ලබාගන්නේ කෙසේදැයි යෝබ් 28 පෙන්වනු ඇත.

## දෙවියන්වහන්සේ අපට ප්‍රඥාව පෙන්වන සේක

***යෝබ් 28:20, 23, 28***

⊞ ඔබ යම් දෙයක් පැය ගණනාවක් සොයයි. ඔබට එය කොතැනකවත් සොයාගත නොහැකිය. එය ඔබගේ සාක්කුවේ තිබුණු බව ඔබ අවබෝධ කරගනියි.

අප නිවැරදි ස්ථානයේ සොයන්නේ නම් ප්‍රඥාව සොයාගැනීම දුෂ්කර දෙයක් නොවේ. අප දුෂ්කර ප්‍රශ්න රාශියක් ඇසීම අවශ්‍ය නොවේ. අවශ්‍ය වන්නේ **දෙවියන්වහන්සේගෙන්** ප්‍රඥාව ඉල්ලාසිටීම පමණී (යාකොබ් 1:5).

**එසේම යෝබ්ට දැනටමත් මේ ප්‍රඥාව තිබිණි.** ***යෝබ් 1:1, 28:28.***

- යෝබ්ට තමාගේ වේදනාවේදී ප්‍රඥාවන්ත වියහැකි වන්නේ කෙසේද?

තමාට මෙය කළේ **ඇයිදැයි** අසන්නට යෝබ්ට අවශ්‍ය නැත. යෝබ්ට අවශ්‍ය වන්නේ පෙර ලෙස දෙවියන්වහන්සේ විශ්වාස කර උන්වහන්සේ උදෙසා ජීවත්වීම පමණී. ප්‍රඥාව මෙයයි.

**ප්‍රඥාව යනු ඇයිදැයි දැනගැනීම නොවේ. ප්‍රඥාව යනු දෙවියන්වහන්සේ හඳුනාගැනීමයි.**

⊳ *යෝබ් බලන්නේ තමාගේ වේදනාව දෙස නොව ජීවත්වීමට ප්‍රඥාවන්ත මාර්ගය වන තමාගේ දෙවියන්වහන්සේ දෙසය. ඔබට කරදර තිබෙන විට යෝබ් 28:28 සිහිකරන්න. යෝබ්ට අවශ්‍ය වන්නේ කරදර පැමිණීමට පෙර කළා සේ දෙවියන්වහන්සේ විශ්වාස කිරීම හා උන්වහන්සේට ගෞරව කිරීම පමණී. අපි ද එසේ කරමු. දෙවියන්වහන්සේට **ගෞරව කිරීම** සහ වැරදි සිතුවිලිවලට හා ක්‍රියාවන්ට **බැහැයි කීම** දිගටම කරගෙන යන්න. ප්‍රඥාව මෙයයි.*

ප්‍රඥාව ලෝකයේ තිබෙන වටිනාම දෙයයි. දෙවියන්වහන්සේ ඔබට ජීවත්වීමේ ප්‍රඥාවන්ත මාර්ගය පෙන්වා තිබේ නම් උන්වහන්සේට ප්‍රශංසා වේවා. බොහෝ මිනිසුන් වැරදි ස්ථානයේ සොයා බැලුව ද සැබෑ ප්‍රඥාව සොයාගන්නේ කොතැනින්දැයි දෙවියන්වහන්සේ අපට පෙන්වා ඇත. ඒ ස්ථානය යේසුස්වහන්සේගේ කුරුසියයි.

***1 කොරින්ති 1:22-24***

**ඔබ සැබෑ ප්‍රඥාව හඳුනන්නේද?**

# 13 භක්තිමත් ජීවිතය!

**පසුබිම**

යෝබ් තම මිතුරන්ට පැවසූ අවසාන වචන යෝබ් 31හි ඇත. "මා නිදොස්යැ"යි යෝබ් බොහෝ වරක් පැවසුවේය. ඔහු දඬුවම් ලැබීමට සුදුසු කිසිවක් නොකළේය. මෙහිදී යෝබ් සිය භක්තිමත් ජීවිතය අපට පෙන්වයි. ඒ ආකාරයෙන් හෝ මේ අකාරයෙන් තමා පව් නොකළ බව යෝබ් දෙවියන්වහන්සේ ඉදිරියේ පවසයි. ඔහු ***යෝබ් 28:28***හි පැවසූ දෙයට ඔහුගේ ජීවිතය ගැළපෙයි. එය දෙවියන්වහන්සේ ***යෝබ් 1:8***හි වදාළ දෙයට ද ගැළපෙයි.

**ප්‍රධාන කරුණ**

යෝබ් භක්තිමත් ජීවිතය පිළිබඳ ශ්‍රේෂ්ඨ නිදසුනකි.

**කිරීමට යමක්**

ලිංගික පාපය බොහෝ ජීවිත සහ පවුල් විනාශ කරයි. යෝබ්ගේ ආදර්ශය අනුගමනය කරන්නැයි සෙනඟ උනන්දු කළ හැකි වන්නේ කෙසේදැයි කල්පනා කරන්න. අපගේ ඇස් සහ මනස පවිත්‍රව තබාගත හැකිවන්නේ කෙසේද? අපගේ ක්‍රියාවන් නිවැරදිව තබාගත හැකි වන්නේ කෙසේද?

යෝබ්ගේ ආදර්ශය සමඟ එකඟවීම පහසු වුවද ලිංගිකව පව් කිරීමට මිනිසුන් පොළඹවන්නේ කුමක් ද? ආරම්භයේදීම වැරදි සිතුවිලිවලට බැහැයි කීමට ඔබගේ අසන්නන් උනන්දු කරන්නේ කෙසේද? ඔවුන් යෝබ් මෙන් දෙවියන්වහන්සේට පොරොන්දුවක් වියයුතුද? තමන්ට උපකාර කරන ලෙස ඔවුන් මිතුරෙකුගෙන් ඉල්ලාසිටිය යුතුද?

**සටහන්**

යෝබ් 31හි යෝබ් බොහෝ වරක් මෙසේ ලියයි: "මා මේ වරද කළා නම් ඒ භයානක දේ මට සිද්ධ වේවා." යෝබ් අදහස් කරන්නේ "මා කිසිවිටෙක මේ වැරදි දේ **කළේ නැත**" යන්නයි. මෙය සත්‍ය නොවේ නම් දෙවියන්වහන්සේ එය පැහැදිලි කිරීම ඔහුට අවශ්‍යය.

- **යෝබ් 31:1.** "කාමුකව" - වැරදි ලිංගික ආකාරයකින්. ලිංගික පාපය බැල්මකින් ආරම්භ වන බව යෝබ් දනී. එබැවින් ඔහු වැරදි ආකාරයෙන් නොබැලීමට ගිවිසුමක් (ශක්තිමත් පොරොන්දුවක්) ඇතිකර ගනී.
- **යෝබ් 31:5.** "බොරුකාරකම", "වංචාව" - බොරු, අවංකකම නැති.
- **යෝබ් 31:7.** "මාගේ සිත ඇස් අනුව යන්ටත්." පළමුව ඔබ **බලයි**. ඉන්පසු වැරදි දෙයක් ඔබට **ඕනෑ** වෙයි. අනතුරුව ඔබ එය **ලබාගනී**. යෝබ් මෙය නොකළේය.
- **යෝබ් 31:9.** "මාගේ සිත ස්ත්‍රියක් කෙරේ ඇදී ගියේ නම් හෝ ඇගේ දොරකඩ ළඟ ලැග (සැඟවී) සිටියෙම් නම්..."
- **යෝබ් 31:16-23.** යෝබ් සැමවිටම දිළිඳු මිනිසුන්ට සැලකුවේය (16). කුසගිනි ඇති අය සමඟ ආහාර බෙදාගත්තේය (17-18). අවශ්‍යතා ඇති අයට ඔහු වස්ත්‍ර දුන්නේය (19-20). තමන්ට උපකාර කිරීමට කිසිවකු නැති අයට සාධාරණය ඉටුකළේය (21). ඔහු මෙය නොකළේ නම් ඔහුගේ අත බිඳී වැටේවා (22). ඔහු දෙවියන්-වහන්සේගේ දඬුවමට බිය වූ නිසා ඔහු වැරදි කළේ නැත (23).

# ➡ දේශනා කිරීම: යෝබ් 31

## පවිත්‍ර *යෝබ් 31:1, 9-10.*

- ලිංගික පාපය ආරම්භ වන්නේ කොතැනින්ද?

ගැහැනු ළමුන් පුරුෂයන් සමඟ ඉතා මිතුරු විය හැකිය. හුරුබුහුටි කාන්තාවන් ගැන පුරුෂයන් කල්පනා කළ හැකි අතර ඔවුන්ගේ සිතුවිලි ගලායන්නට ඉඩහැරිය හැකිය. මෙය වැරදි වුවද මේ දේවලට පෙර පාපය ආරම්භ වෙයි. **බැල්මකින්** ලිංගික පාපය ආරම්භ වන බව යෝබ් දනී.

- යමෙකු දෙස බැලීම වරදක් නොවේ. වැරදි කුමක්ද? කිසිදිනෙක නොකරන බවට යෝබ් පොරොන්දු වූයේ කුමක් ගැන ද?

*මතෙව් 5:28-29. ඔබගේ වැරදි සිතුවිලිවලට හා ක්‍රියාවන්ට කමා වන ලෙස දෙවියන්වහන්සේගෙන් අයදින්න. වැරදි ආකාරයෙන් නොබැලීමට උපකාර කරන මෙන් දෙවියන්වහන්සේගෙන් ඉල්ලාසිටින්න. ලිංගික පාප නොකරන පිණිස ඔබ කළ යුත්තේ කුමක්ද?*

## අවංක

### ඔහු කිසි විටෙක වංචා නොකරයි *යෝබ් 31:5-8*

කිසිවෙකු නොදකී නම් බොහෝ මිනිසුන් ටිකක් වංචා කිරීමට උත්සාහ කරති. එහෙත් **සැමවිටම** දකින්නේ කවුදැයි යෝබ් දනී (යෝබ් 31:4). යෝබ් කිසිවිටෙක වංචා නොකරයි. තමා අවංක බව පෙන්වීමට දෙවියන්වහන්සේ තමා කිරා බැලීම ඔහුට ඕනෑය. යෝබ් වැරදි (ඔහු වංචාකාරයෙකු) නම් ඔහුගේ සියලු අස්වැන්න කොල්ලකෑමට මිනිසුන්ට ඉඩහරීවා.

### ඔහු සිය සේවකයන්ට සාධාරණය *යෝබ් 31:13-15*

- බොහෝ මිනිස්සු තමන්ගේ සේවකයන්ට සාධාරණය ඉටු නොකළෝය. එසේ නම් ඔවුන් පැමිණිලි කරන කල **යෝබ්** සවන්දිය යුත්තේ ඇයි?

*අනෙක් සියලුදෙනා මෙන් වීම පහසුය. එහෙත් දෙවියන්වහන්සේ ස්වකීය සෙනග වෙනස් ලෙස ජීවත්වීමට කැඳවන සේක. යෝබ්ගේ ආදර්ශයෙන් ඔබ ඉගෙනගන්නේ කුමක් ද?*

## සැලකීම *යෝබ් 31:16-23*

නපුරු දේවල් කිරීම වැරදි බව අපි සියලුදෙනාම දනිමු. **යහපත් දේ නොකර සිටීම ද** වැරදි බව ඔබ දන්නවාද? (යාකොබ් 4:17)

යෝබ් මෙය දැනසිටියේය. ඔහු ධනවත්ව සිටි අතර අවශ්‍යතා ඇති අයට උපකාර කිරීමට හැකියාව ඇතිව සිටියේය. තමා දෙස දෙවියන්වහන්සේ බලාසිටින බව ඔහු දැනසිටියේය. ඔබ කෙරෙන් අහක්ව යන්නැයි ඔබ මිනිසුන්ට පවසන්නේද? උපකාරයක් අවශ්‍ය කෙනෙකු දුටු විට යෝබ් ඉවත බැලුවේද?

*ඔබ උපකාර අවශ්‍ය මිනිසුන්ගේ මිතුරෙක්ද? ඔබ යෝබ් මෙන් ධනවත් නොවුවද අනෙක් මිනිසුන් ගැන සැලකිල්ල දැක්වීම සඳහා ඔබ කළ යුතු යැයි දෙවියන්වහන්සේට බලාපොරොත්තු වන්නේ කුමක්දැයි කල්පනා කරන්න?*

යෝබ් ශ්‍රේෂ්ඨ ආදර්ශයක් වන අතර ඊටත් වඩ ශ්‍රේෂ්ඨ ආදර්ශයක් අපට සිහිගන්වයි. යේසුස්වහන්සේ **සැමවිටම** ස්වර්ගයේ සිටින ස්වකීය පියාණන්වහන්සේ ප්‍රසන්න කිරීමට **සියල්ල** කළ සේක. අපගේ ජීවිත යේසුස්වහන්සේගේ ජීවිතය හෝ යෝබ්ගේ ජීවිතය මෙන් පවා නොවීම ගැන අපට දුකක් දැනේ. එහෙත් අත්නොහරින්න. අප වැනි පව්කරුවන් වෙනුවෙන් පරිපූර්ණ ජීවිතයක් ගතකිරීමට යේසුස්වහන්සේ පැමිණි සේක. අප යේසුස්වහන්සේ විශ්වාස කරන කල උන්වහන්සේගේ පරිපූර්ණ ජීවිතය අපගේ වන්නේය. දෙවියන්වහන්සේ අප දෙස බලන අතර යේසුස්වහන්සේගේ පරිපූර්ණ ජීවිතය දකින සේක. එසේ දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ තුළ අප **පිළිගන්නා** සේක. උන්වහන්සේට ප්‍රශංසා වේවා.

## අධ්‍යයනය: යෝබ් 36:24-37:24

# 14 දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයෙන් පාඩම්

**පසුබිම**

යෝබ්ගේ මිතුරන් තිදෙනාට කීමට තවත් දෙයක් නැත. එහෙත් වෙනත් කෙනෙකු සියල්ලට සවන්දීගෙන සිට ඇත. **එලීහුට** කීමට බොහෝ දේ තිබේ (යෝබ් 32-37).

තමාට සියලු පිළිතුරු තිබෙන බව එලීහුට නිසැකය. ඔහුට යෝබ් සහ මිතුරන් සමඟ කෝපය ඇත. ඔවුන් තමාගේ ප්‍රඥාවට සවන්දීම ඔහුට අවශ්‍යය. ***යෝබ් 32:1-3, 33:1-3.*** එහෙත් එලීහුගේ ප්‍රඥාව හොඳ නැත. මිතුරන් තිදෙනාට මෙන් එලීහුට යෝබ් තේරෙන්නේ නැත. මේ කරදර යෝබ්ට සුදුසු යැයි ඔවුන් මෙන් එලීහු සිතයි (යෝබ් 34:5-12).

එහෙත් ඉන්පසු එලීහු තමාගේම ප්‍රඥාව ගැන කල්පනා කිරීම නතර කරයි. ඒ වෙනුවට දෙවියන්වහන්සේ කෙතරම් ශ්‍රේෂ්ඨ දැයි ඔහු කල්පනා කරයි. එබැවින් ඉගැන්වීමට වැදගත් පාඩම් එලීහුට තිබේ: ***යෝබ් 36:22-37:24***

**ප්‍රධාන කරුණ**

අප දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව කල්පනා කරන විට සහ යටහත්පහත් වන විට අපි ප්‍රඥාවන්ත වන්නෙමු.

**කිරීමට යමක්**

බොහෝ මිනිසුන් කුණාටුවලට බියය. දෙවියන්වහන්සේ පාලනය අතැතිව සිටින බව කිතුනුවන් සිහි කළ යුතුය. උන්වහන්සේ කුණාටු එවන සේක. එනිසා බිය වීමට අවශ්‍යතාවක් නැත. ඒ වෙනුවට, උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය සහ බලය ගැන අප උන්වහන්සේට ප්‍රශංසා කළ යුතුය. අප කුඩා ලෙස හැඟුණ ද බිය නොවිය යුතුය.

නැවක ගමන් කරමින් සිටි එක් කිතුනුවෙක් මුහුදේ දී කුණාටුවක් අත්වින්දේය. ඔහුගේ භාර්යාව බිය පත්ව සිටියාය. ඇගේ ස්වාමිපුරුෂයා සිනාසුණු අතර ඇගේ දෑතෙහි සමාදානයෙන් නිදාහුන් ඔවුන්ගේ බිළිඳා දෙස බැලිය. "ඔබගේ දෑතෙහි අපගේ පුතා කෙතරම් සුරක්ෂිතව සිටින්නේදැයි බලන්න. කුණාටුව නිසා ඔහු කනස්සල්ලට පත්ව නැත. දෙවියන්-වහන්සේගේ දෑතෙහි ඔබ සුරක්ෂිත බව හැඟිය යුතු නොවේද? තම දෑතින් කුණාටු අල්ලාගෙන සිටින ඔබගේ ස්වර්ගික පියාණන් ඔබට විශ්වාස කළ නොහැකිද?"

**සටහන්**

- **යෝබ් 36:24.** "වර්ණනා කරන්න" - ප්‍රශංසා කරන්න.
- **යෝබ් 36:27-37:3-4, 13, 15.** මේ දීර්ඝ කොටස කුණාටුවක් කෙරෙහි **දෙවියන්වහන්සේගේ** පාලනය විස්තර කරයි. විදුලි කෙටීම් හා අහස් ගර්ජනා එවන තැනැන්වහන්සේ උන්වහන්සේය. ඒවා උන්වහන්සේගේ බලය යටතේ තිබේ.
- **යෝබ් 37:21.** කුණාටුවට පසු සූර්යයා නික්ම එයි. එය බලන්නට නොහැකි තරම් දීප්තිමත්ය.

# ➡ දේශනා කිරීම: යෝබ් 36:24-37:24

## දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයෙන් පාඩම්

ප්‍රඥාව යනු ඇයිදැයි යන්න දැනගැනීම පිළිබඳව නොවේ. එය දෙවියන්වහන්සේ හඳුනාගැනීම පිළිබඳව වේ. දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ගැන අප කල්පනා කරන කල සැමවිටම අපගේ ප්‍රශ්නවලට අපට පිළිතුරු ලැබෙන්නේ නැත. එහෙත් අපගේ ගැටලු ඒවායේ නිසි ස්ථාන සොයා ගනිති.

⊞ රටක නායකයෙක් නින්දට යාමට පෙර සැමවිටම තාරකා දෙස බැලුවේය. එය ඔහුගේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයුවේ නැත. එහෙත් තමාගේ ප්‍රශ්නවලට වඩා මැවිල්ල තුළ දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ඉමහත් බව එය ඔහුට පෙන්වා දුන්නේය.

දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය දැකීමට එළිහුට **කුණාටුවක්** උපකාර විය. *යෝබ් 37:10-14.*

### 1. දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමට සිහිතබාගන්න.

*යෝබ් 36:24-26*

කිතුනු කාන්තාවක් තම සැමියා මරණයට පත්වීමෙන් පසු ඉතා ශෝකව සිටියාය. එනිසා ඇය ගායනා කිරීම නතර කළාය. එය වැරදි බව ඇය ඉක්මනින් දුටුවාය. දෙවියන්වහන්සේ අපගේ ප්‍රශංසාව ලැබීමට **සැමවිටම** සුදුසුය.

ආරම්භයේදීම යෝබ් දෙවියන්වහන්සේට ප්‍රශංසා කළේය (යෝබ් 1:20-21). එහෙත් ඇතැම්විට කරදර සහිත සති කිහිපයකට පසු ප්‍රශංසා කිරීම අපට අමතක විය හැකිය. දෙවියන්වහන්සේ කෙතරම් ශ්‍රේෂ්ඨ දැයි කල්පනා කර උන්වහන්සේට ප්‍රශංසා කරන්න.

### 2. අප බොහෝ දේ දන්නේ නැත

*යෝබ් 37:5, 14-15*

කුණාටුවක් ඇති ජලභ අවස්ථාවේ ඔබ දෙවියන්වහන්සේගේ මාර්ග දන්නේ කොපමණ සුළුවෙන්දැයි කල්පනා කරන්න. උන්වහන්සේ ලොවපුරා කාලගුණය පාලනය කරන සේක. එහෙත් උන්වහන්සේ කරන්නේ කුමක්දැයි අපි නොදනිමු. අපගේ ජීවිතවලට දෙවියන්වහන්සේ බොහෝ වෙනස් දේ එවන සේක. එහත් දෙවියන්වහන්සේගේ සැලැස්ම අපි නොදනිමු.

### 3. දෙවියන්වහන්සේට වෙනස් සැලසුම් බොහෝමයක් තිබේ

*යෝබ් 37:13*

වර්ෂාව සඳහා වෙනස් හේතූන් දෙකක් දෙස බලන්න. ප්‍රේමය හා කෝපය පෙන්වීමට දෙවියන්වහන්සේට එකම දේ භාවිත කළ හැකිය. අප නිවැරදි කිරීමට හෝ අපට ආශීර්වාද කිරීමට උන්වහන්සේට කරදර භාවිත කළ හැකිය. එසේ නැතිනම් එකම අවස්ථාවේ කාරණා දෙකම කළ හැකිය. දෙවියන්වහන්සේ යෝබ්ට දඬුවම් කරන පිණිස කරදර එවූ බව යෝබ්ගේ මිතුරන්ට නිසැකය. එහෙත් දෙවියන්වහන්සේගේ සැලසුම වූයේ යෝබ්ට ආශීර්වාද කිරීමටය. තමන්වහන්සේගේ සෙනඟ සඳහා වන දෙවියන්වහන්සේගේ සැලසුම් **සැමවිටම** ඔවුන්ට යහපත කිරීම පිණිසය.

### 4. කුණාටුවට පසු සූර්යයා නික්ම එයි

*යෝබ් 37:21*

සූර්යයා කුණාටුව මෙන් දැඩි වුවද ඉතා වෙනස්ය. කරදරවලට පසුව දෙවියන්වහන්සේගේ සෙනඟට ආශීර්වාදය පැමිණේ. එසේම දෙවියන්වහන්සේගේ සිනහව උන්වහන්සේගේ කුණාටුව මෙන් දැඩිය.

> ⊳ *අප අපගේ කරදර **කෙරෙන්** ඉවත බැලිය යුතුය. ඒ වෙනුවට, දෙවියන්වහන්සේ කොපමණ ශ්‍රේෂ්ඨ දැයි කල්පනා කළ යුතුය. එවිට අප යටහත් පහත් වන අතර දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට වඩාත් සූදානම් වනු ඇත. අප දන්නේ සුළු ප්‍රමාණයක් වුවද දෙවියන්වහන්සේ සම්පූර්ණ පාලනය අතැතිව සිටින සේක. කාලගුණය සම්බන්ධයෙන් පමණක් නොව දෙවියන්වහන්සේ අපට අවශ්‍ය දෙය ද එවන සේක.* **1 පේත්‍රුස් 5:6-7**

# 15 දෙවියන්වහන්සේ කථා කරන සේක

**පසුබිම**

යෝබ් හෝ දෙවියන්වහන්සේ ඒලිහුට පිළිතුරු නොදුන්නද ඒලිහු කථා කරන අතර තමන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ගැන **දෙවියන්වහන්සේම** කථා කරන පිණිස මාර්ගය සකසයි. කුණාටුවක් තුළින් දෙවියන්වහන්සේ යෝබ් සෝදිසි කරන සේක.

*යෝබ් 38-39.* දෙවියන්වහන්සේ ඉදිරියේ තමන් කෙතරම් කුඩා දැයි යෝබ්ට හැඟෙන ලෙස දෙවියන්වහන්සේ යෝබ්ගෙන් ප්‍රශ්න අසන සේක (ඔබ සිටියේ කොහිද? ඔබ අණ දුන්නේද? මාර්ගය කුමක්ද? ඔබට හැකිද? ඔබ දන්නේද?)

*යෝබ් 40-1-5.* දෙවියන්වහන්සේට පිළිතුරු දීමට යෝබ් ලජ්ජාවී සිටියි.

යෝබ් තවත් යටහත්පහත් කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍යය. ප්‍රශ්න සහිත තවත් පරිච්ජේද දෙකක් තිබේ (40-41). අවසානයේදී යෝබ් 42හි යෝබ් දෙවියන්වහන්සේට තම කනගාටුව ප්‍රකාශ කරයි.

**ප්‍රධාන කරුණ**

දෙවියන්වහන්සේගේ මාර්ග ගැන යෝබ් දන්නේ කොපමණ සුළු ප්‍රමාණයක් ද යන්න දෙවියන්වහන්සේ ඔහුට හැඟෙන්නට සලස්වන සේක.

**කිරීමට යමක්**

දෙවියන්වහන්සේගේ සැනසීම අපට අවශ්‍ය බව ඇතැම්විට යෝබ්ට මෙන් අපට හැඟෙයි. එහෙත් දෙවියන්වහන්සේ යෝබ්ට කථා කරන කල උන්වහන්සේ **කුණාටුවකින්** කථා කරන සේක (යෝබ් 38:1). උන්වහන්සේ යෝබ් සනසන්නේ නැත. යෝබ්ට වැරදුණේ කොතැනින්දැයි උන්වහන්සේ ඔහුට පෙන්වාදෙන සේක.

- කිතුනුවන් දුක්විඳින කල බොහෝවිට ඔවුන් කරන වැරදි මොනවාද? (අපට අප ගැන කනගාටු සිතෙයි නැතිනම් දෙවියන්වහන්සේ අසාධාරණ යැයි සිතෙයි නැතිනම් ...)
- මේ වැරදි සම්බන්ධයෙන් යෝබ් 38-39 උපකාර විය හැකි වන්නේ කෙසේද?

**සටහන්**

- **යෝබ් 38:3.** මෙයින් අදහස් වන්නේ "අනුවණ වචනවලින් මන්ත්‍රණය අඳුරු කරන මොහු කවුද?" යන්නයි.
- **යෝබ් 38:3.** "ඉඟටිය බැඳගන්න" - මා ඉදිරියේ සිටගන්න.
- **යෝබ් 40:2.** "උත්තර දෙන්න" - තර්ක කරන්න. යෝබ් දෙවියන්වහන්සේ සමඟ තර්ක කළේය. යෝබ් දෙවියන්වහන්සේට චෝදනා කළේය. දෙවියන්වහන්සේ තමාට සාධාරණ නොවූ බව ඔහු යෝජනා කළේය. එනිසා දෙවියන්වහන්සේට පිළිතුරු දීමට යෝබ්ට ඉඩහරිනසේක.

# ➡ දේශනා කිරීම: යෝබ් 38

## ඔබ කවුද?

*යෝබ් 38:1-3*

⊞ විදුලයේදී මනුෂ්‍යයෙකු මට කී වචන දෙකක් සැමවිටම මාගේ මතකයට එයි. "ඔබ කවුද?" ඔහු මිත්‍රශීලී නොවූයේය. අර්ථය ඉතා පැහැදිලිය. මාගේ ඉවත්ව යාම ඔහුට අවශ්‍ය විය. මේ වචන දෙක මා කුඩා බව හැඟවීමට සැලැස්විය.

"ඔබ කවුදැ"යි දෙවියන්වහන්සේ යෝබ්ගෙන් ඇසූ සේක. තමා කොපමණ කුඩා දැයි යෝබ් දැකීම දෙවියන්වහන්සේට අවශ්‍යය. තමාට තේරුම් යන්නේ කොපමණ සුළු ප්‍රමාණයක් ද යන්න යෝබ් දැකීම දෙවියන්වහන්සේට අවශ්‍යය. එහෙත් දෙවියන්වහන්සේ අකාරුණික **නොවන** සේක. සැබවින්ම දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ යෝබ් නැවත තමන්වහන්සේගේ මිත්‍රත්වයට පැමිණීමයි. දෙවියන්වහන්සේ පවසන දෙය යෝබ්ට පහසුවක් ගෙන නොදුන්නද තමාට කථා කිරීමට දෙවියන්වහන්සේට කෙතරම් අවශ්‍යදැයි යෝබ් සිහිකරයි. දෙවියන්වහන්සේ යෝබ් අත්හැර නොමැති බව ඉන් පැහැදිලි වෙයි.

යෝබ් දෙවියන්වහන්සේ පිළිබඳ බොහෝ ප්‍රශ්න ඇසුවේය. ඔහු දෙවියන්වහන්සේගේ ප්‍රඥාව සහ සාධාරණත්වය විශ්වාස කර නැත. එහෙත් දෙවියන්වහන්සේ සැක කිරීමට යෝබ් කවුද? දෙවියන්වහන්සේ වැරදි වියහැකි බව සිතන්නට යෝබ්ට අයිතියක් නැත. ප්‍රශ්න ඇසීමට දෙවියන්වහන්සේට වේලාව හරි වුවද ඒවාට පිළිතුරු දීමට යෝබ්ට හැකිවනු ඇතිද?

*⊡ අපගේ ප්‍රශ්නවලට දෙවියන්වහන්සේ පිළිතුරු දිය යුතු යැයි ඔබ සිතන්නේද? ඇතැම්විට ඔබ බොහෝ දුක් වින්ද ද දෙවියන්වහන්සේ කරන්නේ කුමක්දැයි ඇසීමට එය ඔබට අයිතියක් ලබා නොදෙයි. **ඔබ කවුද?** දෙවියන්වහන්සේ කොතරම් ශ්‍රේෂ්ඨ ද යන්න හා අප කොතරම් කුඩා ද යන්න අප සිහි කළ යුතුය.*

## ඔබ කොහිද?

*යෝබ් 34:4-18*

⊞ ඔබට වයස අවුරුදු දෙකක් වූ ළදැරියක් සිටින්නේ යැයි සිතන්න. විශ්වවිද්‍යාලයක විභාගයකට පිළිතුරු ලිවීමට ඇයට තිබේ නම්, කළ නොහැකිය. ඇය කොහෙත්ම පිළිතුරු දන්නේ නැත.

දෙවියන්වහන්සේ යෝබ්ට පිළිතුරු දිය නොහැකි ප්‍රශ්න රාශියක් අසන සේක *[ප්‍රශ්න කිහිපයක් ගැන වැඩියෙන් කථා කරන්න]*. මේ සියලු දේම කළ හැකි එකම තැනැත්තා දෙවියන්වහන්සේය. එය දෙවියන්වහන්සේගේ කාරණයයි. යෝබ් **දන්නේ** කොපමණ සුළු ප්‍රමාණයක් ද යන්න ඔහු දැකීම දෙවියන්වහන්සේට අවශ්‍යය. තමාට ඇත්තේ කොපමණ ස්වල්ප **බලයක්** දැයි යෝබ් දැකීම දෙවියන්වහන්සේට අවශ්‍යය. *යෝබ් 38:34-35.*

*⊡ දෙවියන්වහන්සේ හා අප අතර මහත් පරතරයක් තිබේ. අප දන්නේ ස්වල්පයකි. ඇතැම්විට යෝබ් මෙන් අපි බොහෝ දේ කියමු. දෙවියන්වහන්සේට වඩා දන්න ලෙස අපි කථා කරමු. අපි දෙවියන්වහන්සේ වුණා නම් කිසිවිටෙක ඒ ලෙස ක්‍රියා නොකරන බව සිතමු. **අප කෙතරම් අඥාන ද යන්න දෙවියන්වහන්සේ පෙන්වාදෙන සේක.***

## නිශ්ශබ්ද වන්න! *යෝබ් 40:1-5*

දැන් යෝබ්ගේ කථා කිරීමේ වාරයයි. දෙවියන්වහන්සේ සමඟ තර්ක කිරීමට ඔහුට ඉඩහරින්න. දැන් යෝබ්ගේ වාරයයි. තමා දුක්විඳින්නට හැරීම අසාධාරණ වන්නේ ඇයිදැයි දෙවියන්වහන්සේට පැවසීමට ඔහුට ඉඩදෙන්න.

එහෙත් යෝබ්ට කීමට කිසිවක් නැත. තමා පමණටත් වඩා කථා කළ බව ඔහුම දනී. තමාගේ වචන කොපමණ අඥානව තිබුණේදැයි ඔහු දනී. ඔහු නිශ්ශබ්දව සිට වැඩියෙන් දෙවියන්වහන්සේට සවන්දෙනු ඇත. ඇතැම්විට අපට යෝබ්ගෙන් ඉගෙනගත හැකිය.

# 16 දෙවියන්වහන්සේ නැවත කථා කරන සේක

**පසුබිම**

යෝබ්ට පැවසීම සඳහා දෙවියන්වහන්සේට බොහෝ දේ ඇත. යෝබ් යටහත්පහත් හා නිශ්ශබ්ද වුවද දෙවියන්වහන්සේට ඊට වඩා යමක් අවශ්‍යය. දෙවියන්වහන්සේ පිළිබඳ යෝබ්ගේ සමහර සිතුවිලි කෙතරම් වැරදිව තිබුණේදැයි ඔහු දැකීම දෙවියන්වහන්සේට අවශ්‍යය. කණගාටුයි යැයි පවසමින් යෝබ් නැවත තමන්වහන්සේ වෙතට පැමිණීම දෙවියන්වහන්සේට අවශ්‍යය.

- දෙවියන්වහන්සේ අසාධාරණ යැයි යෝබ් කිසිදිනෙක නොසිතිය යුතුය. *යෝබ් 40:6-14*
- දෙවියන්වහන්සේ මහා බෙහෙමොත්ට හා ලෙවියාතන්ට වඩා බලවත්ය. මේ භයංකර සතුන් යෝබ්ගේ සුරතලුන් කරගැනීමට පළමුව ඉඩ හරියි. **ඉන්පසු** ඔහු නිර්භීත වන්නේ නම් යෝබ්ට දෙවියන්වහන්සේ ඉදිරියේ සිටගත හැකිය. *යෝබ් 40:15-41:34*

**ප්‍රධාන කරුණ**

අප සිතනවාට වඩා දෙවියන්වහන්සේ ශ්‍රේෂ්ඨය. අප කිසිවිටෙක උන්වහන්සේ සමඟ තර්ක නොකළ යුතුය. දෙවියන්වහන්සේ අසාධාරණ බව අප කිසිදිනෙක නොසිතිය යුතුය.

**කිරීමට යමක්**

අප ඉතා උඩඟු විය හැකිය. දෙවියන්වහන්සේට වඩා හොඳින් අප දන්නේ යැයි ඉක්මනින් අප කල්පනා කළ හැකිය. මෙය කෙතරම් අඥානදැයි ඔබගේ අසන්නන්ට පෙන්වාදෙන පිණිස මේ පරිච්ඡේද යොදාගන්නේ කෙසේද යන්න පිළිබඳව යාච්ඤා කරන්න. අප කෙතරම් කුඩාද? දෙවියන්වහන්සේ කෙතරම් ශ්‍රේෂ්ඨ ද? දෙවියන්වහන්සේගේ මාර්ග පිළිබඳ අපගේ සැකයන් හා ප්‍රශ්න පැමිණෙන්නේ උන්වහන්සේ පිළිබඳ අපගේ දුර්වල අවබෝධය කෙරෙන්ය.

**සටහන්**

- **යෝබ් 40:8.** මේවා දෙවියන්වහන්සේගෙන් යෝබ් සඳහා වන ප්‍රධාන ප්‍රශ්න වේ. ඒවායින් අදහස් කරන්නේ: "මා අධර්මිෂ්ඨ බව ඔප්පු කිරීමට ඔබ උත්සාහ කරන්නේද? ඔබ නිවැරදිකරු වන විට මා වැරදිකරු කරන්නට ඔබ උත්සාහ කරන්නේද?"
- **යෝබ් 40:9-14.** තමා දෙවියන්වහන්සේ මෙන් ශක්තිමත් හා විශිෂ්ට යැයි යෝබ් සිතන්නේද? එසේනම් එය පෙන්වීමට ඔහුට ඉඩ දෙන්න. දෙවියන්වහන්සේ මෙන් ක්‍රියාකිරීමට යෝබ්ට ඉඩ හරින්න. උඩඟු හා නපුරු මිනිසුන් විනිශ්චය කර ඔවුන් පහත හෙළීමට යෝබ්ට ඉඩ දෙන්න.
- **යෝබ් 40:15, 41:1.** "බෙහෙමොත්" සහ "ලෙවියාතන්." බෙහෙමොත් මදක් හිපපොටේමස් මෙන් ශබ්ද කරයි. ලෙවියාතන් මදක් විශාල කිඹුලෙකු වැනිය. එහෙත් සතුන් දෙදෙනාම හිපපොටේමස් සතෙකුට හා කිඹුලෙකුට වඩා විශාල වන අතර බියකරු හඬක් නංවයි. ඔවුන් ඩයිනෝසරයන් (තවදුරටත් නොපවතින සතුන්) විය හැකිය.
- යෝබ් 41:10. ලෙවියාතන් සුරතලෙකු ලෙසින් තබාගැනීමට භයංකර වැඩිය. ඌ පාලනය කිරීමට තරම් කිසිවෙකු ශක්තිමත් නැත. එනිසා ලෙවියාතන් මැවූ දෙවියන්වහන්සේට එරෙහිව සිටගැනීමට කිසිවෙකු ශක්තියෙන් ප්‍රමාණවත් නැත.

# දේශනා කිරීම: යෝබ් 40:6-41:34

## දෙවියන්වහන්සේ නිවැරදිය!

*යෝබ් 40:6-14*

"මා දෙවියන්වහන්සේ හමුවුණාම මට අසන්නට ප්‍රශ්න කිහිපයක් තිබෙනවා"යි සමහරු කියති. ඔවුන් නිවැරදිද?

දෙවියන්වහන්සේ සොයාගැනීමට යෝබ්ට සැබැවටම අවශ්‍ය විය. දෙවියන්වහන්සේගෙන් ප්‍රශ්න කිහිපයක් ඇසීමට ඔහුට ඕනෑ විය. මේ සියලු දුක්විඳීම් තමාට දීමට දෙවියන්වහන්සේ සාධාරණ දැයි අසන්නට ඔහුට ඕනෑ විය. **එහෙත් දෙවියන්වහන්සේ යෝබ් හමුවන කල සියලූ ප්‍රශ්න අසන්නේ දෙවියන්වහන්සේය!**

මේ සියලු දුක්විඳීම් තමාට දුන්නේ ඇයිදැයි යෝබ්ට තේරුම්ගත නොහැකි විය. එය ලැබීමට සුදුසු දෙයක් තමා නොකළ බව යෝබ් දැනසිටියේය. ඉන්පසු යෝබ් තමාගේ වරද කළේය. **ඔහු** කිසි වරදක් නොකළේ නම් මේ සියල්ල කිරීමට **දෙවියන්වහන්සේ** සාධාරණව සිටි බව දැකීමට ඔහුට නොහැකිවනු ඇත.

යෝබ් දෙවියන්වහන්සේ ගැන ප්‍රශ්න ඇසුවේය. දැන් දෙවියන්වහන්සේගේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට යෝබ්ගේ වේලාවයි. *යෝබ් 40:8*.

*"දෙවියන්වහන්ස, ඔබ සාධාරණ නැත"යි ඔබ කෙදිනක හෝ සිතා හෝ කියා තිබේද? එය සිතීමට වැරදි මාර්ගයයි. දෙවියන්වහන්සේ සැමවිටම සාධාරණ වන සේක. අධර්මිෂ්ඨ වීම දෙවියන්වහන්සේට කළ නොහැකිය. ද්විතීය කථාව 32:4. අපගේ ප්‍රශ්නය වන්නේ **අප** තේරුම් නොගැනීමය. යෝබ් මෙන් අප දකින්නේ දෙවියන්වහන්සේ කරන දෙයින් සුළු ප්‍රමාණයකි. අපි දෙවියන්වහන්සේ නොවෙමු.*

දෙවියන්වහන්සේ යෝබ්ට පරීක්ෂණයක් දෙනසේක. තමාට දෙවියන්වහන්සේ වීමට හැකි බව පෙන්වීමට යෝබ්ට ඉඩ දෙන්න. උඩඟු හා නපුරු මිනිසුන් පහත හෙළා ඔවුන්ට සුදුසු දෙය දීමට යෝබ්ට ඉඩ දෙන්න. යෝබ්ට මෙය කළ නොහැකි නම් සාධාරණ කුමක්දැයි තීරණය කිරීමට දෙවියන්වහන්සේට ඉඩ හරින්න. *යෝබ් 40:9-14*.

## දෙවියන්වහන්සේ දෙවියන්වහන්සේ වන සේක!

*යෝබ් 41:1-10*

දෙවියන්වහන්සේ යෝබ්ට තවත් පරීක්ෂණයක් දෙන සේක. යෝබ්ට මෙය කළ හැකිනම් ඔහුගේ ප්‍රශ්න දෙවියන්වහන්සේගෙන් ඇසීමට තරම් ඔහු ශක්තිමත්ය. යෝබ් ලෙවියාතන් සතෙකු අල්ලාගත යුතු අතර ඌ ලනුවකින් මෙහෙයවිය යුතුය. ඔහු ඌ පාලනය කළ යුතු අතර සුරතලෙකු මෙන් ඌ හීලෑ කළ යුතුය. ඔබ දෙවියන්වහන්සේ නොවන්නේ නම් මෙය කළ නොහැකිය. කිසිවෙකු ළඟට නොඑන තරම් ලෙවියාතන් භයංකරය.

*යෝබ් 41:10*. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කරුණා ඉදිරිපත් කළ සේක. යෝබ් දෙවියන්වහන්සේ වාගේ නොවේ. ඔහු දුර්වල සහ කුඩා අයෙකි. ඔහු දන්නේ ස්වල්පයකි. ලෙවියාතන් සමඟ තර්ක කිරීමට යෝබ් බය වන්නේ නම් ඔහු දෙවියන්වහන්සේ සමඟ තර්ක කිරීමට ඊටත් වඩා බය වනු ඇත.

**එබැවින් යෝබ්ගේ ප්‍රශ්නවලට කිසිදිනෙක ඔහුට පිළිතුරු නොලැබෙනු ඇත** (ඇයි මම? එය සාධාරණ ද?). එහෙත් ඔහුට ඒ පිළිතුරු අවශ්‍ය නොවන බව දෙවියන්වහන්සේ ඔහුට පෙන්වන සේක. ඒ වෙනුවට දෙවියන්වහන්සේ දෙවියන්වහන්සේ බවත් උන්වහන්සේ සාධාරණ හා ධර්මිෂ්ඨ බවත් යෝබ් විශ්වාස කළ යුතුය.

*දෙවියන්වහන්සේ සාධාරණ වන්නේ කෙසේදැයි තේරුම් ගැනීම අසීරුය. බොහෝවිට දේවල් සාධාරණ බව අපට පෙනෙන්නේ නැත. මේ පරිච්ඡේදවලින් පැමිණෙන පාඩම් සිහිකරන්න. දෙවියන්වහන්සේට එරෙහිව තර්ක කරන්නට තරම් ඔබ ලොකු හා ශක්තිමත්ද? දෙවියන්වහන්සේට කළ හැකි දේවල් ඔබට කළ හැකිද? එසේ කරන්නට නොහැකි නම් දෙවියන්වහන්සේ දෙවියන්වහන්සේ බවට **විශ්වාස කරන්න**. දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨ බව **විශ්වාස කරන්න**. එසේම විනිශ්චයකරුවාණන් වන යේසුස්වහන්සේගේ පැමිණීම බලාසිටින්න. උන්වහන්සේ සියල්ල නිවැරදිව කරනු ඇත.*

# 17 ඉගෙනගත් පාඩම්

## පසුබිම

එපමණ දිගු කලක් යෝබ්ට දුක්විඳීමට සිදුවුයේ ඇයි?

ඒ යෝබ් වටිනා පාඩම් කිහිපයක් ඉගෙනගැනීම දෙවියන්වහන්සේට අවශ්‍ය වීමයි. සියලුම දුක්විඳීම්වලින් සහ දෙවියන්වහන්සේගේ වචනයෙන් යෝබ් වෙත පාඩම් පැමිණෙයි (යෝබ් 38-41).

සිය දුක්විඳීම්වලින් පසුව යෝබ් කෙතරම් වෙනස්දැයි බලන්න. ***යෝබ් 42:1-6.***

## ප්‍රධාන කරුණ

යෝබ් දෙවියන්වහන්සේ ඉදිරියේ යටහත් පහත්ය. ඔහු බොහෝ අඥාන වචන ගැන කනගාටු වෙයි.

## කිරීමට යමක්

අප දුක්විඳින කල කරදර නතර කිරීමට අපට සැබෑවටම ඕනෑය. දුක්විඳීම් දිගින් දිගටම යන බව යෝබ් පොත අපට පෙන්වයි. දෙවියන්වහන්සේට අපට පෙන්වීමට අවශ්‍ය දේවල් අප ඉගෙනගන්නේ එවිට පමණී. අප දුක්විඳින කල ඉවසිලිවන්ත වීමට අප ඉගෙනගත යුතුය. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වේලාවේ අප කරදර කෙරෙන් ඉවතට ගෙනෙන තුරු අප බලාසිටීම අවශ්‍යය.

***යාකොබ් 5:10-11***

## සටහන්

- **යෝබ් 42:2.** තමන්වහන්සේට අවශ්‍ය ඕනෑම දෙයක් කිරීමට දෙවියන්වහන්සේට අයිතිය හා බලය තිබේ. දෙවියන්වහන්සේගේ සැලසුම් කිසිවෙකුට නතර කළ (වළක්වන්නට) නොහැකිය. යෝබ් මෙය පෙර දැන සිටිය ද එය සැබෑ නිසා දැන් ඔහුට **සතුටුය.**
- **යෝබ් 42:3.** දෙවියන්වහන්සේගේ ප්‍රශ්නයට යෝබ් පිළිතුරු දෙයි (යෝබ් 38:2). තමා දෙවියන්වහන්සේගේ මාර්ග ගැන පමණට වඩා කී බව ඔහු දනියි. දෙවියන්වහන්සේගේ මාර්ග ඔහුට තේරුම්ගැනීමට අසීරුය (විශාලය).
- **යෝබ් 42:5.** දැන් තමා ගැඹුරු ආකාරයකින් දෙවියන්වහන්සේ හඳුනන බව යෝබ්ට හැඟෙයි. පෙර දෙවියන්වහන්සේ ගැන ඇසුවාක් මෙන් විය. එහෙත් දැන් දෙවියන්වහන්සේ ඔහු සමීපයට පැමිණ ඇත.
- **යෝබ් 42:6.** යෝබ් "පශ්චත්තාප වෙයි." තම වේදනාවේදී තමා වැරදි දේ කියූ බව ඔහු දනියි. ඔහු ඒ දෙවල් "පිළිකුල්" (එපා) කරයි. ඔහු තමා කී දෙවල් ගැන ලජ්ජා වන අතර කනගාටුව ප්‍රකාශ කරයි.

# ➡ දේශනා කිරීම: යෝබ් 42:1-6

## ඉගෙනගත් පාඩම්

### 1. දෙවියන්වහන්සේ තමන්වහන්සේට අවශ්‍ය දේ කරන සේක

📖 *යෝබ් 42:2*

මෙය සැබෑ බව අප දන්නවා වුවද ඇතැම්විට අපි ඊට කැමති නොවෙමු. ඇතැම්විට සමහර දේවල් අපට නතර කළ හැකි යැයි අපි සිතමු. දෙවියන්වහන්සේගේ සැලසුම් නතර කිරීමට කිසිවෙකුට නොහැකිය.

දෙවියන්වහන්සේ තමන්වහන්සේට අවශ්‍ය දෙය කරන බව යෝබ් දැනසිටියේය. එහෙත් මේ සඳහා අලුත් ආකාරයකින් දෙවියන්වහන්සේට **ප්‍රශංසා කිරීමට** ඔහු ඉගෙනගත්තේය. දෙවියන්වහන්සේගේ සැලසුම් වේදනාකාරී වුවද ඒවා නතර කිරීමට නොහැකිවීම ගැන ඔහු සතුටු වෙයි. ඔබ යෝබ් සමඟ එකඟ වන්නේද?

### 2. අප දන්නේ ඉතා සුළු ප්‍රමාණයකි.

📖 *යෝබ් 42:3*

අප නිපුණයන් බව සිතීමට අප කැමතිය. අපි බොහෝසෙයින් දන්නා සේ දෙවියන්වහන්සේගේ මාර්ග පිළිබඳව කථා කරමු. ඉන්පසු සැබෑ නිපුණයාණන් වන දෙවියන්වහන්සේ කථා කරන සේක. උන්වහන්සේ සියල්ල දන්නා අතර අප ඉතා කුඩා බව එහිදී අපට හැඟෙයි.

- ඇතැම් අවස්ථාවල ඔබ යෝබ් මෙන් වී තිබේද? දෙවියන්වහන්සේගේ මාර්ග ගැන ඔබ පමණට වඩා පවසා තිබේද?
- දෙවියන්වහන්සේ ගැන අප තේරුම් නොගන්න ඇතැම් දේවල් මොනවාද?

### 3. අප දෙවියන්වහන්සේ හඳුනාගත යුතුය

📖 *යෝබ් 42:5*

අපට දෙවියන්වහන්සේ **ගැන** කථා කළ හැකිය. යෝබ් දෙවියන්වහන්සේ **ගැන** බොහෝ දේ දැනසිටියේය. එහෙත් දැන් ඔහු අලුත් ආකාරයකින් දෙවියන්වහන්සේ **හඳුනා ගනියි**. යෝබ්ගේ දුක්විඳීම ඔහුට වඩාත් හොඳින් දෙවියන්වහන්සේ "දැකීමට" (දැනගැනීමට) සැලසීය.

- දුක්විඳීම ඔබ දෙවියන්වහන්සේට ළංකළේද? *[තමන්ගේ දුක්විඳීම් තමන්ට දෙවියන්වහන්සේ පිළිබඳව ඉගැන්නුවේ කුමක්දැයි පැවසීමට මිනිසුන් කිහිපදෙනෙකුට අවස්ථාව සැලසිය හැකිය.]*
- ඔබට වඩාත් හොඳින් යේසුස්වහන්සේ හඳුනාගැනීමට අවශ්‍යද? ඔබ දුක්විඳීමට කැමති වන්නේද? 📖 **පිලිප්පි 3:10.**

### 4. අප පශ්චාත්තාපවීම අවශ්‍යය

📖 *යෝබ් 42:6*

තමා දෙවියන්වහන්සේ ගැන පැවසූ දේ පිළිබඳව යෝබ් කනගාටු සහ ලජ්ජා වූයේය. එනිසා ඔහු **දෙවියන්වහන්සේ වෙතට ආපසු හැරෙයි** (පසුතැවිලි වෙයි). ඔහු තවදුරටත් දෙවියන්වහන්සේ සැක නොකළේය. දෙවියන්වහන්සේ සමඟ තර්ක කිරීමට ඔහුට අවශ්‍යතාවක් නැත. දෙවියන්වහන්සේ අසාධාරණ බව ඔහු සිතන්නේ නැත. ඒ වෙනුවට, ඔහු දෙවියන්වහන්සේගේ ප්‍රඥාව සහ ප්‍රේමය **විශ්වාස කරයි.**

*යෝබ්ගේ දුක්විඳීම පාපය සඳහා දෙවියන්වහන්සේගේ දඬුවම නොවන බව අපි දනිමු. අපගේ දුක්විඳීම ද බොහෝවිට අප වරද කළ නිසා නොවේ. එය දඬුවමක් නොවේ.*

*එහෙත් යෝබ් මෙන් අපගේ දුක්විඳීමේදී පව් කිරීම පහසුය. කරදර බාරගැනීම අසීරුය. තවමත් දෙවියන්වහන්සේ අපට ප්‍රේමකරන බව විශ්වාස කිරීම අසීරුය. එනිසා යෝබ් මෙන් අපි දෙවියන්වහන්සේ ගැන වැරදි දේවල් සිතන්නෙමු. දෙවියන්වහන්සේට කනගාටුයි කීමට ද නැවත උන්වහන්සේ වෙතට හැරීමට ද ඔබට අවශ්‍යද? ඔබ කුමන පාඩම් ඉගෙනගැනීම දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේද?*

# 18 දෙවියන්වහන්සේගේ ආශීර්වාදය!

### පසුබිම

දෙවියන්වහන්සේ නැවතත් යෝබ් තමන්වහන්සේ වෙතට හරවා ඇත. දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට යෝබ් සතුටුය. එනිසා යෝබ්ට ආශිර්වාද කිරීමට දෙවියන්වහන්සේට වේලාව දැන්ය. අවශ්‍ය පමණටත් වඩා යෝබ් දුක්වීම දෙවියන්වහන්සේට අවශ්‍ය නොකෙරේ.

උන්වහන්සේ යෝබ්ට පළමුව තිබුණාට වඩා ඔහුට දෙනසේක. දෙවියන්වහන්සේ යෝබ්ට ප්‍රේමකරන බව මෙය සියලුදෙනාටම පැහැදිලිව පෙන්වයි. තම දුක්විඳීම් අතරතුර යෝබ් දෙවියන්වහන්සේ තදින් අල්ලාගැනීමට නිවැරදි දේ කළ බව පෙන්වයි. *යෝබ් 42:7-17*

### ප්‍රධාන කරුණ

දෙවියන්වහන්සේගේ සෙනඟ ටික කලකට දුක්වින්ද ද දෙවියන්වහන්සේ සැමවිටම ස්වකීය සෙනඟ උදෙසා යහපත් දේවල් සැලසුම් කරන සේක.

### කිරීමට යමක්

යෝබ්ගේ කතන්දරයට ශ්‍රේෂ්ඨ අවසානයක් තිබේ. ඔහු උදෙසා සියල්ල නිවැරදිව සිදුවන්නේය. එහෙත් බොහෝවිට දෙවියන්වහන්සේගේ සෙනඟට මෙලෙස සිදුවන්නේ නැත. සාමාන්‍යයෙන් අපගේ ජිවිත කාලය පුරාවට අපට කරදර තිබේ. බොහෝ කිතුනුවෝ යෝබ් මෙන් ධනවත් අය නොවෙති. එහෙත් අප දෙවියන්වහන්සේට අයිති නම් අපගේ කතන්දරයට ශ්‍රේෂ්ඨ අවසානයක් තිබෙන බව සිහිකරන්න. යෝබ්ගේ කතන්දරය ස්වර්ගයේ ශ්‍රේෂ්ඨ අවසානය වෙත අප යොමුකරවයි. සියලුම දුක්විඳීම් දවසක අවසන් වනු ඇති බව අපට උගන්වයි. ඉන්පසු අප දන්නේ දෙවියන්වහන්සේගේ ආශිර්වාදය **පමණි**.

### සටහන්

- **යෝබ් 42:7.** යෝබ් දෙවියන්වහන්සේ පිළිබඳව වැරදි දේවල් **කිහිපයක්** කීවේය. එහෙත් එය තවදුරටත් බොහෝසේ “නිවැරදි” ලෙස තිබිණි. යෝබ් සම්බන්ධයෙන් වැරදි තිබූ දෙය කුමක්ද යන්න යෝබ්ගේ මිතුරන්ට මහත් නිසැකකමක් තිබුණ ද ඔවුන්ගේ වචනවල තිබූ වරද ඔවුන් දුටුවේ නැත. ඔවුහු යෝබ්ට සහ දෙවියන්වහන්සේට විරුද්ධව බොහෝ වැරදි දේවල් කීවෝය. දැන් යෝබ් ඔවුන් උදෙසා යාච්ඤා කළ යුතුය.
- **යෝබ් 42:7-9.** දෙවියන්වහන්සේ යෝබ්ගේ මිතුරන් සමඟ කෝපව සිටිය ද ඔවුන් ද නැවත උන්වහන්සේ වෙතට පැමිණීම උන්වහන්සේට අවශ්‍යය. යෝබ්ගේ දුක්විඳීම ඔහුගේ මිතුරන්ට වැදගත් පාඩම් ඉගැන්නුවේය (නිදසුන්: දෙවියන්වහන්සේගේ මාර්ග තේරුම්ගැනීමට විශාල වැඩිය, හොඳ මිනිසුන්ට නරක දේවල් සිදුවෙයි...).
- **යෝබ් 42:10.** “සවලවත්” - ධනවත්. දෙවියන්වහන්සේගේ ආශිර්වාදය යන්නෙන් අදහස් කරන්නේ අප ධනවත් සහ නිරෝගී වන බව නොවේ. යෝබ්ගේ ධනවත්කම් දෙවියන්වහන්සේගේ සෙනඟට උන්වහන්සේ තුළ ඇති සැබෑ ආශිර්වාද පිළිබඳ පින්තූරයකි. දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟට යේසුස්වහන්සේ තුළින් ප්‍රේමය, සමාදානය, ප්‍රීතිය සහ කමාව දෙන සේක. ඉන්පසු ස්වර්ගය! මේවා මුදල් සහ වස්තුවට වඩා ඉතා හොඳය.
- **යෝබ් 42:11.** යෝබ්ගේ දුක්විඳීම බොහෝදෙනෙකුට බලපෑම් ඇතිකළේය. දුක්විඳීම ස්වකීය සෙනඟගේ යහපත උදෙසා යොදාගන්නේ කෙසේදැයි ඔවුන්ට ඉගෙනගත හැකිය.

## ➡ දේශනා කිරීම: යෝබ් 42:7-17

දෙවියන්වහන්සේ සැමවිටම යහපත්ය. යෝබ්ගේ දුක්විඳීම තුළින් මෙය දැකීම අසීරුය. යෝබ් සහ ඔහුගේ මිත්‍රයන් කෙරෙහි දෙවියන්වහන්සේගේ යහපත්කම අපට දැකිය හැකිය.

### දෙවියන්වහන්සේ 📖 *යෝබ් 42:10, 12*

"දෙවියන්වහන්සේගේ සෙනඟට අයහපත් දේවල් සිදුවන්නේ ඇයි?" යනුවෙන් ඇතැම්විට අපි අසන්නෙමු. දෙවියන්-වහන්සේගේ පිළිතුර වන්නේ තමන්-වහන්සේගේ සෙනඟ උදෙසා යහපත් සැලසුම් තිබෙන්නේ උන්වහන්සේට **පමණක්** බවය (යෙරෙමියා 32:40).

දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා -

- දෙවියන්වහනසේ අයහපත් දේවල් අපගේ යහපතට **යොදාගන්නා** සේක. අපගේ කරදර අපතේ යාමක් නොවේ. අප රෝගීව සිටි වසර ගණනාව අපතේ ගියා නොවේ. දුක්විඳීම ගෙනෙන යහපත් දේවල් මොනවාද?
- දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟට වැඩි වැඩියෙන් ආශිර්වාද කිරීමට ප්‍රිය කරන සේක. දෙවියන්වහන්සේ යෝබ්ට කෙතරම් ප්‍රේමකරන සේක්දැයි පෙන්-වීමට උන්වහන්සේ යෝබ්ට දෙගුණයක් දෙන සේක. ජීවිතය අසීරු බව දැන් පෙනෙන්නේ නම් ස්වර්ගය පිළිබඳ දෙවියන්වහන්සේගේ සැලසුම සිහි-කරන්න! (2 කොරින්ති 4:17)

### මිතුරන් 📖 *යෝබ් 42:7-9, 11*

⊞ මේ මොහොතේ මම පිළිකා රෝගයෙන් පෙළෙමි. මේ තුළ මා හා මාගේ පවුල උදෙසා දෙවියන්වහන්සේට අනර්ඝ සැලසුම් තිබේ. එහෙත් උන්වහන්සේ **තවත් බොහෝදෙනෙකුට** කථාකර තිබේ. ඔවුන්ගේ ජීවිත හා ඔවුන්ගේ මරණ ගැන සිතන්නට ඔවුන්ට ද බොහෝ දේ තිබේ. අපගේ දුක්විඳීම බොහෝ දෙනෙකුට ආශිර්වාද කිරීමට භාවිත කිරීමට උන්වහන්සේට හැකි නිසා දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා.

යෝබ් සම්බන්ධ ගැටලු තමන් දන්නේ යැයි යෝබ්ගේ මිතුරන් තිදෙනාට නිසැකකමක් තිබිණි. ඔවුන් වැරදි කෙසේදැයි දැකීමට දෙවියන්වහන්සේ ඔවුන්ට සැලසූ සේක. උන්වහන්සේ ඔවුන් යටහත් පහත් කළ අතර කමාව දුන් සේක. තමන් උදෙසා යාච්ඤා කරන්නැයි යෝබ්ගෙන් ඉල්ලා-සිටීම ඔවුන්ට අසීරු විය. එහෙත් දෙවියන්වහන්සේ ඔවුන්ට උන්වහන්සේ ගැන බොහෝ දේ ඉගැන්වීමට මෙය යොදාගත් සේක.

- යෝබ්ගේ මිතුරන් සහ ඥාතීන් කුමන පාඩම් ඉගෙනගත්තේ යැයි ඔබ සිතන්නේද?

### යෝබ් 📖 *යෝබ් 42:7, 8, 12*

යෝබ් තම දුක්විඳීම්වලින් බොහෝ දේ ඉගෙන ගනී. එහෙත් පොත ආරම්භවූ ආකාරයෙන් එය අවසන් වන අයුරු නිරීක්ෂණය කරන්න.

- යෝබ් **යහපත්** මනුෂ්‍යයෙකි. ඔහු අවංකව ජීවත්වන අතර අවංකව කථා කරයි (යෝබ් 1:1, 42:7). යෝබ් සර්ව සම්පූර්ණ වූයේ නැත. සිය දුක්විඳීමේදී තමන්වහන්සේ තදින් අල්ලාගෙන සිටීමට දෙවියන්වහන්සේ යෝබ් විශ්වාස කළ සේක.
- යෝබ් **ආශිර්වාද ලත්** මනුෂ්‍යයෙකි (යෝබ් 1:2-3, 42:12). ඔහුගේ දුක්විඳීම තුළ ආශිර්වාදය දැකීම දුෂ්කර විය. එහෙත් අප දෙවියන්වහන්සේ විශ්වාස කරන කල අවසානයේදී ආශිර්වාදය පැමිණෙයි.

*» ඔබට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය දැනගැනීමට අවශ්‍යද? දෙවියන්වහන්සේගේ යහපත් සැලසුම් සැමවිටම උන්වහන්සේගේ සෙනඟ වෙත පැමිණෙන බව සිහි කරන්න. කිසිවිටෙක යෝබ් මෙන් දෙවියන්වහන්සේ අත්නොහැර සිටින්න. ඔබගේම මාර්ගයේ දේවල් කිරීම හොඳයැයි කිසිවිටෙක නොසිතන්න. එය බොහෝසේ වේදනා ගෙනදුන්න ද යෝබ් සිහිකරන්න. දෙවියන්වහන්සේ ඔබට මහත් ආශිර්වාද සැලසුම් කරන බව සිහිකරන්න.*

# ෟ. යෝබ් පොතෙන් පාඩම්

දෙවියන්වහන්සේගේ වචනයෙන් අපගේ ජීවිතවලට පාඩම් ලබාගැනීම වැදගත්ය. කණ්ඩායම් තුළ සාකච්ඡා කිරීමට හා ඒවා පිළිබඳව යාච්ඤා කිරීමට එය ඔබගේ සෙනඟට උපකාරවනු ඇත. මේ පොතෙන් සමහර ප්‍රධාන පාඩම් ඉගෙනගැනීමට මේ ප්‍රශ්න අපට උපකාර වෙයි. යෝබ් පොතෙන් ඔබ කරන දේශනා සියල්ල අවසන් කළ පසු ඔබට මේ ප්‍රශ්න භාවිත කළ හැකිය. එසේ නැත්නම් එක් එක් කොටසට පසු භාවිත කිරීමට ඔබට අවශ්‍ය විය හැකිය.

## යෝබ් පොතෙන් පාඩම්

1. **පාලනය අතැතිව සිටින්නේ සාතන් නොව දෙවියන්වහන්සේය!**
- යෝබ් සඳහා වූ සාතන්ගේ දුෂ්ට සැලසුම්වලට කුමක් වුයේද?
- ඔබ සාතන්ට හෝ දුෂ්ටාත්මවලට බයද? යෝබ්ගේ කතන්දරයෙන් ඔබ ඉගෙන ගත්තේ කුමක්ද?

2. **දෙවියන්වහන්සේ සැමවිටම යහපත්ය සැමවිටම සාධාරණය.**
- යෝබ් මේ පාඩම ඉගෙන ගත්තේ කෙසේද?
- සිදුවන දේවල් අසාධාරණ යැයි හැඟෙන විට අපට මේ සත්‍යය තදින් අල්ලාගෙන සිටිය හැකිවන්නේ කෙසේද?

3. **ස්වකීය සෙනග උදෙසා දෙවියන්වහන්සේට ඇත්තේ යහපත් සැලසුම් පමණී.**
- මෙය සැබෑ වන්නේ ඇයි?
- "නරක" දේ සිදුවන විට අප දෙවියන්වහන්සේ ගැන සිහි කළ යුත්තේ කුමන දේ ද?

4. දෙවියන්වහන්සේ "නරක" සහ වේදනාකාරී දේ තමන්වහන්සේගේ සෙනඟගේ යහපතට හරවන සේක.
- මෙය යෝබ්ට සහ ඔහුගේ මිතුරන්ට සත්‍ය වුයේ කෙසේද?
- දෙවියන්වහන්සේ මෙය ඔබගේ ජීවිතයේ කළේ කෙසේදැයි පවසන්න.

5. **අප දෙවියන්වහන්සේ නොවන නිසා අපට තේරුම්ගත නොහැකි බොහෝ දේ තිබේ.**
- යෝබ්ට දුක්විඳින්නට සිදුවුයේ ඇයිදැයි දෙවියන්වහන්සේ ඔහුට කිසිදිනෙක පැහැදිලි නොකළ සේක. මේ ඇයි?
- අප කවුදැයි සිහිපත් කරගැනීමට එය උපකාර වන්නේ කෙසේද?

6. **අප සියල්ල තේරුම්ගැනීම අවශ්‍ය නොවේ. අපට අවශ්‍ය වන්නේ සියල්ලේදී දෙවියන්වහන්සේ විශ්වාස කිරීමයි.**
- තේරුම් නොගැනීම ගැන අවසානයේදී යෝබ් සතුටු වුයේ ඇයි?
- ජීවිතයේ උදාහරණ පිළිබඳව කල්පනා කරන්න. තේරුම්ගැනීමට වඩා අප විශ්වාස කළ යුත්තේ කිනම් අවස්ථාවේද? (නිදසුන්: තරුණ දරුවන් හා ඔවුන්ගේ දෙමාපියන්) අපට දෙවියන්-වහන්සේ විශ්වාස කිරීමට නිදසුන් උපකාර වන්නේ කෙසේද?

7. **ඇයිදැයි යන්න දැනගැනීමට වඩා දෙවියන්-වහන්සේ හඳුනාගැනීම වඩාත් වැදගත්ය.**
- අවසානය වන විට යෝබ් (සහ යෝබ්ගේ මිතුරන්) වඩා හොඳින් දෙවියන්වහන්සේ හඳුනාගත්තේ කුමනාකාරවලින්ද?
- ඔබගේ කරදරවලින් අදහස් කරන්නේ ඔබ හොඳින් දෙවියන්වහන්සේ දන්නා බව නම් ඔබ දුක්විඳීමට සතුටු වන්නේද?

8. **දුක්විඳීම සම්බන්ධයෙන් දෙවියන්වහන්සේට බොහෝ හේතු තිබේ. ඒ සියල්ලම යහපත්ය.**
- ඒ හේතුන් සමහරක් මොනවාද?
- කරදර පැමිණෙන කල ඔබ දෙවියන්-වහන්සේගේ යහපත් හේතුන් සිහිකරන්නේද? එය උපකාර වන්නේ කෙසේද?

9. **අප දෙවියන්වහන්සේ වෙතින් ඉවතට හැරවීම සඳහා අපගේ දුක්විඳීම් යොදාගැනීමට යක්ෂයා උත්සාහ කරයි. අප දෙවියන්වහන්සේ වෙතට හැරවීමට දෙවියන්වහන්සේ අපගේ දුක්විඳීම් යොදාගන්නා සේක.**

- දෙවියන්වහන්සේ සහ සාතන් යෝබ්ට ඔහුගේ කරදර දුන්නේ කෙසේදැයි කල්පනා කරන්න. ඔවුන්ගේ වෙනස් හේතුන් වුයේ මොනවාද?
- සමහර මිනිස්සු දුක්විඳින කල ඔවුහු දෙවියන්-වහන්සේ වෙතින් ඉවතට හැරෙති. යක්ෂයාට අප සියල්ලන්ගෙන් අවශ්‍ය වන්නේ මෙයයි. කරදරවලදී දෙවියන්වහන්සේ වෙතට හැරීමට අප එකිනෙකාට උපකාර කළ හැකි වන්නේ කෙසේද?

**10. අපගේ දුක්විඳීම් බොහෝවිට අපගේ පාපය නිසා නොවේ.**
- යෝබ්ගේ දුක්විඳීමට හේතුන් වුයේ මොනවාද?
- ඔබගේ ජීවිතයට දුක්විඳීම ගෙනඒමට දෙවියන්වහන්සේගේ හේතු මොනවාද?

**11. අප දුක්විඳින කල පව් කිරීම පහසුය.**
- යෝබ් තදින් දෙවියන්වහන්සේ අල්ලාගෙන සිටිය ද කනගාටුව ප්‍රකාශ කිරීමට සිදුවුයේ කුමක් සඳහා ද?
- අප දුක්විඳින කල අවධානයෙන් සිටිය යුත්තේ කුමන පාප ගැන ද?

**12. අප දුක්විඳින මිනිසුන් සනසන කල අපට දෙවියන්වහන්සේගෙන් උපකාර අවශ්‍යය.**
- යෝබ්ගේ මිතුරන් කළේ කුමන වැරදිද?
- ඔවුන්ගේ වැරදිවලින් ඔබ ඉගෙන ගත්තේ මොනවාද?
- ඔබ ප්‍රයෝජනවත් මිතුරකු වනු පිණිස ඔබ යාච්ඤා කළ යුත්තේ කුමක් උදෙසාද?

**13. අපගේ දුක් විඳීම සදහටම පවතින්නේ නැත (තමන්වහන්සේගේ සෙනඟ වෙනුවෙන් දුක්-වින්දාවු යේසුස්වහන්සේ කෙරෙහි අප විශ්වාස කළොත්). දුක්විඳීමට අවසාන පිළිතුර දෙවියන්වහන්සේට තිබේ. දුක්විඳීම අවසන් වන අතර ස්වර්ගය පැමිණෙනු ඇත.**
- යෝබ් දුක්වින්ද කල තමාට කුමක් සිදුවනු ඇතැයි ඔහු සිතුවේද? ඔහුට කුමක් සිදුවුයේද?
- අපට කරදර තිබෙන කල යේසුස්වහන්සේ ගැන හා ස්වර්ගය ගැන කල්පනා කිරීමට එය උපකාර වන්නේ කෙසේද?

---

## දුක්විඳීමට හේතු

මේ විෂය පිළිබඳ දේශනාවක් හෝ බයිබල් අධ්‍යය-නයක් ඔබගේ අසන්නන්ට බොහෝසේ උපකාරවනු ඇත. පහත දැක්වෙන උපකාරක කෙතරම් හොඳින් භාවිත කළ හැකිදැයි කල්පනා කරන්න.

දුක්විඳීම පිළිබඳ අසීරුම දේවලින් එකක් වන්නේ එය සිදුවුයේ **ඇයිදැයි** අප නොදන්නා විටය. බොහෝවිට දෙවියන්වහන්සේ ඇයිදැයි පැහැදිලි නොකරන සේක. අපගේ කරදරවලදී අප උන්-වහන්සේ විශ්වාස කිරීම උන්වහන්සේට අවශ්‍යය.

එහෙත් කරදරවලට හොඳ හේතු බොහෝමයක් බයිබලය අපට ලබාදෙයි. දෙවියන්වහන්සේ අපගේ ජීවිතවල තිබෙන කරදර යහපත් දේවල් ඇතිකිරීමට යොදාගන්නා සේක.

**1. දුක්විඳීම අප ජීවත්වන පාපිෂ්ට ලෝකයේ කොටසකි. රෝම 8:22-23.**

ආදම් පව් කළ දා පටන් මුළු ලෝකයම කරදරයේ සිටියි. පාපය සියලුදෙනා වෙත කරදර ගෙනාවේය. සියලුදෙනාම රෝග, වේදනාව අධෛර්ය සහ මරණය හඳුනති. පාපය සියල්ලම වරදට පත් කළ නිසා මුළු මැවිල්ලම "කෙඳිරිගාන" බව පාවුලුතුමා රෝම 8හි අපට පවසයි.

කිතුනුවන් මේ විනාශවු ලෝකයේ ජීවත්විය යුතුය. අනෙක් සියලුදෙනාට මෙන්ම අපට කරදර තිබේ. එහෙත් ලෝකයේ සියලු කරදර ඉවත්ව යන දවසක් කෙරෙහි අපි බලාසිටිමු. තවදුරටත් වේදනාව නැති ස්වර්ගය කරා අපි ගමන් කරමින් සිටිමු.

**2. දුක්විඳීම අපගේම වරදක් විය හැකිය.**

අපිරිසිදු ජලය පානය කළ නිසා අපි රෝගීව සිටිමු. මෙය දෙවියන්වහන්සේගෙන් නොව අපගෙන්ය. ඇතැම්විට අප ගත් වැරදි තීරණයක් නිසා අපට කරදර පැමිණ තිබේ. මෙය අපගේ වරදකි. අපගේ වැරදිවලින් අප පාඩම් ඉගෙනගත යුතුය. අප අපටම ඇතිකරගන්න කරදර තුළදී අපට උපකාර කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලාසිටිය හැකිය.

**3. දුක්විඳීම දෙවියන්වහන්සේගේ නිවැරදි කිරීම විය හැකිය. හෙබ්‍රෙව් 12:4-13**

දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ දරුවන්ට ප්‍රේමණීය පියෙකු බව හෙබ්‍රෙව් 12 පවසන අයුරු නිරීක්ෂණය කරන්න. උන්වහන්සේ දරුණු හෝ

කෝප නැත. අපට රිදවීමට උන්වහන්සේ කැමති නොවන සේක (විලාප ගී 3:31-33). අප යේසුස්-වහන්සේ කෙරෙහි විශ්වාස කළහොත් දුක්විඳීම දෙවියන්වහන්සේගේ දඬුවම නොවන්නේය. අපගේ සියලු පව් උදෙසා කුරුසිය මතදී යේසුස්වහන්සේ දුක්වින්ද සේක. හොඳ පියෙකු මෙන් අප නිවැරදි මාර්ගයේ ගෙනයාම දෙවියන්වහන්සේට අවශ්‍යය.

අප දෙවියන්වහන්සේගෙන් ඈත්ව ගියහොත් උන්වහන්සේ අප නැවත ගෙනෙන පිණිස දුක්විඳීම යොදාගන්නවා ඇත. ඇතැම්විට අප උන්-වහන්සේගේ වචනයට සවන් නොදෙනු ඇත. දෙවියන්වහන්සේ අපට ප්‍රේම කරන නිසාත් අප උන්වහන්සේ වෙතට නැවත හරවා ගැනීමට අවශ්‍ය නිසාත් දෙවියන්වහන්සේ අප කෙරෙහි කරදර එවන සේක. අප උන්වහන්සේගෙන් අයැද සිටියහොත් අපගේ කරදරවලට හේතුව මේ යැයි දෙවියන්-වහන්සේ පෙන්වනු ඇත. ඔබ දෙවියන්වහන්සේගෙන් ඉවතට නොගොස් සිටින කල වරදකරුවෙකැයි නොසිතන්න.

පියෙකු මෙන් දෙවියන්වහන්සේ අප පුහුණු කරන පිණිස දුක්විඳීම යොදාගන්න සේක. අප පාඩම් ඉගෙන ගන්න පිණිස උන්වහන්සේ අපට අසීරු දේ දෙන සේක. තමන්වහන්සේගේ දරුවන් වර්ධනය වීම උන්වහන්සේට අවශ්‍යය.

**4. දුක්විඳීම අපගේ ඇදහිල්ල තුළ අප වර්ධනය කරයි. යාකොබ් 1:2-4, යෝබ් 23:10.**

දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟට කරදර එවීමට බොහෝවිට හේතුව මෙයයි. බොහෝවිට ජීවිතය පහසුවෙන් තිබෙන විට අප ඉතා හොඳින් වර්ධනය වන්නේ නැත. කරදර, පැළයක් වර්ධනය වීමට හොඳ පසක් වැනිය. දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට කරදර අපට උගන්වයි. පරිණතවීමට (වර්ධනය) සහ කිසිවකින් අඩු නොවී සම්පූර්ණ වීමට කරදර අපට සලස්වයි. කරදර තමාගේ ඇදහිල්ල රත්තරන් මෙන් කරනු ඇතැයි යෝබ් දුටුවේය. කරදර අපගේ ඇදහිල්ල වර්ධනය කරන නිසා කරදර පැමිණි කල ප්‍රීතිවන්නැයි යාකොබ් අපට පවසයි. අප පැමිණිලි නොකළ යුතුය. කරදර අපට දෙවියන්වහන්සේගේ යහපත් තෑග්ග බව අප විශ්වාස කළ යුතුය.

**5. දුක්විඳීම අප අපගේ දුක්විඳින ගැළවුම්කරුවා-ණන් සමීපයට ගෙන ආ හැකිය. පිලිප්පි 3:10**

තමාගේ ගැළවුම්කරුවාණන්ගේ දුක්විඳීමේ වඩාත් පංගුකාරයෙකු වීමට පාවුලුතුමාට අවශ්‍ය විය. තමා දුක්විඳින අතර වඩාත් හොඳින් යේසුස්වහන්සේ දැනගත හැකි බව පාවුලු තුමා දැනසිටියේය.

**6. දුක්විඳීම පීඩාව විය හැකිය. මතෙව් 5:10-12**

අප යේසුස්වහන්සේ වාගේ නිසා හා යේසුස්-වහන්සේ ගැන අන්‍යයන්ට පවසන නිසා අපි පීඩාවලින් දුක්විඳිමු. තමන්වහන්සේ නිසා මිනිසුන් අපට පීඩා කරන කල ප්‍රීතිවන්නැයි යේසුස්වහන්සේ අපට පවසන සේක. අප යේසුස්වහන්සේ මෙන්වී ඇති නිසා එය අප ධෛර්යවත් කරයි. මිනිස්සු යේසුස්වහන්සේට ද්වේශ කරන නිසා ඔවුහු අපට ද්වේශ කරති. අප යේසුස්වහන්සේට අයිතිය.

**7. දුක්විඳීම අනෙක් මිනිසුන්ට බොහෝ දේ ඉගැන්විය හැකිය.**

බරපතළ ලෙස රෝගීවූ කෙනෙකුට ලියූ කාඩ් පතක් මම අද කියෙව්වෙමි. "කරදරවලදී ඔබගේ ඇදහිල්ල සහ ඉවසීම බොහෝසේ මා ධෛර්යවත් කළේය"යි එම කාඩ් පතෙහි සටහන් කර තිබිණි. අප දුක්විඳින ආකාරය අනෙක් මිනිසුන්ට උපකාර විය හැකිය. ඔවුන්ගේම කරදරවලදී ඉදිරියට යාමට එය ඔවුන්ට උපකාර වියහැකිය. එය ඔවුන් ජීවත්වන ආකාරය ගැන කල්පනා කිරීමට සැලැස්විය හැකිය.

යෝබ්ගේ දුක්විඳීමට විශාල හේතුවක් වූයේ මේ පොත කියවන මිලියන ගණනක් ඇදහිලිවන්තයන්ට උපකාර කිරීමය.

**8. අනෙක් මිනිසුන් සැනසීමට අපගේ දුක්විඳීම අපට උපකාර විය හැකිය. 2 කොරින්ති 1:3-7**

යෝබ් සැනසීමට යෝබ්ගේ මිතුරන්ට උපකාර කළ නොහැකි විය - ඔවුහු දුක්විඳීම තේරුම් නොගත්තෝය. එහෙත් අපගේ දුක්විඳීමේදී දෙවියන්වහන්සේ අප සැනසූ කල අපට අනෙක් මිනිසුන්ට උපකාර කළ හැකිය. අප මෘදු සහ කාරුණික වනු ඇත. ඔවුන්ගේ වේදනාව අප තේරුම්ගන්න බව ඔවුහු දනිති. දෙවියන්වහන්සේ අපට කෙසේ උපකාර කළ සේක්දැයි ඔවුන්ට පැවසිය හැකිය.

මේ සියලු හේතුන් කෙතරම් යහපත්දැයි සිතන්න. දුක්විඳීම අසීරු දෙයක් බව දැන් අපි දනිමු. එහෙත් දුක්විඳීම ගෙන එන යහපත් දේවල් සිහි කරන කල අපට දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමට හා විශ්වාස කිරීමට හැකිය.

# යෝබ් පොත දේශනා කිරීම

## යෝබ් පොත සඳහා දේශනා සටහන්

*...ලොව වටා සිටින බයිබල් ගුරුවරුන් උදෙසා ලියා ඇත*

**යාච්ඤා කරන්න - සූදානම් වන්න - දේශනා කරන්න** පොත් පෙළ ලොව පුරා සිටින බයිබල් ගුරුවරුන්ට දෙවියන්වහන්සේගේ වචනය නිවැරදිවත් පැහැදිලිවත් පැහැදිලි කරදීම සඳහා මාර්ගෝපදේශයන් වන්නේය. "ලජ්ජාවට පත්වීමට අවශ්‍ය නැති සත්‍යයේ වචනය නිවැරදිව පැහැදිලි කර දෙන යහපත් සේවකයකු වන්න"යි 2 තිමෝති 2:15 පවසයි.

යෝබ් පොත දේශනා කිරීම පහත සඳහන් දේ කිරීමට ඔබට උපකාරී වේ.

- දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟගේ යහපත උදෙසා දුක්විඳීම යොදාගන්න ආකාරය **අවබෝධ කරගැනීම**
- සාතන් නොව දෙවියන්වහන්සේ පාලනය අතැතිව සිටින බව **ඉගෙන ගැනීම**
- දුක්විඳින කල දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට සෙනඟට **උපකාර කිරීම**
- ඔබේ සෙනඟට එක් එක් කොටස වැදගත් වන්නේ කෙසේදැයි **සිතීම**
- ප්‍රධාන කරුණ පැහැදිලිව **ඉගැන්වීම**



අර්ථවිග්‍රහාත්මක දේශනා කිරීම්වල අවශ්‍යතාව බොහෝසේ කතාබහට ලක්වී ඇත. එහෙත් ආසියාවේ සැබෑ අර්ථවිග්‍රහාත්මක දේශනා පවත්වන්නේ ඉතාම ස්වල්ප දෙනෙකු පමණි. මෙම පොත් පෙළ බොහෝ දේශකයන්ගේ ජීවිතවල හා සේවයන් සඳහා නව ගැම්මක් ලබාගැනීමට උපකාරීවනු ඇත. අර්ථවිග්‍රහාත්මක දේශනා කිරීම් වර්තමාන සභාපාලකවරුන්ට ප්‍රායෝගික නොවන, කළ නොහැකි කාර්යයක් නොවන බව එය පෙන්වා දෙයි. ප්‍රායෝගික ආකාරයන්ගෙන් දේශනා කිරීම සඳහා බයිබල් ඡේදයන් විවෘත කරදීමෙන් වචනයේ සේවකයන්ගේ අලුත් පරම්පරාවක් පෝෂණය කිරීමට මෙම පොත් පෙළ උපකාරී වේ.

***ආචාර්ය අජිත් ප්‍රනාන්දු, ඉගැන්වීම් අධ්‍යක්ෂක - යෞවන කිතුමග***



ලොව පුරා පවතින විශාලතම අවශ්‍යතාවන්ගෙන් එකක් වන්නේ බයිබල් ඡේදය මත දැඩිව පදනම් වූ එහි බලය හා අදාලත්වය හෙළි කරන්නාවූ දේශනාවන්ය. යාච්ඤා කරන්න - සූදානම් වන්න - දේශනා කරන්න පොත් පෙළ සම්පත් අඩු බොහෝ සභාපාලකවරුන්ට සහ එහි ගිහි දේශකයන්ට මහත් උපකාරයක් වන්නේය.

***ජොනතන් ලැම්බ්, අධ්‍යක්ෂක, ලන්ග්හැම් දේශනා සේවය, ලන්ග්හැම් ජාත්‍යන්තර හවුල්කාරීත්වය***

රු. 100/-

ISBN 978-955-3640-04-8

Langham PARTNERSHIP

CTS Publishing
Colombo Theological Seminary